# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 ජුනි 04 වන අඟහරුවාදා**
2013 ஜூன் 04 செவ்வாய்க்கிழமை ஜ
Tuesday 04th June 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පු.භා. 09.51 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.51 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.51 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள் ] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරයෙකු ලෙස, ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් සිටි, එක්සත් ජාතික පක්ෂයේ ගරු අ. අජිත් කුමාර මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා 2013.06.03 දිනැති අංක 1813/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්ව ඇති බව දැනුම් දෙනවා.*

*මෙම පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කරමින් ඉටු කළ සේවය අගය කරනවා. එතුමාට සුභාශිංසන පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා."*

# ලිපිලේඛනාදිය පිළිගැන්වීම
PAPERS PRESENTED

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

ගරු සභාපතිතුමනි, *"මෙම පළාත් සභාවේ කාර්ය පටිපාටි රීති අංක 96 (2) ප්‍රකාරව 2007 වර්ෂයේ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අදාළ විගණකාධිපති වාර්තාව"* මම මෙම සභාවට ඉදිරිපත් කරනවා.

***එකී විගණකාධිපති වාර්තාව - (2007) පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ලේකම්වරයාට නියෝග කරන ලදී.***
*The Secretary was ordered by the Hon. Chairman to refer the aforesaid Auditor General's Report (2007) to the Provincial Public Accounts Committee.*

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, දැන් තමුන්නාන්සේ සභාවට ඉදිරිපත් කළා, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 2007 වර්ෂයේ ගිණුම් වාර්තාව. මේ ගිණුම් වාර්තාව අද අපි සභාවට ආවට පස්සෙයි දැක්කේ. මුදල් අවභාවිතය සම්බන්ධව කාරණා රාශියක් සඳහන් වෙනවා. ඒ නිසා අපට මේ පිළිබඳව සාකච්ඡා කරන්න අවස්ථාව තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්. දෙන්න පුළුවන්. ගිණුම් කාරක සභාවේදී පුළුවන්.

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ඇමැතිතුමාත් එක්ක ගැටළුවක් නොවෙයි අපට තිබෙන්නේ. හිටපු නිලධාරීන් මේ ලොග් ෂීට්වලින් ලැබුණු මුදල්, ලැබිලා නැහැයි කියලා මේකේ සටහන් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා ගිණුම් කාරක සභාව අවස්ථාවේදී අපට අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඕවා මම නොවෙයි. මම එන්න ඉස්සෙල්ලා වුණු දේවල් තමයි මම හොයලා ගත්තේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කළ කාරණාව පිළිබඳව ගිණුම් කාරක සභාවේදී සාකච්ඡා කිරීමේදී අවශ්‍ය වෙනස්කම් කිරීමට අවස්ථාව ලබා දෙනවා. මේ විගණකාධිපති වාර්තාව ගිණුම් කාරක සභාවට යොමු කරනවා. එතැනදී අපට පුළුවන් සාකච්ඡා කරලා –

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, සභාවට ඉදිරිපත් වුණු ලියවිල්ලක් සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ට තමන්ගේ අදහස් ඉදිරිපත් කරන්න ඔබතුමාට අවස්ථාවක් ලබා දෙන්න පුළුවන්. ඒ නිසා ඔබතුමා මේ වාර්තාව සම්බන්ධව මන්ත්‍රීවරුන්ට ඔවුන්ගේ මතය ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දීමට මේ වෙලාව හෝ වෙනයම් වෙලාවක් ලබා දෙනවා නම් හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ඔබතුමා දිනයක් ඉල්ලන්න. සභා කටයුතු කාරක සභාවේදී මේ විවාදය සඳහා ඔබතුමා දිනයක් ඉල්ලන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, අපි ඒ වාර්තාව දැකලා නැහැ නේ? වර්තාව මොකක්ද කියලා දන්නේ නැහැ. ඉස්සෙල්ලාම මන්ත්‍රීවරුන්ට දෙන්න ඕනෑ. ඊට පස්සේ වෙලාවක් ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි පුළුවන්. ප්‍රශ්නයක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපට වාර්තාව දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් අද පැවැත්වෙන සභා කටයුතු කාරක සභාවේදී අපි දිනයක් වෙන් කර ගනිමු.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අපි ආවාට පස්සේ තමයි මේසය මත මේ වාර්තාව තිබුණේ. ඒ නිසා මේ පිළිබඳව තවදුරටත් කරුණු සොයා බලලා සාකච්ඡා කරන්න අපට අවස්ථාව ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු කාරක සභාවේදී මේ පිළිබඳ සාකච්ඡාවට අපි දිනයක් වෙන් කර ගනිමු.

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, මම අයවැය කථාවේදීත් පැහැදිලිව සඳහන් කළා පළාත් සභාවේ යම් යම් අධිකාරීවල මුදල් භාවිතා වීම සම්බන්ධව මේ සභාවේ මන්ත්‍රීවරු කවුරුත් සාකච්ඡා කරන්නේ නැහැයි කියලා. එදත් අපි සඳහන් කළේ අමාත්‍යවරුන් සම්බන්ධයෙන් නොවෙයි. වැරැදි විධියට විපක්ෂය විග්‍රහ කළාට අමාත්‍යවරු සම්බන්ධයෙන් නොවෙයි, මේ අපේ තිබෙන තර්කය. යම් යම් නිලධාරීන්, යම් යම් මුදල් කාරණා සම්බන්ධව විශේෂයෙන්ම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා සම්බන්ධ වන පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේදීත් අපි දැකලා තිබෙනවා මේවා එන්නේ පහු වෙලා. සභාවට එන්නේ ගොඩක් පහු වෙලා. එතකොට තමන්ගේ තනතුරුවලින් මේ නිලධාරීන් ගිහිල්ලා අවසානයි. නමුත් මුදල් අවභාවිතාවන් සම්බන්ධව සෘජු තීන්දුවක් ගන්න පුළුවන්කමක් සභාවට ලැබෙන්නේ නැහැ. මේ තත්ත්වය පාර්ලිමේන්තුවේත් තිබෙනවා. පාර්ලිමේන්තුවේත් සමහර මන්ත්‍රීවරු සඳහන් කරනවා සමහර අධිකාරීවල මුදල් අවභාවිතා වුණාම ඒ සම්බන්ධව සාකච්ඡා කරන්න අවස්ථාවක් නැහැයි කියලා. මම කියන්නේ, රේණුක පෙරේරා ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා වාගේ අපට අවස්ථාවක් ලබා දෙන්න විගණකාධිපති වාර්තාව සම්බන්ධව සාකච්ඡා කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අපේ සභානායකතුමා කිව්වා විපක්ෂයේ –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධව විවාදයකට යන්න ඉඩකඩ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

විවාදයකට නොවෙයි. යම් රාජ්‍ය නිලධාරියෙක් වැරැදි කරලා තිබෙනවා නම්, ඊට උඩ තිබෙන ආයතනත් ඒකේ වගකීමක් දරන්න වෙනවා. ඒ නිසා අපි කියන එක නොවෙයි. එහෙම නම් මේ රටේ පාලනයක් ඇත්තේ නැහැ නේ? නිලධාරීන්ට ඕනෑ ඕනෑ දේ කර කර ඉන්න පුළුවන්. ඒ නිසා මම කියන්නේ, එහෙම අපට චෝදනා කරන්න එපා. අපි දන්නවා. සමහර කරුණු සත්‍ය වශයෙන්ම ඇමැතිතුමාට පරිබාහිරව සිද්ධ වෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, අපි ගැටුමකට යන්න අවශ්‍ය නැහැ. අපි මේ සම්බන්ධව සභා කටයුතු කාරක සභාවේදී සාකච්ඡා කරලා විවාදයක් සඳහා දිනයක් වෙන් කර ගනිමු. එතකොට මේ ප්‍රශ්න කථා කරමු.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.05.21 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, වැල්ලම්පිටිය, කොටුවිල, අංක 14/2 හි පදිංචි වයි.ජී. කරුණාතිලක යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petition Presented, ordered to refer to the Petitions committee*

# නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, *"හෂාන් තිලකරත්න ගරු මන්ත්‍රීතුමාට මාස 03 කට නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලා සිටිනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*Question put and agreed to.*

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTER'S STATEMENTS

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව සතුටු වෙනවා. 6 වැනිදා බස්නාහිර පළාත් සභාවේ අපේ ප්‍රවාහන අධිකාරියට විශේෂ දවසක් හැටියට තමයි අපි සලකන්නේ. මොකද, මේ බස්නාහිර පළාත් සභාව පටන් ගත්තු දවසේ ඉඳලා පෞද්ගලික ප්‍රවාහන සේවා සම්බන්ධව ගත්තාම මේ තරම් පැමිණිලි ආපු අමාත්‍යාංශයක් මම හිතන හැටියට නැතුව ඇති. මේකේ අපට හැමදාම දුරකථන පණිවුඩ සියයක් දෙසීයක් තිබෙනවා. බස් එකට නැගපු අපේ මගීයාට කොන්දොස්තර මහතා විසින් ඉතුරු සල්ලි ලබා නොදීමේ ක්‍රමවේදයක් අපේ රටේ තිබුණා. බස් හිමි මහත්වරුන්ගෙන් පැමිණිල්ලක් හැමදාම අපට තිබුණා. කොන්දොස්තර මහත්වරු ටිකට් නොදීම නිසා එයාලට හිමි වෙන්න තිබෙන ආදායමෙන් දවසකට රුපියල් 1000 ක් 2000 ක් අහිමි වෙනවාය කියලා. ඒ මේ ටිකට් එක නිසියාකාරයෙන් නිකුත් නොකිරීම සම්බන්ධව. ඒ නිසා අපි අපේ උපදේශක කාරක සභාවත්, මීට පෙර අපේ පළාත් සභාවේ කැබිනට් මණ්ඩලයත් තීරණය කරලා අද අපි පෙර ගෙවුම් කාඩ් පත්‍රයක් 6 වැනිදා නිකුත් කරනවා. බස්නාහිර පළාතේ ඉන්න මගී ජනතාවට දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒකට අපි Dialog ආයතනයත්, ඒ වාගේම Access ආයතනයත් ඒකරාශී කරලා මේ පෙර ගෙවුම් කාඩ් පත්‍රය දුන්නාම මගියාට විශාල පහසුකමක් ලැබෙනවා. තමාගේ ඉතුරු සල්ලි දුන්නේ නැහැ කියලා එහෙම චෝදනා ඇති වෙන්නේ නැහැ. ඒ වාගේම බස් හිමි මහත්වරුන්ට දවසකට අහිමි වුණු රුපියල් 1000 ක 2000 ක මුදල බස් හිමි මහත්වරුන්ට අහිමි වෙන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලාව දැනුවත් කළේ, මේ පෙර ගෙවුම් කාඩ්පතට තමුන්නාන්සේලාගේ සහාය ලබා දීලා මේක සාර්ථක කර ගන්න අපට අවස්ථාව ලබා දෙන්න කියලා මම මතක් කරනවා.

ඒ වාගේම අපේ උපදේශක කාරක සභාවේ ගත්තු තීරණයක් අනුව අවුරුදු 05 ට වඩා එක ස්ථානයක වැඩ කරපු සේවකයන්ව අපි එන මාසේ ඉඳලා මාරු කරන්න කටයුතු කරනවා. අපේ මන්ත්‍රීවරු මේකට කථා කරන්න එන්න එපා. මොකද, මේ තිබෙන චෝදනා නිදහස් කර ගන්න, මට පාලනය කරන්න ශක්තියක් අපේ මන්ත්‍රීවරු දෙන්න ඕනෑ. එතකොට අපේ උපදේශක කාරක සභාව, අපි අනුමත කළා. අපේ අයවැය විවාදයේදී විශාල වශයෙන් විවේචනය කළා. ඒ අනුව මම දැන් ලැයිස්තු තෝරලා මේ අයව මාරු කරනවා. ඒ නිසා කිසි කෙනෙක් මේකට කථා කරන්න එන්න එපා. නමුත් අපි අසාධාරණ විධියට මාරු කරන්නේ නැහැ. ඒ අයට යන්න පුළුවන් පහසුකම් තිබෙන ක්‍රමයට අපි මාරු කරලා අපේ අධිකාරිය ශක්තිමත් කරන්න කටයුතු කරනවා කියලා මතක් කරමින්, ගරු සභාපතිතුමාට මම ස්තූතිය පුද කරනවා. සියලු දෙනාටම මම ආරාධනා කරනවා 6 වැනිදා පදනම් ආයතනයට - අපි 12.00 ට තමයි ඒක නිකුත් කරන්නේ. අපි ගිවිසුම අත්සන් කළා. බැසිල් රාජපක්‍ෂ ගරු ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබෙනවා. ඒ නිසා අපේ සියලුම මන්ත්‍රීවරුන්ට කියන්නේ ආරාධනා පත්‍රයක් දෙන්න වෙලාවක් නැහැ. හදිසියේ මේ නැකැත හම්බ වුණේ. ඒ නිසා ඔබතුමන්ලා සියලු දෙනාම පදනම් ආයතනයට උදේ 11.30 ට පැමිණෙන්න කියලා මම ආරාධනා කර සිටිමින් ගරු සභාපතිතුමාට ස්තූතිය පුද කරනවා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. ඒ වාගේම අපේ කැබිනට් මණ්ඩලයටත් මගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා මට සහාය ලබා දීම සම්බන්ධව.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල (**කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා**)**
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

ගරු සභාපතිතුමනි, මා නියෝජනය කරන ජාතික හෙළ උරුමය වෙනුවෙන් පක්‍ෂයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

ලෙස පළාත් සභා ක්‍රමය පිළිබඳව පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට භාර දී තිබෙනවා. මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන්, ඇමැතිවරයෙක් වශයෙන් ඒ පිළිබඳව

[ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා ]

මේ සභාව දැනුවත් කිරීම මගේ යුතුකමක් විදියට මම සලකනවා. ගරු සභාපතිතුමනි, ජාතික හෙළ උරුමයේ නිල ස්ථාවරය පළාත් සභා අහෝසි කිරීම නිසා ඒ පනත් කෙටුම්පත දක්වලා තිබෙන්නේ, පළාත් සභා ක්‍රමය අහෝසි කිරීමේ පනතක් ලෙස. නමුත් අපි මේ අවස්ථාවේ පළාත් සභා ක්‍රමය අහෝසි කිරීමට අවශ්‍ය ජාතික සහ ජාත්‍යන්තර වටපිටාවක් තිබෙනවා කියලා විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා අපි මේ පනත් කෙටුම්පතෙන් බලාපොරොත්තු වෙන්නේ උතුරු පළාත් සභාව පිහිටුවීමට පෙර පළාත් සභා ක්‍රමය තුළ සංශෝධන පහක් ගෙන ඒමට. මේ සංශෝධන පහ රටේ ස්ථිර පැවැත්මට, රට යළි ලේ විලක් වීම වැළැක්වීමට අත්‍යවශ්‍යයි කියලා අපි කල්පනා කරනවා. පළමුවැනි සංශෝධනය තමයි පළාත් සභා සතු පොලිස් බලතල ඉවත් කිරීම. දෙවැනි කාරණය (බාධා කිරීම්) - මට සීමිත කාලයක් තිබෙන්නේ. මම කාරණා ටික කියලා පොඩි පැහැදිලි කිරීමක් කරන්නම් ගරු සභාපතිතුමනි. දෙවැනි කාරණය පළාත් සභා සතු ඉඩම් බලතල ඉවත් කිරීම. තුන්වැනි කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ආ) වගන්තියේ විධිවිධාන අනුව යාබදව තිබෙන පළාත් දෙකක් හෝ තුනක් ඒකාබද්ධව තනි පළාත් සභාවක් පිහිටුවීමට ඇති විධිවිධාන ඉවත් කිරීම. හතරවැනි කාරණය ගරු සභාපතිතුමනි. දිවි නැඟුම පනතේ අපි අත්විඳපු විධියට නකුට විසින් බල්ලා නැටවීමක් මේ ව්‍යවස්ථාවේ විධිවිධානවල තිබෙනවා. පළාත් සභා ලැයිස්තුවේ විෂයයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පනතක් ගෙන ආවාම ඒ පනත සම්මත කර ගැනීම සඳහා පළාත් සභා සියල්ලේම එකඟතාව ලබා ගත යුතුයි. මේක ඉන්දියාවේත් නැති විධිවිධානයක්. ඉන්දියාවේ තිබෙන්නේ, ප්‍රාන්තවලින් බහුතරයක් එකඟ වුණොත් එය සම්මත කර ගත හැකියි කියලා. ඒ නිසා එක පළාත් සභාවකට හැකියාව තිබෙනවා, සමස්ත රටම අකර්මන්‍ය කරන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, පළාත් සභා සියල්ලේම එකඟතාවය කියන විධිවිධානය පළාත් සභා බහුතරයක එකඟතාවය යනුවෙන් සංශෝධනය විය යුතු යැයි අපි විශ්වාස කරනවා. පස්වැනි කාරණය ගරු සභාපතිතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ -

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා, අත්‍යවශ්‍ය සේවා - ගරු සභාපතිතුමනි, මේ කාරණය වැදගත්. මට නිශ්ශබ්දතාවයෙන් උදව් කරයි කියලා බලාපොරොත්තු වෙනවා. පස්වැනි කාරණය අතිශයින් වැදගත් කාරණයක්. මේ ගැන මෙතෙක් රටේ සංවාදයට යොමු නොවුණු කාරණයක්. ගරු සභාපතිතුමනි, අපේ ව්‍යවස්ථාවේ තිබෙන්නේ ගෙදරක පුංචි ආරවුලක් ඇති වුණත්, උත්තරය දික්කසාදය කියන එකයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා තිබෙන ආකාරයට හදිසි සේවා සැපයුම් බිඳ වැටීම, විදේශීය ආක්‍රමණයක් ඇති වීම, අභ්‍යන්තර කැරැල්ලක් ඇති වීම කියන කාරණා තුනේදී ජනාධිපතිවරයාට බලය තිබෙනවා පළාත් සභාව විසුරුවා හැරලා ඒ බලතල මධ්‍යම ආණ්ඩුවට ගන්න. ඉතින් පළාත් සභාවත්, ආණ්ඩුවත් අතර ගැටුමක් ඇති වුණාම එකම උත්තරය පළාත් සභාව විසුරුවා හැරීමද? අතරමැද මේ ප්‍රශ්න විසඳගන්න ක්‍රමවේදයක් නැද්ද? සැමියා මහන්සි වී ගෙදර එද්දී බිරිඳ රාත්‍රී කෑම උයලා නැත්නම් ඒකට උත්තරය පවුල් උපදේශනයද? එහෙම නැත්නම් දික්කසාදයද? මේකට උත්තරයක් ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 256 සහ 257 වගන්තිවල තිබෙනවා. මධ්‍යම ආණ්ඩුවත්, ප්‍රාන්තත් අතර ගැටුම් ඇති වුණාම එය සමනය කරන ආකාරය පිළිබඳ විධිවිධාන ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, දෙවැනි පරිච්ඡේදයේ අපූරුවට දක්වලා තිබෙනවා. ඒ විධිවිධාන අපේ ව්‍යවස්ථාවේ නොමැති වීම පළාත් සභාව සහ මධ්‍යම ආණ්ඩුව අතර අරගලයක් ඇති වෙන්න, සුමට ගමනට බාධා කරන්න හේතු පාදක වෙනවා. මේ නිසා ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 256 සහ 257 වගන්තිවලට සමානරූපී බලතල අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, මේ යෝජනා පළාත් සභා අහෝසි කිරීමට පක්ෂ වෙන අයටත්, විපක්ෂ වෙන අයටත්, පළාත් සභා ක්‍රමය පවත්වාගෙන යා යුතුයි කියලා විශ්වාස කරන අයටත්, පළාත් සභා ක්‍රමය සුමටව පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන දේවල් කියලා අපි විශ්වාස කරනවා.

ඒ නිසාම පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂ අපි ඉදිරි සතියේත්, ඊළඟ සතියේත් හමු වෙන්න බලාපොරොත්තු වෙනවා. ද්‍රවිඩ ජාතික සන්ධානය ඇතුළු පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවලට මේ පිළිබඳ, මේ කාරණා පහ පිළිබඳව සාකච්ඡා කරන්න අපට අවස්ථාවක් ලබා දෙන්නය කියලා අපි ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒ වාගේම ජනාධිපතිතුමාගෙනුත්, විපක්ෂ නායකතුමාගෙනුත් මේ කාරණය සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ට හෘද සාක්ෂියට එකඟව ඡන්දය දීමට අවස්ථාවක් ලබා දෙන්නය කියලා අපි ඉල්ලීමක් කරලා තිබෙනවා. මේ අත්‍යවශ්‍ය විධිවිධාන අපේ පළාත් සභා ක්‍රමයට ගෙන ආවේ නැත්නම් බොහෝ දෙනෙක් හිතාගෙන ඉන්නවා, බස්නාහිර පළාත් සභාව වාගේ එකක් උතුරේ හැදෙන්නේ කියලා. උතුර කියන්නේ, බෙදුම්වාදී ප්‍රවනතාවයක් තිබුණු පළාතක්. උතුර කියන්නේ, වසර 30 ක් පුරා තුවක්කුවට යට වෙලා ලේ වගුරන සංස්කෘතියක් තිබුණු පළාතක්. එවැනි පළාතකට පොලිස් බලතල ලබා දුන්නොත් - වර්ධරාජා පෙරුමාල් මහ ඇමැතිතුමා, 1988 දෙසැම්බර් මාසේ පත් වුණා. 89 ජුනි මාසේ ස්වේච්ඡා පුරවැසි බලකාය නමින් නිල නොවන පොලිස් බලකායක් සකස් කළා. එහි අවසාන ප්‍රතිඵලය තමයි 1990 මාර්තු මාසයේ ඒකපාර්ශිකව දෙමළ ඊළමේ ස්වාධීනත්වය ප්‍රකාශ කිරීම නිසා ජනාධිපතිවරයාට පළාත් සභාව විසුරුවා හරින්නට සිද්ධ වුණා. ඒ අඳුරු ගමන, ඒ ලේ වැකුණු ගමන, යළි මේ රටේ ගමන් නොකරන්න නම් මේ කාරණා පහ උතුරු පළාත් සභා මැතිවරණය පැවැත්වීමට ප්‍රථම අපේ ව්‍යවස්ථාවට එක්කර

ගත යුතු යැයි අපි විශ්වාස කරනවා. පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව. කාටද ලකුණු ලැබෙන්නේ? කාටද මේක හරි යන්නේ කියන කාරණය නොබලා රටට හරි යනවාද නැද්ද කියන කාරණය විතරක් බලලා මෙන්න මේ කාරණා පහ ගැන අවධානය යොමු කරලා, රට බේරා ගැනීමේ පිංකමක් ලෙස සලකලා මෙයට දායක වෙනු ඇතැයි කියලා අපි පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවලින් ගෞරවයෙන් බලාපොරොත්තු වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, අපේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගේ ප්‍රකාශය හා සම්බන්ධ වරප්‍රසාද ප්‍රශ්නයක් මට තිබෙන්නේ. එතුමා දිගින් දිගටම රූපවාහිනී නාලිකාවලත්, ඒ වාගේම මුද්‍රිත නාලිකාවලත් පළාත් සභාව ගැන කරන ප්‍රකාශ ගැන.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** – අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මුද්‍රිත මාධ්‍යය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මුද්‍රිත මාධ්‍යය හමුවේ කරන ප්‍රකාශ හා සම්බන්ධව. දිගින් දිගටම එතුමාගේ අදහස වූයේ, පළාත් සභා ක්‍රමය අහෝසි කිරීමයි. අද මම හිතන්නේ, ජාතික හෙළ උරුමයට තිබෙන ප්‍රශ්නය පළාත් සභා ක්‍රමය ගැන නොවෙයි, ගරු සභාපතිතුමනි –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. ඒ ප්‍රශ්න කථා කරන්න ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා ජාතික හෙළ උරුමය –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න. ඔබතුමාට පැහැදිලි කිරීම් කරන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කෙටියෙන් කියන්න. වරප්‍රසාද කඩවීම මට කියන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි පළාත් සභාව –

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

ඔබතුමා ජයලත් ජයවර්ධන මැතිතුමා ගැන ශෝකය ප්‍රකාශ කරන්න ඕනෑ. ඒක කරන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් පැහැදිලි කරන්න කෝ?

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා ජයලත් ජයවර්ධන මැතිතුමා ගැන ශෝකය ප්‍රකාශ කරන්නේ නැහැ. ගම්පහ දිස්ත්‍රික්කයේ නායකයා ජයලත් ජයවර්ධන මැතිතුමා ගැන ඉස්සෙල්ලා ශෝකය ප්‍රකාශ කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කරන ප්‍රකාශය තමයි පළාත් සභාව අහෝසි කිරීම. එතුමාට පළාත් සභාවේ බලතල –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට ඒ පිළිබඳව දිගින් දිගටම විවාදයකට යන්න අවස්ථාව දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පළමුවැනි වතාවට මම මේක ගන්නේ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් ඔබතුමාගේ ගැටළුව කියන්න. වරප්‍රසාද කඩවීම කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පළාත් සභා අහෝසි කිරීම සහ පළාත් සභාවේ බලතල -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

දවස් තුනම ජයලත් ජයවර්ධන මැතිතුමාගේ මළ ගෙදර හිටියේ. ඒකට ප්‍රකාශයක් කරන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ බලතල -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා තත්පරයක් දෙන්න. ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මෙතුමා යම්කිසි ප්‍රකාශයක් කරන්නේ. ඒ නිසා මම හිතනවා එතුමාට ප්‍රකාශයක් කිරීමේ අවස්ථාවක් ඉල්ලුම් කරලා ඒ සඳහා අවස්ථාව දුන්නාට කමක් නැහැ. වරප්‍රසාද සම්බන්ධයෙන් කථා කිරීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්, වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද අහිමිවීම කියන්න කෝ? දිගින් දිගටම ඔබතුමාට කථා කරන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පළාත් සභා අහෝසි කරන්න කියන්නේ මේ පළාත් සභාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා කෙටියෙන් කියන්න වරප්‍රසාද කඩවීම මොකක්ද කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා අහගන්න කෝ? මම කියන්නම්. ගරු සභාපතිතුමනි, පළාත් සභා අහෝසි කිරීම හා පළාත් සභාවේ තිබෙන බලතල අහිමි කිරීම පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට විශාල ගැටළුවක් වන ප්‍රශ්නයක්. ඒ සම්බන්ධවයි ප්‍රශ්නය තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, දැන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් තිබෙනවා නම් අපි ඒ සම්බන්ධව වරප්‍රසාද කමිටුවට යොමු කරනවා. කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මට අවස්ථාව දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාව දුන්නා. ගරු ඇමැතිතුමා පෞද්ගලික පැහැදිලි කිරීමක් කළේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට එහෙම අවස්ථාව දෙන්න බැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ. මේ වෙලාවේ පෞද්ගලික පැහැදිලි කිරීම් කරන්න දෙන්න බැහැ. ඒ සඳහා විපක්ෂයෙන් අවස්ථාව ඉල්ලා ගන්න. විපක්ෂයට කාලය වෙන් කරලා තිබෙන්නේ. ඒ කාලය ඔබතුමා ගන්න. වරප්‍රසාද ප්‍රශ්න කියලා ඔබතුමා කාලය ගන්න එපා. ඔබතුමාට විනාඩි 02 ක් දෙන්න පුළුවන්. ඒ කාලය විපක්ෂයේ සංවිධායකතුමාගෙන් ඉල්ලා ගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දෙකම එකයි ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න. මීළඟට සුගත් මතුගමගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු සුගත් මතුගමගේ**
Hon. Sugath Mathugamage

ගරු සභාපතිතුමනි, විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය මගින් අපි පසුගිය දවස්වල දැක්කා සැප්තැම්බර් මාසේ උතුරේ පළාත් සභා මැතිවරණය පැවැත්වීම සඳහා සූදානමක් පවතිනවා කියන කාරණය. ගරු සභාපතිතුමනි, උතුරේ පළාත් සභා මැතිවරණය පවත්වන්නේ, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව ඉඩම් බලතල සහිතවද, පොලිස් බලතල සහිතවද, එසේ නොමැතිවද කියන එක තවමත් නිශ්චිත නැහැ. මේ සම්බන්ධයෙන් සමාජය තුළ ප්‍රධාන වශයෙන් මත දෙකක් තිබෙනවා. ඇතැමෙක් ඉඩම් බලතල, පොලිස් බලතල සහිතව පළාත් සභා පැවැත්විය යුතු නැතැයි ප්‍රකාශ කරද්දී, ඇතැමෙක් ප්‍රකාශ කරන්නේ ඉඩම් බලතල සහ පොලිස් බලතල සහිතව මේ උතුරේ පළාත් සභා මැතිවරණය පැවැත්විය යුතුයි කියන කාරණාවයි. ගරු සභාපතිතුමනි, අපි දන්නවා බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජයට පත් කරලා ගත වුණේ අවුරුදු 04 ක් වැනි කෙටි කාලයක්. බෙදුම්වාදී ත්‍රස්තවාදය සපුරා පරාජයට පත් කරන්න පුළුවන් වුණත්, බෙදුම්වාදය සපුරා පරාජයට පත් කරන්න ජාතියක් හැටියට අපි සමත් වුණේ නැහැ. මේ වනකොට නැවතත් විවිධ බලමුළු විසින් බෙදුම්වාදය අපේ මව්බිමට එරෙහිව ක්‍රියාත්මක කරමින් පවතිනවා.

විශේෂයෙන් බෙදුම්වාදී යුධ පෙරමුණ පරාජයට පත් කරනු ලැබුවත්, බෙදුම්වාදී දේශපාලන පෙරමුණු නැවත අපේ මව්බිමට එරෙහිව පෙළ ගැසෙමින් යුද්ධය මගින් ලබා ගැනීමට නොහැකි වුණු දෑ ව්‍යවස්ථාපිත බලය ඔස්සේ ලබා ගැනීමට වෙර දරමින් ඉන්නවා. විශේෂයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී රටවල්, ඒ වාගේම උතුරේ ජාතිවාදී, බෙදුම්වාදී සංවිධාන රජයට බල කරමින් සිටිනවා උතුරේ පළාත් සභා මැතිවරණය වහා පවත්වන්නය කියලා. ඔවුන් රජයට බල කර සිටින්නේ ඉඩම් බලතල සහ පොලිස් බලතල සහිත පළාත් සභාවක් උතුරේ පිහිටුවිය යුතුයි කියලයි. අපි විශ්වාස කරනවා මේ බෙදුම්වාදී බලතල සහිතව, පොලිස් බලතල, ඉඩම් බලතල සහිතව උතුරේ පළාත් සභාවක් පිහිටුවනු ලැබුවොතින් තිස් වසරක් තිස්සේ බෙදුම්වාදී අන්තවාදීන්ට ලබා ගැනීමට නොහැකි වූ ජයග්‍රහණ ව්‍යවස්ථාපිත බලය ඔස්සේ ලබා ගන්නවාය කියලා. මෙන්න මේ නිසා වීරෝධාර රණවිරුවන් අවුරුදු 30 ක් තිස්සේ තමන්ගේ ජීවිත පූජා මතින් ලබා ගත්තු ජයග්‍රහණ ආපස්සට හරවන්න දෙන්න බැහැ. මේ නිසා උතුරේ පළාත් සභා මැතිවරණය පවත්වනවා නම් බෙදුම්වාදී බලතල, පොලිස් බලය, ඉඩම් බලය අහෝසි කරලා පළාත් සභා මැතිවරණයට යා යුතුයි කියලා අපි රජයට යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම ගැන. උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා කිව්වා පළාත් සභා බලය අහෝසි කිරීම පිළිබඳව 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගරු අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ භාර දීලා තිබෙනවා කියලා. අපි ඒ ගැන මේ වෙලාවේ කථා කරන්න යන්නේ නැහැ. මම හිතන්නේ ඒක පළාත් සභාවට එනවා. ආවට පස්සේ ඒ ගැන කථා කරනවා. රතන හාමුදුරුවෝ පළාත් සභා බලය අඩු කරන්න පනත ඉදිරිපත් කරන්න කලින් පළාත් සභාවේ බලය උදුරා ගන්න ඉතාම කුමන්ත්‍රණකාරීව ක්‍රියාත්මක වන ආකාරයක් පිළිබඳව සභාවේ අවධානය යොමු කරලා ඔබතුමාගේ අවධානය යොමු කරන්න තමයි මම මේ ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ. ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා බස්නාහිර පළාත් සභාව කියන්නේ, ලංකාවේ දෙවැනි විශාලතම මහජන ප්‍රජාතන්ත්‍රවාදී බලායතනය. මේක පිහිටෙව්වේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කරපු 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්. ඒ නිසා අද මේක නීතියක්. පළාත් සභාව ලංකාවේ ව්‍යවස්ථාවට එකතු වුණු නීතියක් අනුව ක්‍රියාත්මක වන බලායතනයක්. ඒ වාගේම මේ ආයතනය ක්‍රියාත්මක කරන්න සභාවේ ලේකම් කාර්යාලයක් පිහිටෙව්වා. ඒ සභා ලේකම් කාර්යාලය පිහිට වූයේ ගරු සභාපතිතුමනි, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව, පළාත් සභා පනතට අනුව ප්‍රඥප්තියක් ඉදිරිපත් කරලයි. ඒ අනුව සභාවේ සම්මත වුණු, ආණ්ඩුකාරවරයාගේ අනුඥාව ලැබුණු පනතක්, ප්‍රඥප්තියක් මගින් ක්‍රියාත්මක වන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා, අපේ සභා ලේකම් කාර්යාලය. 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 17 (1) වගන්තියේ කියනවා *පළාත් සභාවකට ඊටම අයත් ලේකම් කාර්යාලයක් විය යුතුය* කියලා. ඒ වාගේම 17 (2) කියනවා, *පළාත් සභාවක ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය පත් කරනු ලබන තැනැත්තන් බඳවා ගැනීම් සහ ඔවුන්ගේ සේවා කොන්දේසි පළාත් සභා විසින් ප්‍රඥප්ති මගින් සම්මත කළ යුතුය* කියලා.

ගරු සභාපතිතුමනි, ඒ අනුව 2000 අංක 7 දරන සභා ලේකම් කාර්යාල මණ්ඩල ප්‍රඥප්තිය පත් කරලා තමයි පළාත් සභාවේ තනතුරු නිර්මාණය කරලා ආයතනය පවත්වාගෙන යන්නේ. මේ පළාත් සභාවේ ලේකම් කාර්යාලය පවත්වාගෙන යාමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීතියට අනුව සම්මත කරපු ප්‍රඥප්තියෙන් සම්මත කරපු තනතුරු අහෝසි කිරීමේ ක්‍රියා මාර්ගයක් පසුගිය දවස්වල ක්‍රියාත්මක වෙලා තිබෙනවා. 2013.05.09 වැනිදා ඉදිරිපත් කරපු ලිපියක් මගින් පළාත් සභාවේ මේ ප්‍රඥප්තිය මගින්

සම්මත කරලා තීරණය කරපු තනතුරු අහෝසි කරන්න නියෝගයක් පනවලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නියෝගයේ කියනවා පළාත් සභාවේ සමහර තනතුරු අහෝසි කරනවා කියලා. පළාත් සභාවේ හැන්සාඩ් සංස්කාරක තනතුර මේ නියෝගයෙන් පස්සේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක සංවර්ධන නිලධාරී තනතුරක් බවට පත් කරලා තිබෙනවා. [ ගරු මහේෂ් අල්මේදා ]

පළාත් සභාවේ ප්‍රවෘත්ති නිලධාරී තනතුර මේ නියෝගයට පස්සේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒක සංවර්ධන නිලධාරී තනතුරක් බවට පත් වෙනවා. ඒ වාගේම පළාත් සභාවේ සම්බන්ධීකරණ නිලධාරී තනතුරත් මේ නියෝගය අනුව අහෝසි වෙන්න ඉඩ තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, 2000 අංක 7 දරන පළාත් සභා කාර්ය මණ්ඩල ප්‍රඥප්තියේ 8 වැනි වගන්තියේ ඉතා පැහැදිලිව කියනවා ලේකම් කාර්යාලයේ කාර්යයන් කාර්යක්ෂමව හා අප්‍රමාදව පවත්වාගෙන යාමට අවශ්‍ය නිලධාරීන් පත් කිරීමට හැකි වන පරිදි නව තනතුරු හඳුනා ගැනීම සහ මෙහි 9 වැනි ඡේදයේ සඳහන් කාර්ය මණ්ඩල උපදේශක කමිටුවේ තීරණය අනුව තමයි සිද්ධ කරන්න ඕනැ කියලා. ඒ කමිටුවේ සාමාජිකයෝ මෙන්න මේ අය ගරු සභාපතිතුමනි. කාර්ය මණ්ඩල උපදේශක කමිටුව වෙන්නේ පළාත් සභාවේ සභාපතිවරයා. ඔබතුමා. මම අහනවා ඔබතුමාගෙන්. ඔබතුමා දන්නවාද කියලා මේ තනතුරු අහෝසි කෙරුවා කියලා. ඒ වාගේම ප්‍රධාන අමාත්‍යවරයා මේ කමිටුවේ සාමාජිකයෙක්. සභා කටයුතු විෂයය භාර අමාත්‍යවරයා මේ කමිටුවේ සාමාජිකයෙක්. විපක්ෂ නායකවරයා හා ඔහු විසින් නම් කරනු ලබන විපක්ෂයේ නියෝජිතයෙක්, මන්ත්‍රීවරු දෙදෙනෙක් මේ කමිටුවේ සාමාජිකයෝ. සභානායකවරයා හා ඔහු විසින් නම් කරනු ලබන පාලක පක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙක් මේ කමිටුවේ සාමාජිකයෝ. මේ කමිටුව රැස් කරලා තමයි පළාත් සභා ප්‍රඥප්තියට අනුව පළාත් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය නිර්මාණය කරන්නේ. ඒ තනතුරු අහෝසි කරන්න තීන්දු ගන්නවා නම් තීන්දු ගත යුතු වෙන්නේ මේ කමිටුව නැවත රැස් වෙලා. හැබැයි, ඔබතුමා දන්නෙත් නැහැ. විපක්ෂ නායකතුමා දන්නෙත් නැහැ. ප්‍රධාන ඇමැතිතුමා දන්නෙත් නැහැ. කඩදාසියක් යනවා මේ තනතුරු අහෝසි කරලා. පළාත් සභාව අහෝසි කිරීමේ කුමන්ත්‍රණය මේ පළාත් සභාව තුළ තිබෙනවා. මේ පළාත් සභාව ඇතුළේ ඒ කුමන්ත්‍රණය තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කවුද අත්සන් කළේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපේ ලේකම්තුමා මේ නියෝගය එවලා තිබෙන්නේ. ඒ අනුව මේ තනතුරු අහෝසි වෙනවා. දැන් හෙට අනිද්දා වෙනකොට ඔබතුමාගේ අනෙක් පැත්තේ හැන්සාඩ් සංස්කාරකවරයෙක් නැහැ. ලඝු ලේඛිකාවක් තමයි සමහර විට මේ සභාවේ වාර්තා කරන්නේ. ඊට පස්සේ ප්‍රවෘත්ති නිලධාරියෙක් මේ සභාවේ නැහැ. කවුරු හරි ලිපිකරුවෙක් තමයි ප්‍රවෘත්ති වාර්තාකරණය කරන්නේ. අවුරුදු 20 ක් තිස්සේ මේ සභාව පිහිටවපු දවසේ ඉඳලා ඉතාම නිවැරැදිව පිහිටුවලා තිබෙන තනතුරු අහෝසි වෙලා ඒ වෙනුවට වෙන අය පත් වෙන්න ඉඩ තිබෙනවා, ලිපිකරුවෝ විදියට. ඒ නිසා මේ සභාව අකර්මණ්‍ය කිරීමේ කුමන්ත්‍රණය අභ්‍යන්තරයේත් තිබෙනවා කියන එකයි අපට පැහැදිලි වෙන්නේ. ගරු සභාපතිතුමනි, කවුරු හරි උත්සාහ කරනවා නම් මේ සභාව සම්මත කරපු ප්‍රඥප්තියක් ගරු ආණ්ඩුකාරතුමා දීපු අනුඥාවක් අනුව නීතියක් බවට පත් වුණු දේ අහෝසි කරන්න කටයුතු කරනවා නම් ඒ අය කරන්නේ දඬුවම් ලැබිය හැකි වරදක්. මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමක්. පළාත් සභාව සම්මත කරපු ප්‍රඥප්ති උල්ලංඝණය කිරීමක් තමයි සිද්ධ වෙන්නේ. ඒ නිසා මම මේ වෙලාවේ ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා කරුණාකරලා සභා කටයුතු කාරක සභාවේ අවධානයට මේක වහාම ගන්න කියලා.

ඒ වාගේම මේ ප්‍රඥප්තියේ කියලා තිබෙන කමිටුව රැස් කරලා ඒ කමිටුව හරහා තීන්දු තීරණ ගන්න කියලා. එහෙම නැතුව තනිවම තීන්දු ගන්නවා නම් මේ සභාවේ ස්ථාපිත වුණු තනතුරු අහෝසි කරන්න දෙන්න පුළුවන්කමක් නැහැ. එහෙම වුණොත් පළාත් සභාවේ බලතල රතන හාමුදුරුවන්ගේ පනතට කලින් අහෝසි වන තත්ත්වයක් නිර්මාණය වෙනවා. ඒ නිසා පළාත් සභාව බිහි කරන්න ජීවිත පූජා කරපු පක්ෂය විදියට අපට ඒකට ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා කරුණාකරලා මේ කමිටුව පත් කරලා, කමිටුව ක්‍රියාත්මක කරලා, සභා කටයුතු කාරක සභාවේ අවධානය යොමු කරලා මේ තනතුරු අහෝසි කිරීම වහාම අකුලා දමන්න කියලා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණාව පිළිබඳව ඇත්ත වශයෙන්ම මම දන්නෙත් නැහැ. ඒ නිසා මම ලේකම්තුමාට උපදෙස් දෙනවා ඒ සම්බන්ධව වහාම මට වාර්තාවක් සපයන්නය කියලා. ඒත් එක්කම අද දින පැවැත්වෙන සභා කටයුතු කාරක සභාවේදී මේ පිළිබඳව සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණයේදී ඒ කමිටුවේ සාමාජිකයෙක් විදියට මම ඉන්න නිසාම මේ ඇති වූ අසාධාරණය සම්බන්ධයෙන් මා බස්නාහිර පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමාත්, ලේකම්තුමියත් ආමන්ත්‍රණය කළා. මම කිව්වා, ඔබතුමියලා කොහොමද මෙහෙම තීන්දුවක් ගන්නේ මේ තනතුරු නාම අහෝසි

කිරීම පිළිබඳව කියලා. එවිට මට කොමිෂන් සභාවේ ලේකම්තුමිය කිව්වේ අපත් මේ තත්ත්වය පිළිබඳව දිගින් දිගට මධ්‍යම ආණ්ඩුවේ භාණ්ඩාගාරයේ කළමනාකරණ දෙපාර්තමේන්තුව එක්ක පැවති සාකච්ඡාවේදී අපි කිව්වා, මේ තනතුරු අහෝසි කරන්න එපා. මේ කාර්ය සම්පූර්ණයෙන්ම වැරැදියි. ඒ නිසා මගේ මට්ටමින් මට මේක කරන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. විපක්ෂ නායකතුමා ඔබතුමා පුළුවන් නම් මේ කළමනාකරණ දෙපාර්තමේන්තුවට කථා කරලා මේ කටයුත්ත කරන්න කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම මේ යෝජනාව සම්බන්ධයෙන් සම්පූර්ණ අවධානය යොමු කරලා - ඒකෙන් පැහැදිලි වෙන්නේ මේ ප්‍රතික්ෂේප කළ යුතු, එහෙම නැත්නම් අහෝසි කළ යුතු ක්‍රියා මාර්ග එක පැත්තක තියෙද්දී, මධ්‍යම ආණ්ඩුවට ඕනෑ විධියට මේ අහෝසි කිරීම කරලා මේක තුළම මේ පළාත් සභා අහෝසි කිරීමේ ප්‍රයත්නය එතුමා කියපු විධියටම පැහැදිලි වෙනවයි කියන එක මම මතක් කරන්න කැමැතියි. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීවරුන් දෙපළම ඉදිරිපත් කළ කාරණා සම්බන්ධයෙන් මම හිතන්නේ ඔබතුමාත් කමිටුවේ සාමාජිකයෙක්. මමත් සාමාජිකයෙක්. ගරු ප්‍රධාන ඇමැතිතුමාත් ඉන්නවා. මම ලේකම්තුමාට උපදෙස් ලබා දෙනවා ඉක්මණින්ම මේ කමිටුව රැස් කරලා ඒ සම්බන්ධව සාකච්ඡා කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා. එසේම ඔබතුමා මතු කරපු කාරණය සම්බන්ධයෙන් අද දින පැවැත්වෙන සභා කටයුතු කාරක සභාවේදීත් කථා කරන්න අවස්ථාව ලබා දෙනවා.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

ස්තුතියි ගරු සභාපතිතුමනි. 1988 ජුනි 02 වැනිදා මේ රටේ පළාත් සභා ක්‍රමය ස්ථාපනය කරන්න ඡන්දය පැවැත් වූ දිනය. 2013 ජුනි 02 වැනිදා වන විට අවුරුදු 25 ක් වෙනවා. මේ අවුරුදු 25 ක් තිස්සේ මේ පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක වෙමින් පවතින කාලය තුළදී විවිධ අදහස්, විවිධ මත දැරුවා. මේ සභාව ආරම්භ වුණු දවසේ ඉඳලා අද වනකල් ඉන්න මන්ත්‍රීවරයෙක් හැටියට මම මතක් කරන්න ඕනෑ, පළාත් සභා බලතල පිළිබඳව එදාට වඩා අද මේ සභාවේදී - අපේ ගරු අමාත්‍යතුමාගේ හඬේත් පොඩි වෙනස් වීමක් දැක්කා. විශේෂයෙන්ම පළාත් සභා අහෝසි කරන්න ඕනෑ කියලා පාර්ලිමේන්තුවට පනතක් ඉදිරිපත් කරන ගමන් අවසාන ඡේදයේ කියනවා, අපි ඉන්දියානු ක්‍රමයට මේ පළාත් සභාවත් සංශෝධනය කරන්න ඕනෑය කියලා. මේ පළාත් සභා සම්පූර්ණයෙන්ම අහෝසි කරනවාද? සංශෝධන සහිතව පළාත් සභාව පත්වාගෙන යනවාද කියන එක එතුමාගේ ප්‍රකාශය තුළින් හෙළි වුණු එකක්.

දෙවැනි කාරණාව ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරපු අපේ හිතමිත්‍ර කළුතර දිස්ත්‍රික්කයේ සුගත් මතුගමගේ ගරු මන්ත්‍රීතුමා, දැන් ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් වුණත් ඒ මතය තුළ රැඳී සිටගෙන එතුමාත් අද සංශෝධනය ගැන කථා කරනවා. එදා පළාත් සභා අහෝසි කරන්න ඕනෑය කියලා ඡන්දය වර්ජනය කරපු ජනතා විමුක්ති පෙරමුණ අද පළාත් සභාව සංශෝධන සහිතව පත්වාගෙන යන්න ඕනෑ කියන එක පිළිබඳව කථා කරනවා. ගරු සභාපතිතුමා, මේ සභාවේ පාලක පක්ෂය හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු සංඛ්‍යාවක් නියෝජනය වෙමින්, ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය අද නියෝජනය වෙනවා. ඔබතුමා මාර්ගයෙන් මතක් කරන්න ඕනෑ. ඒ අයගෙන් බලාපොරොත්තු වෙනවා, මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව ආණ්ඩුවේ ස්ථාවරය සහ පාලක පක්ෂයේ ස්ථාවරය පිළිබඳව මේ සභාව තුළ පැහැදිලි ප්‍රකාශයක් කරන්න කියලා. මේ පළාත් සභා ක්‍රමය එදත් අදත් ක්‍රියාත්මක වීමේදී මම මතක් කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි. එදා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මේ සභාවේ ඉන්න අවස්ථාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ JVP එක සහයෝගයෙන් පාලනය කරපු යුගයේදී එතුමිය මාස ගණනක් මේ සභාවේ ඉන්න අවස්ථාවේ පොලිස් බලතල පළාත් සභාවට ලබා ගත යුතුයි කියන යෝජනාව ගෙන ආවා. ඒ යෝජනාව මේ පළාත් සභාවේ සම්මත වෙලා තිබෙනවා. එදා ජනතා විමුක්ති පෙරමුණ ඊට සහයෝගය දුන්නා. විමල් වීරවංශ මන්ත්‍රීතුමන්ලා වාගේ අද පාර්ලිමේන්තුව නියෝජනය කරන ඇමැතිවරු මේ පළාත් සභාව නිසා තමයි ඒ උත්තරීතර සභාවට ගිහිල්ලා ඇමැතිකම් තියාගෙන කථා කරන්නේ. සිද්ධිය ඕකයි. අද ජනතා විමුක්ති පෙරමුණේ මගේ අල්ලපු ආසනයේ සිටින විපක්ෂයේ ඉඳගෙන ආණ්ඩුවට සහයෝගය දීලා පොලිස් බලතල ලබා ගන්න ඕනෑ කියා ගෙන ආවා. ඒ වාගේම වර්තමාන පාලක පක්ෂය තමයි ඉඩම් බලතල ලබා ගන්න ඕනෑ කියලා මේ සභාවට යෝජනා ගෙනැල්ලා සම්මත කර ගත්තේ. එහෙම නම් මේ සියලු දේම කරලා ඉවර වෙලා මම හිතන්නේ දේශපාලන බංකොලොත් භාවය වහ ගන්නද, එහෙම නැත්නම් තමන්ගේ පක්ෂය තුළ තිබුණු ජනප්‍රියතාවය අහෝසි වෙමින් යන නිසා මේවා මිනිසුන් අතරට යන්න අදහස් කරගෙන අද අලුත් මතයක් දරනවා කියන ප්‍රශ්නය තිබෙනවා. උතුරු - නැගෙනහිර විතරක් නොවෙයි. අද දකුණේත් යම් යම් කල්ලි ක්‍රියාත්මක වෙනවා. ඔවුන් බලය තියාගෙන කල්ලි බිහි කළා වාගේම, ඒ කල්ලි බිහි කරගෙන මේ රට විනාශ වුණු අවස්ථාවල් තිබෙනවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි අද හැරිලා බලන්න ඕනෑ. අවුරුදු 25 ක් තිස්සේ මේ බස්නාහිර පළාත් සභාව තුළ අපි ලබා ගත්තු ප්‍රගතිය මොකක්ද? අපි ලබා ගත්තු ජයග්‍රහණ මොනවාද කියලා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා දැන් මොහොතකට කලින් ප්‍රකාශ කළා මේ සභාවේ සම්මත කරපු යෝජනාවල්, මේ සභාවේ අනුමත කරපු තනතුරු අහෝසි කරන්න කොහෙන්දෝ ඉහළින් නියෝග ඇවිල්ලා දැන් අහෝසි කරන්න යනවා කියලා. එහෙම නම් මේ සභාවේ සම්මත කළා නම් මේ සභාව දැනුවත්

කරන්න ඕනෑ. ඔබතුමා මූලාසනයෙන් නිවේදනය කරන්න ඕනෑ මෙන්න මෙවැනි යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා. මේකට සභාවේ අදහස මොකක්ද කියලා. එහෙම නැතුව, වක්‍රව මේ සභාව සම්මත කරපු තනතුරු අහෝසි කිරීමට කටයුතු කිරීම එක පැත්තකින් කනගාටුදායකයි. අපේ මුදල් පනත තිබුණා. BTT ක්‍රියාත්මක කිරීම. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පැහැදිලි ලෙසම ඒක අහෝසි කළා. ගොවිජන

[ ගරු ඒ.එම්. යූසුෆ් ]

සේවා පනතේ අදත් අපට බලතල තිබෙනවා. ඒක අත්හිටුවලා තිබෙන්නේ. එහෙම නම් මේ පළාත් සභාව සුදු අලියෙක් කරන්න අද කථා කර කර විවේචනය කරන්නේ - විශේෂයෙන්ම මම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයින්ගෙන් අහනවා. ඔබතුමන්ලා එදා විරුද්ධ වුණත් දෙවැනි වතාවේදී මේ රටේ අවුරුදු 17 කට පස්සේ බලය දෙන්න පුළුවන් වුණේ මේ පළාත් සභා ක්‍රමය තුළ එදා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය මේ පළාතේ මහ ඇමැති වුණු නිසා තමයි. ඒ නිසා මේක දිගටම පත්වාගෙන යන්න - ඒක හිතන්න ඕනෑ. බලන්න ඕනෑ. එහෙම නම් ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාව අවුරුදු 25 ක් තිස්සේ - මම විශේෂයෙන් මතක් කරනවා. මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමේ වගකීම තිබෙන්නේ ඔබතුමාට. සමස්ත ලංකාවේම පළාත් සභා ක්‍රමය තුළ අද උතුරේ සංවාදය තියාගෙන පොලිස් බලතල අහෝසි කරන්නම් කියලා රූපවාහිනියේ වේදිකාවල කථා කරන උදවිය අපි දකිනවා. උගුරු දණ්ඩ කඩාගෙන ඒ ඇමැතිතුමා කථා කරනවා. එදා සන්නද්ධ කල්ලියේ නායකයා. පළාත් සභා ක්‍රමය බිහි වනකොට මගේ බේරුවල ආසනයේ 22 දෙනෙක් මැරිලා තිබෙනවා. ඡන්දය දුන්නොත් උණ්ඩය. එදා 88 අපි මේ පළාත් සභාවට එනකොට මේ ඉන්න මන්ත්‍රීවරු. නියෝජනය වුණු උදවිය. හැමදාම මෙහේ ඉඳලා යන මන්ත්‍රීතුමා ඊළඟ දවසේ හිටියේ නැහැ. මෙවැනි තත්ත්වයක් ඇති කළ උදවිය අද රජ වංශෙන් කථා කරනවා. සන්නද්ධ කල්ලියේ නායකයා අද කථා කරනවා. මහ ලොකුවට ප්‍රජාතන්ත්‍රවාදීව. අමු අමුවේ මිනී මරලා ඉවර වෙලා අද මිනීමරු කල්ලියේ නායකයාට දොර විවෘත වෙලා තිබෙනවා. එහෙම නම් ගරු සභාපතිතුමනි, මේ විසිපස් අවුරුද්ද ඇතුළත බස්නාහිර පළාතෙන් ලබා ගත්තු ජයග්‍රහණය පිළිබඳව කථා කරන්න ඕනෑ. ජනතාවට ඉටු වුණු සේවාව පිළිබඳව. අපි විසි වසර සමරන්නය කියලා මේ සභාවට එදා පොත් පත් හදාගෙන විසිවන සැමරුම කියලා ලිපි ශීර්ෂයන් හදාගෙන ඉන්දියාවට ගිහිල්ලා ඉන්දියාවේ උත්තර ප්‍රදේශයේ ආණ්ඩුකාරතුමාට ආරාධනා කළ බව ඔබතුමා දන්නවා. සූදානම් කරලා තිබිලා - නමුත් විසි පස් වන අවුරුද්ද වනකොට අපි කනගාටු වෙනවා. අවුරුදු 25 ක් තිස්සේ හිටපු එකම මන්ත්‍රීවරයා හැටියට මම කනගාටු වෙනවා. මේ පළාත් සභා ක්‍රමය පසුගිය අර්බුධ නිර්මාණය කරගෙන මේ ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු හැමෝටම පාර්ලිමේන්තු යන්න බැහැ. ඔවුන් විශ්වාසයක් ඇතුව අද වාඩි වෙලා ඉන්නේ. ඔවුන් සේවාවක් කරනවා. ඔවුන් ජනතාවට සමීප වෙලා ඉන්නවා. එහෙම නම් මේ පළාත් සභා ක්‍රමය ස්ථාපනය කරන්න මීට වඩා බලතල ලබා දීලා අඩු තරමින් තිබෙන බලතල ටික හරි ක්‍රියාත්මක කරන්නය කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතිය.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, ස්තුතියි. විශේෂයෙන්ම අපේ පළාත් සභාවේ සමගාමී විෂයයක් අනුව පළාත් පාලන ආයතන ගැන - අපි දන්නවා ආණ්ඩුව පසුගිය අවුරුද්දේ පළාත් පාලන ඡන්ද ක්‍රමය ගැන අලුත් පනතක් අපට හඳුන්වලා දුන්නා. විශේෂයෙන්ම ඒ පනත සංශෝධනය කළේ මේ තිබෙන ඡන්ද ක්‍රමය අහෝසි කරලා නැවත වතාවක් කොට්ඨාශ ක්‍රමයට ඡන්දය පවත්වන්න තමයි ආණ්ඩුව ඒ ක්‍රමය පසුගිය අවුරුද්දේ අපට හඳුන්වලා දුන්නේ.

ගරු සභාපතිතුමනි, මේ ක්‍රමය යටතේ විශේෂයෙන්ම කොට්ඨාශ නිර්ණය කරන්න අවශ්‍ය වී තිබෙනවා. ඒ අනුව ආණ්ඩුව ප්‍රකාශ කළා, අදියර තුනකින් මේ කොට්ඨාශ නිර්ණය කිරීමට කටයුතු කරන බවට. මේකේ පළමුවැනි අදියර හැටියට ජාතික මට්ටමේ නිර්ණායක කමිටුවක්ද, දෙවන අදියර හැටියට දිස්ත්‍රික් මට්ටමේ නිර්ණායක කමිටුවක්ද, තුන්වන අදියර හැටියට කොට්ඨාශ මට්ටමේ නිර්ණායක කමිටුවක්ද පත් කරනවා කියලා ආණ්ඩුව පසුගිය කාලයේ ප්‍රකාශ කළා. අද වනවිට ගරු සභාපතිතුමනි, මෙම ක්‍රමය තුළ විශාල අර්බුද රාශියක් පැන නැගිලා තිබෙනවා. විශේෂයෙන්ම මේ වසරේ ජනවාරි සිට අලුත් සංශෝධිත පනත ක්‍රියාත්මක වෙනවා. මේ පනත ක්‍රියාත්මක වීම නිසාම පරණ පනත අද වනකොට අකර්මන්‍ය වෙලා තිබෙනවා. ඒ පනත ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේ නිසාම අද සමහර පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ගේ පුරප්පාඩු පත් කරන්න බැරි වෙලා තිබෙනවා. මන්ත්‍රීවරුන්ගේ පුරුප්පාඩු පත් කිරීම අලුත් පනත නිසා ඇණ හිටලා තිබෙනවා. මේ පිළිබඳව පළාත් පාලන අමාත්‍යවරයා හරි එහෙම නැත්නම් මැතිවරණ කොමසාරිස්වරයා හරි අද වනකල් කිසිදු ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. ඒ වාගේම මේ නව පළාත් පාලන ක්‍රමය ක්‍රියාත්මක කරන්න තිබුණේ ගරු සභාපතිතුමනි, අලුත් ඡන්ද ක්‍රමය තිබුණාට පස්සේ තමයි. නමුත් ඒක කළේ නැහැ. ඒක කරන්නේ නැතුව පරණ තිබෙන පාලන ක්‍රමයට නව පනත ආදේශ කිරීම නිසා මේ පුරප්පාඩු පිරවීමට අද නොහැකියාවක් ඇති වී තිබෙනවා.

ඒ වාගේම නීතිපතිතුමා ප්‍රකාශයක් කළා අප්‍රේල් මාසේ 30 වැනිදාට කලින් මේ පුරප්පාඩු පුරවන්න ඕනෑ. එහෙම පුරප්පාඩු පුරවන්නේ නැත්නම් නැවත වතාවක් සංශෝධන ගෙන යා යුතුයි කියලා නීතිපතිතුමා ප්‍රකාශයක් කළා. නමුත් ආණ්ඩුව අද වනකල් පුරප්පාඩු පිරවීම සඳහා අලුත් සංශෝධන කිසිවක් පළාත් සභාවට හෝ පාර්ලිමේන්තුවට හෝ තවම ඉදිරිපත් කරලා නැහැ. ඒ වාගේම පුවත්පත් දැන්වීම් මගින් ජාතික නිර්ණායක කොමිෂම දැන්වීම් පළ කළා අදහස් විමසන්න. අපේ පක්ෂයේ ලේකම්තුමා සභාපතිතුමාට ලිපියක් යවලා කරුණු ගණනාවක්

ලිඛිතව විමසුවා. අද වනකල් ඒ ජාතික නිර්ණායක කොමිසමේ සභාපතිතුමාට ලිඛිතව යවපු ඒ ලියුමට තවම උත්තර ලබා දීලා නැහැ. ඒ වාගේම ආණ්ඩුවේ දේශපාලන නායකයන්ගේ උපදෙස් පමණයි ඒ නිර්ණායක ජාතික කොමිසම පිළිපදින්නේ. අනෙකුත් දේශපාලන පක්ෂ එක්සත් ජාතික පක්ෂය, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණ, ද්‍රවිඩ සන්ධානය යන දේශපාලන පක්ෂවල කිසිම නියෝජිතයෙක් මේකේ ක්‍රියාත්මක කරවීමට ඒ හා සම්බන්ධ කරගෙන නැහැ.

ඒ වාගේම ගම්පහ ප්‍රාදේශීය සභාවේදී පසුගිය මාසික සභා රැස්වීමේදී ආණ්ඩුවේම මන්ත්‍රීවරයෙක් මතු කළා, කොට්ඨාශ මට්ටමේ නිර්ණායක සඳහා මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසලා නැහැයි කියලා. ඒ සභාවේ රැස්වීමේදීම ආණ්ඩුවේ තවත් මන්ත්‍රීවරුන් නැගිටලා කියනවා, මේක ක්‍රියාත්මක කරන්නේ බැසිල් රාජපක්ෂ ඇමැතිතුමාගේ උපදෙස් මත විතරයි. කාගෙන්වත් අපි මේකට උපදෙස් ගන්න, අදහස් ගන්න අවශ්‍ය නැහැයි කියලා ආණ්ඩු පක්ෂයේ තවත් මන්ත්‍රීවරයෙක් නැගිටලා ඒ මන්ත්‍රීතුමාට පිළිතුරු දුන්නා. මේක මම හිතන්නේ ඉතාම බරපතළ තත්ත්වයක්. මොකද, මේ කොට්ඨාශ නිර්ණය කිරීමේදී බහු ආසන, වාර්ගික, භූගෝල පදනම මත ඒ වාගේ කරුණු රාශියක් කෙරෙහි අපි අවධානය යොමු කරන්න වෙනවා. ඒ වාගේම මහජනතාවගේ අදහස්, සිවිල් සංවිධාන, දේශපාලන නායකයන්ගේ අදහස්, මහජන නියෝජිතයන්ගේ අදහස් මේවා ගන්න වෙනවා. නමුත් අද ලංකාව පුරාම මේ කිසිම දෙයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ආණ්ඩුවේ ඉන්න දේශපාලන නායකයන්ගේ උවමනාව මත තමයි අද වනකොට මේ කොට්ඨාශ නිර්ණය කිරීමේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ.

ඒ නිසා ගරු සභාපතිතුමා ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ මාර්ගයෙන් මගින් ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා වහාම මේ ගැන ජනතාව දැනුවත් කරලා ජනතා නියෝජිතයන්ට, සිවිල් සමාජ නායකයන්ට, දේශපාලන පක්ෂවල නායකයන්ට ඒ වාගේම මහජනතාවට අදහස් දෙන්න මේවා විවෘත කරන්න කියලා. එහෙම කළේ නැත්නම් නැවත වතාවක් මේවා තම තමන්ගේ දේශපාලන උවමනා මත මේ කොට්ඨාශ බෙදන්න ගියොත් තවත් මේ රට අවුලකට ගමන් කරනවා කියන එක මම මතක් කරන්න කැමැතියි. ඒ විතරක් නොවෙයි. අවසාන වශයෙන් බහුතර ප්‍රජාතන්ත්‍රවාදය කියලා, ඒ බහුතර ප්‍රජාතන්ත්‍රවාදය යටතේ සුළු ජන කොටස්වල අයිතීන් පාගන්න, යට කරන්න උත්සාහ කළොත් තව තවත් මේ රටේ ගැටළු රාශියකට අපට ඉදිරියේදී මුහුණ දෙන්න වෙනවා. ඒ පිළිබඳ අනතුර මම ආණ්ඩුවට මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් පූ.භා. 11.30 ට ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස්විය.***

*Accordingly the Sitting, Suspended and. it resumed at 11.30 a.m with Hon. A M Yoosuf in the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

න්‍යාය පත්‍රයට අනුව පළමු ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කිරීමට සුනිල් ජයමිණි ගරු සභානායකතුමාට අවස්ථාව.

# ශෝක ප්‍රකාශ යෝජනාව I : ගරු එම්. සුජිත් කුමාර් දේශප්‍රිය මැතිතුමා
## MOTION EXPRESSING CONDOLENCES I : HON. M. SUJITH KUMAR DESHAPPRIYA, MEMBER

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාවට, දෙවන පළාත් සභාවට හා තෙවන පළාත් සභාවට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් කළුතර පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්ව වසර පහළොවක පමණ කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රී එම්. සුජිත් කුමාර් දේශප්‍රිය කුරේ මැතිතුමා නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමාගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමාගේ වියෝව පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුජිත් දේශප්‍රිය කුරේ මැතිතුමා අපි දැන හඳුන ගන්නේ මේ පළාත් සභා ක්‍රමයත් සමග. 1968 දෙසැම්බර් මාසේ 18 වැනිදා ජන්ම ලාභය ලැබූ එතුමා මේ රටේ සුවිශේෂී දේශපාලන පවුලක සාමාජිකයෙක් ලෙසයි තමන්ගේ ජන්ම ලාභය ලබන්නේ. පානදුර ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා හැටියට ඒ වාගේම එක්සත් ජාතික පක්ෂ රජයේ විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරපු මර්වින් ජේ. කුරේ මැතිතුමාගේ ආදරණීය පුත්‍රයා හැටියට එතුමා මෙලොව ජන්ම ලාභය ලබමින් සහෝදර සහෝදරියන් තිදෙනෙකුගෙන් යුත් පවුලක කටයුතු කරන දරුවෙක් හැටියට තමයි සුජිත් කුරේ මැතිතුමාගේ ළමා කාලය සඳහන් වන්නේ. වාද්දුව ශාන්ත මරියා විද්‍යාලයෙන් සහ කොළඹ ශාන්ත පීතර විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ එතුමා අර මම කලින් සඳහන් කළා වාගේ ගරු සභාපතිතුමා හොඳින් දන්නවා. කළුතර දිස්ත්‍රික්කයේ තමන්ගේ පියාගේ අඩි පාරේ යමින් දේශපාලන ප්‍රවාහයට එක් වන චරිතයක් බවට පත් වෙනවා.

1988 පළාත් සභා ක්‍රමය ආරම්භ වනකොට මේ රටේ පළාත් සභාවට ඉදිරිපත් වීම ගැටළුවක් වෙලා තිබුණා. ඒ වෙලාවේ එක්සත් ජාතික පක්ෂය විසින් පානදුර ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයෙක් හැටියට සුජිත් කුරේ මැතිතුමාව මේ තරගයට ඉදිරිපත් කිරීමට තෝරා ගන්නවා. ඒ අනුව තමන්ගේ පියාගේ අඩි පාරේ යමින් 1988 පවත්වපු පළාත් සභා මැතිවරණයට එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයෙක් හැටියට එතුමා ඉදිරිපත් වෙලා, මම හිතනවා මම නිවැරැදියි කියලා. මේ පළාත් සභාවට තේරී පත් වුණු මන්ත්‍රීවරු අතර අදටත්

[ ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා ]

ලාබාලම පළාත් සභා මන්ත්‍රීවරයා හැටියට සටහන් වෙන්නේ සුජිත් කුරේ මැතිතුමා. යාන්තම් අවුරුදු 19 සම්පූර්ණ වනකොට එතුමාට භාග්‍ය ලැබෙනවා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට තමන්ගේ කටයුතු ආරම්භ කරන්න. 1988 ඉඳලා එතුමා බස්නාහිර පළාත් සභාවේ පළමුවැනි පළාත් සභාව, 1993 දෙවැනි පළාත් සභාව, 1998 පවත්වපු තෙවන පළාත් සභාව කියන පළාත් සභා තුනම ජයග්‍රහණය කරලා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් තමන්ගේ කාර්ය භාරය ඉටු කළා. මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. එතුමාත් එක්ක අපි වසර 10 ක් පමණ මේ පළාත් සභාවේ එකට කටයුතු කළා. අපි අතර විවිධ ප්‍රතිවිරුද්ධ දේශපාලන මත තිබුණත් - මොකද, එක්සත් ජාතික පක්ෂය බලයේ ඉන්න කාලේ තමයි එතුමා පළාත් සභාවට පත් වුණේ. බලයේ ඉන්න කාලේ එතුමා පළාත් සභාවට පත් වුණත් පළාත් සභාව තුළ එතුමා හැමෝ එක්කම සුහදශීලී මිත්‍රයෙක් හැටියට කටයුතු කරපු මන්ත්‍රීවරයෙක්. අපි සාමාන්‍යයෙන් කෙනෙක් මිය ගියාම නැති හොඳත් සමහර විට සඳහන් කරනවා. නමුත් සුජිත් කුරේ මැතිතුමා එහෙම නොවෙයි. බොහොම සුහදශීලී මන්ත්‍රීවරයෙක් හැටියට අපත් එක්ක කටයුතු කළා. එක්සත් ජාතික පක්ෂයෙන් පළාත් සභාවේ බලය චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියට ගිය වෙලාවේ යළිත් වරක් පළාත් සභාවට පත් වෙලා එතුමා පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට තේරී පත් වෙලා පළාත් සභා මන්ත්‍රීවරු අතර දැඩි සුහදත්වයෙන් කටයුතු කළ මන්ත්‍රීවරයෙක් කියන එක මතක් කරන්න ඕනෑ. මම දන්නවා. සුජිත් කුරේ මැතිතුමා නිතරම කටයුතු කළේ තමන්ගේ පක්ෂය ආරක්ෂා කර ගන්න. ඒ වාගේම පක්ෂයට කඩිනම් ජයග්‍රහණයක් ලබා දෙන්න පුළුවන් නම් එතුමා ඒකට බොහොම කැමැත්තෙන් හිටපු කෙනෙක්.

අපි දන්නවා. බස්නාහිර පළාත් සභාවේ එතුමා අවුරුදු 15 ක් කටයුතු කරලා, මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා සමගත් මේ ගැන කථා කළා. මට මතකයි. දවසක් දා පළාත් සභාවේ එක්සත් ජාතික පක්ෂයත් එක්ක හෝ පළාත් සභාවත් එක්ක එතුමා මත අරගලයක නිරත වුණා. ලාබාල මන්ත්‍රීවරු කිහිප දෙනෙක් එවකට කළුතර දිස්ත්‍රික්කයෙන් පළාත් සභාව නියෝජනය කළා. අපේ සංජය ගලබඩ මන්ත්‍රීතුමා. සුජිත් කුරේ මන්ත්‍රීතුමා. හේමන්ත වික්‍රමආරච්චි මන්ත්‍රීතුමා සහ සේනක සමරනායක මන්ත්‍රීතුමා කියන මන්ත්‍රීතුමන්ලා හතර දෙනාම බොහොම තරුණ මන්ත්‍රීවරු හැටියට තමයි මේ පළාත් සභාවේ කටයුතු කළේ. ඒ මන්ත්‍රීවරු හතර දෙනා නිතරම ගත්තේ එකම තීන්දුවක්. පළාත් සභාව ඇතුළේ බොහොම යාළුවෝ මිත්‍රයෝ හැටියට කටයුතු කළේ. සුජිත් කුරේ මැතිතුමා ඇතුළු මේ මන්ත්‍රීවරු හතර දෙනාම අවසානයේ පළාත් සභා ක්‍රමය පිළිබඳව යම් කලකිරීමකින් හිටියා. එක්වරම ඒ අය සඳහන් කළා - තෙවැනි පළාත් සභාවට ලෙහෙසියෙන්ම පත් වෙන්න අවස්ථා තිබුණා. ඒ අය ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තා අපි යළිත් පළාත් සභාවට තරග කරන්නේ නැහැයි කියලා. ඒ හතර දෙනාම තරග කළේ නැහැ. නමුත් මම මේ දොසක් කියනවා නොවෙයි. බලයට එන්න හොඳටම අවස්ථාව තිබියදීත්, යළිත් තරග කළා නම් අනිවාර්යයෙන්ම පළාත් සභාවට පත් වෙන්න දේශපාලන වපසරිය ගොඩ නඟාගෙන තියෙද්දිත් ඒ මන්ත්‍රීවරු හතර දෙනා එකවර තීන්දුවක් ගත්තා ඊළඟ පළාත් සභාවට තරග කරන්නේ නැහැයි කියලා. මම දන්නේ නැහැ මොකක්ද හේතුව කියලා. නමුත් එහෙම අභිමානවත් තීන්දුවක් ගන්න කෙනෙකුට අදහසක් පළ වෙන්නේ බොහොම කලාතුරකින්. මොකද, මන්ත්‍රී ධූරයත් නැති කරගෙන, පළාත් සභාවේ ඉඳලා, එකපාරටම තීන්දු කළා මම ඊළඟ පාර තරග කරන්නේ නැහැයි කියලා. එය ඉතා නිවැරැදි හෝ වැරැදි හෝ බොහෝ සේ එඩිතරව ගත්ත තීන්දුවක් ඒක. ඒ නිසා සුජිත් කුරේ මැතිතුමා පරාජය වෙලා මේ පළාත් සභාවෙන් ගිය කෙනෙක් නොවෙයි. එතුමා පරාජයට පත් නොවී, පළාත් සභාවට තරග නොකර පළාත් සභාවේ ප්‍රකාශයක් කරලා බොහොම කැමැත්තෙන් පළාත් සභාවෙන් ගිය කෙනෙක් තමයි සුජිත් කුරේ මැතිතුමා. ඒකයි මම කිව්වේ බොහොම හිතවත් මන්ත්‍රීවරයෙක් කියලා. මන්ත්‍රීවරුන්ගේ හැම ප්‍රශ්නයකදීම තමන්ගේ දායකත්වය බොහොම ඉහළින් ලබා දුන්නා. ඒ වාගේම කථා කරන්න අවශ්‍ය දේ පළාත් සභාව තුළ බොහොම කෙලින් කථා කළා. තමන්ගේ හෝ අඩුපාඩුවක් තිබෙනවා නම් අඩුපාඩුව පෙන්වා දෙන්න තරම් එතුමාට හොඳ ආත්ම ශක්තියක් තිබුණා. ඒ නිසා මේ පළාත් සභාව තුළ මන්ත්‍රීවරයෙක් හැටියට අප දුටු ඉතා සුවිශේෂී චරිතයක් තමයි සුජිත් කුරේ මන්ත්‍රීතුමාගේ චරිතය.

ඒ නිසා මේ කනගාටුදායක අවස්ථාවේ මම මීට වඩා වැඩි යමක් සඳහන් කරන්න යන්නේ නැහැ. එතුමා පළාත් සභාවට විශාල සේවයක් කරපු කෙනෙක්. පළාත් සභා ක්‍රමයට විශාල සේවයක් කරපු කෙනෙක්. එදා පළාත් සභාව ආරක්ෂා කර ගන්න පළාත් සභාවට ඉදිරිපත් වුණු වෙලාවේ වයස අවුරුදු 19 යි. ඒ විධියට මේ පළාත් සභාවට ඇවිල්ලා තරුණයෙක් හැටියට මේ පළාත් සභාව නියෝජනය කරලා අවුරුදු 15 ක් අඛණ්ඩව මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා කටයුතු කරලා අපරාජිතව තමන්ගේ මන්ත්‍රී ධූරය රැකගෙන ගිය මන්ත්‍රීවරයෙක් හැටියටයි මම එතුමාව හඳුන්වන්නේ. ඒ නිසා සුජිත් කුරේ මැතිතුමා පළාත් සභාවට කරපු සේවය ඉතා විශාලයි. අපි දන්නවා, එතුමා ඒ කාලෙත් තමන්ගේ ප්‍රදේශවලට, ජනතාවට, මිත්‍රයින්ට ලබා දිය යුතු සියලු දේවල් ලබා දුන්නා. ඒ නිසා ඒ සියලු දේ පළාත් සභා ක්‍රමය තුළින් එතුමා ඉටු කර ගත්තා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ කනගාටුදායක අවස්ථාවේ පළාත් සභාවට අතිවිශාල සේවයක් කරපු සුජිත් කුරේ මැතිතුමාට පළාත් සභාවේ සංවේගය පළ කිරීම මගේ යුතුකමක් වෙනවා. ඒ නිසා බස්නාහිර පළාත් සභාව මේ අවස්ථාවේ සුජිත් කුරේ මැතිතුමා වෙනුවෙන් අපේ

සංවේගය පළ කර සිටීමේ යෝජනාව ඉදිරිපත් කරමින් එතුමා බෞද්ධයෙක් හැටියටත් අපේ ආගමේ හැටියටත් එතුමාට ශාන්ත අමා මහ නිර්වාණ සම්පත්තිය ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බස්නාහිර පළාත් සභාව ආරම්භයේ ඉඳලා වාර තුනක්, එහෙම නැත්නම් වසර 15 ක් අඛණ්ඩව මේ සභාව නියෝජනය කරලා අපරාජිත මන්ත්‍රීවරයෙක් හැටියට පළාත් සභාවෙන් සමු අරගෙන ගිය අපේ හිතවත් සුජිත් කුරේ මැතිතුමාගේ අභාවය පිළිබඳව මගේ මතකය අවදි කරන්න මේක අවස්ථාවක් කර ගන්නවා. එතුමා පිළිබඳව මේ සභාවේ අපේ ගරු සභානායකතුමා කිව්වා වාගේ අවුරුදු 25 ක ඉතිහාසයේ නොමැකෙන වාර්තාවක් තිබෙනවා. ඒ තමයි මේ පළාත් සභාවට පත් වුණු ලාබාලම පළාත් සභා මන්ත්‍රීවරයා. පත් වන විට අවුරුදු 19 යි. මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරලා හතර වටින් භීෂණය රජ කරන කාලයේ තරුණයෙක් හැටියට නොබියව පළාත් සභා මැතිවරණයට මුහුණ දීලා ජයග්‍රහණය කරලා, මේ පළාත් සභාව ශක්තිමත් කරන්න තමන්ගේ තරුණ අවදියේම දායකත්වය ලබා දුන්න නිර්භීත මන්ත්‍රීවරයෙක් හැටියටයි මම එතුමාව දකින්නේ. එතුමා 1988, ඊළඟට 1993, ඊළඟට 1999 කියන මේ පළාත් සභා වාර තුනේම වසර 15 ක් මේ සභාව නියෝජනය කළා. ඒ වාගේම සභානායකතුමා කිව්වා වාගේ එවකට හිටපු තරුණ මන්ත්‍රීවරු හතර දෙනාම සේනක සමරනායක ඔහුගේ අතිජාත මිත්‍රයා. හේමන්ත වික්‍රමාරච්චි, සංජය ගලබඩ ඔය හතර දෙනාම ඒ වාරයෙන් පස්සේ කිව්වා අපි නැවත තරඟ කරන්නේ නැහැ. මොකද, ඔහු තුළත් මේ ක්‍රමය පිළිබඳව යම් යම් මතිමතාන්තර තිබුණා. ඒ නිසා ඔහු එළියට ගියා. ඔහු මේ සභාවේ ඇත්ත වශයෙන්ම තමන්ගේ අදහස් නිර්භීතව ප්‍රකාශ කළ මන්ත්‍රීවරයෙක්.

මට මතකයි. එක් අවස්ථාවක. 2000 මැතිවරණය අවසන් වෙලා මේ සභාවම නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් ගම්පහ දිස්ත්‍රික්කයේ පරාජය වෙලා ඔහුට ඒ වේදනාව දරා ගන්න බැරිව යම්කිසි වචන හුවමාරුවක් මාත් එක්ක වුණා. අපේ පරණ පළාත් සභා රැස්වීම පැවැත්වූ සච්සිරිපායේදී. ඒක බලාගෙන හිටපු සුජිත් කුරේ මන්ත්‍රීතුමා, මම පැත්තකට වෙලා ඉන්නවා දැකලා, මාව අතින් ඇදගෙන එළියට ගිහිල්ලා අර බහින් බස් වූ මන්ත්‍රීවරයාට කථා කරලා කිව්වා, අතට අත දීලා සමාව ගන්නය කියලා. මට මතකයි, ඒ මන්ත්‍රීවරයා ටිකක් වෙලා සුජිත් කුරේ දිහා බලාගෙන හිටියා. බලාගෙන ඉඳලා මට සමාවෙන්න කියලා ඉවර වෙලා මට අතට අත දුන්නා. සුජිත් එහෙම කළේ, ඔහු තුළ තිබුණා මේ හරි වැරැද්ද තෝරා ගැනීමේ ඇත්ත වශයෙන්ම පුදුමාකාර ගති ලක්ෂණයක්. ඒ වාගේම තමයි මිත්‍ර සමාගමට ඉතාමත්ම දැඩිව ඇලුම් කරපු පුද්ගලයෙක්. ඔහු හැම වෙලාවේම කෙළිදොලෙන් හිටියා. පක්ෂයේ කටයුතුවලදී නොසැලී ඒ දේවල්වලට දායකත්වය දුන්නා. කිසි දෙයක් ඉතිරි කර ගන්න ඕනෑය කියලා තණ්හාවෙන් දේශපාලනය කරපු පුද්ගලයෙක් නොවෙයි. අපි බොහෝ අවස්ථාවලදී ඔහුට කිව්වේ - ඔහුට හොඳ දීර්ඝ දේශපාලන අනාගතයක් තිබුණා. නමුත් විවිධ හේතූන් මත ඔහු ඒක අතරමග නතර කර ගත්තා. අපි දැක්කා, යම් යම් අඩුපාඩුකම්. ඔහුගේ විවාහ ජීවිතය, පවුල් ජීවිතය විවිධ අවස්ථාවලදී හැල හැප්පීම්වලට ලක් වුණා. මම මිත්‍රයෙක් හැටියට බොහෝ අවස්ථාවලදී ඔහුට හිතවත්කමින් කිව්වා, මේ මේ දේවල් අපි නතර කරමු. මේ මේ දේවල් කරන්න එපා. අපි නැවත යම් යම් තීරණවලට එළඹිලා මේ විවාහ ජීවිතය ශක්තිමත් කර ගන්න ඕනෑය කියලා උපදෙස් දුන්නා. නමුත් ඔහු ඒකට ඒ තරම් කන් දීමක් කළේ නැහැ. එතැන තමයි මම හිතන්නේ ඔහුගේ පළමුවැනි කඩා වැටීම සිද්ධ වුණේ. ඉතාම හොඳ ගුණගරුක භාර්යාවක් ඔහුට හිටියා. එක දරුවෙක් හිටියා. ඔහු මන්ත්‍රී ධුරයෙන් අයින් වෙලා ඊට පස්සෙත් බොහෝ කාලයක් අපිත් එක්ක ඇසුරු කළා. ඒ කාල සීමාව තුළදීත් විටින් විට අපි මේ කාරණාව ඔහුට මතක් කළා. මෙතැන තමයි මේ කඩා වැටීමේ ආරම්භය. ඔබේ ජීවිතයේ කඩා වැටීමේ ආරම්භය. දේශපාලනය නොවෙයි. පවුල් ජීවිතය. ඒ නිසා මේක නැවත ගොඩ නගා ගන්නටය කියලා උපදෙස් දුන්නා. නමුත් අපි දන්නේ නැහැ. මොන විධියේ අදහසක් ඔහු තුළ තිබුණාද කියලා. ඔහු පානදුරේ ජනතාවට වාගේම කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවට ඉතා හොඳ වටිනා සේවාවක් කළා. මොකද, ඔහුට එහෙම කරන්න පුළුවන්කම ලැබුණා 1988 වකවානුවේ ඔහුගේ පියා නියෝජ්‍ය විදුලිබල ඇමතිවරයා, රාජ්‍ය ඇමතිවරයා හැටියට ඉන්න කාලයේ ඒ සේවාව ඔහු කළුතර දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දුන්නා. හැබැයි කොයිම අවස්ථාවකවත් මගේ තාත්තා පාර්ලිමේන්තුවේ බලගතු ඇමතිවරයෙක් කියන ඒ මානසිකත්වය ඔහු තුළ තිබුණේ නැහැ. ඔහු සාමාන්‍ය පුද්ගලයෙක් හැටියට, හොඳ යාලුවෙක් හැටියට, විනෝදයෙන් ඉන්න යාලුවෙක් හැටියට ඇසුරු කරන්න පුළුවන් මිත්‍රයෙක් හැටියට ඔහු සාමාන්‍ය පුද්ගලයෙක් හැටියට මේ සභාවේත්, ඉන් පිටත් කටයුතු කළේ. ඒ නිසා තමන්ගේ යම් යම් අඩුපාඩුකම් තිබෙන්නට පුළුවන්. අපි හැමෝම තුළ ඒවා තිබෙනවා. ඒවා නිසා ජීවිතය අතරමගදී හැර යනවා. සුජිත් කුරේ කියන්නේ, පැහැදිලි දේශපාලන අනාගතයක් තිබුණු පුද්ගලයෙක්. දේශපාලන පසුබිමක් තිබෙන පවුලකින් ආපු පුද්ගලයෙක්. ඔහුට පැහැදිලි දේශපාලන අනාගතයක් තිබුණා.

හැබැයි එය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට නොහැකි වීම නිසා ඔහුට ජීවිතය අතරමග දාලා යන්න සිද්ධ වුණා. විශේෂයෙන්ම, ඔහුගේ විවාහ ජීවිතය දෙදිරීමට ලක් වුණාට පස්සේ ඔහු දැඩි කලකිරීමකට හා කම්පනයකට පත් වෙලා හිටියා. ඒ නිසා ඇති වූ විවිධ හැල හැප්පීම් ඔහුගේ ජීවිතය අතරමග මේ අවාසනාවන්ත ඉරණමට ගොදුරු වුණයි කියන විශ්වාසයයි මා තුළ තිබෙන්නේ. අපි බොහොම කිට්ටුවෙන් ආශ්‍රය කළා. ඔහු ඇත්ත වශයෙන්ම හිතේ කිසි දෙයක් තියා ගෙන නොසිටිය පුද්ගලයෙක්. එහෙම ආපහු පස්සෙන් ඇවිල්ලා කිසි කෙනෙකුගෙන් පළි ගැනීමේ චේතනාවක් එහෙම ඔහු තුළ තිබුණේ නැහැ. නමුත් කොහොම වුණත් ඔහු අද අප අතර නැහැ.

මේ සභාවේ අවුරුදු පහළොවක් ලාබාල මන්ත්‍රීවරයා හැටියට වාර තුනක් නියෝජනය කරලා ඉතිහාසගත වන මතක සටහන් මේ පළාත් සභාවේ තියපු අපේ ආදරණීය මිත්‍රයා ඔහු වෙනුවෙන් තබන මේ සටහන හමාර කරමින්, ඔහු ජීවිතයේදී යම් යම් අතපසුකිරීම් ඔහු විසින්ම කර ගත්තා. ඒ නිසා තමයි අද ඔහුට ජීවිතය අතරමග දාලා යන්න සිද්ධ වුණේ. ඔහු අදහපු ආගම, අපි සියලු දෙනාම ඉතාම භක්තියෙන් අදහන ආගම, රෝමානු කතෝලික ආගම අනුව ඔහුට මෝක්ෂ සම්පත්තිය ලැබිලා, ඔහුගේ සියලු වරදවල් ඔහුට කමා කරන්නට දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ඔහුට ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු විකුම් ගුණසේකර**
Hon. Wikum Gunasekara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුජිත් කුරේ හිටපු ගරු මන්ත්‍රීතුමාගේ ශෝක ප්‍රකාශ යෝජනාව තුළ කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මගේ අසල්වැසි මන්ත්‍රීවරයෙක්. අපි බොහොම ළඟ අය. අපේ පවුලේ, මගේ බිරිඳගේ පවුලේ අයත් එක්ක බොහොම ළඟ සමීප ආශ්‍රයක් තිබුණු මන්ත්‍රීවරයෙක් තමයි අපේ සුජිත් කුරේ මැතිතුමා. එතුමා බොහොම සරළ ජීවිතයක් ගත කළේ. යාලුවෝ බොහොම හිටියා. මිත්‍රත්වය බොහොම තද විධියට තිබුණා. මිතුරොත් එක්ක බොහොම සරළ ජීවිතයක් ගත කළ කෙනෙක්. මම හිතනවා ඔහු තුන්වන පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් වන වෙලාවේ එතුමා රිය අනතුරකට ලක් වුණා. ඒ තුළදී එතුමාගේ හිස වැදීම තුළ එතුමා යම් ඔත්පල තත්ත්වයකට පත් වුණා. මානසික තත්ත්වයේත් බොහොම ගැටළු මතු වුණා. ඒ තුළ එතුමාගේ යම් කඩාවැටීමක් සිද්ධ වුණා. එතුමාගේ දේශපාලන ජීවිතය සහ ඔහුගේ ජීවිතය. සමහර විට නිදි මරපුවාම එතුමාට ඒ රෝග උත්සන්න වෙලා ගොඩක් ගැටළුවලට මුහුණ දීපු අවස්ථා තිබුණා. අපි දැක්කා. මොකද, එතුමා මගේ අසල්වැසියෙක්. ඒ නිසා අපි නිතරම දකිනවා. ඒ රිය අනතුරෙන් පසුව තමයි එතුමාගේ ජීවිතය යම් පමණකට අර පරිහානියට ලක් වෙන්න පත් වුණේ. ඊට පස්සේ කොහොම හරි අපි එකට ඡන්දය ඉල්ලුවා. එතුමා විපක්ෂයෙන් ඡන්දය ඉල්ලුවා. මම දැන් පත් වෙලා තිබෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයකු හැටියට ඡන්දය ඉල්ලුවා.

හැබැයි, අපි කවදාවත් කිසිම ගැටුමකට ගියේ නැහැ. මම හිතනවා, අපේ ජගත් අංගගේ ඇමතිතුමා අපි සියලුම දෙනාම එකට හිටියේ. පක්ෂ දෙකකින් අපි ඡන්දය ඉල්ලුවත් කවදාවත් අපි කිසිම කෙනෙකු අතර භේදයක් ඇති වුණේ නැහැ. බොහොම උනන්දුවෙන් ඒ අවශ්‍ය කටයුතු කළා. කොහොම හරි එතුමාට ඒ වෙලාවේ පත් වෙන්න බැරි වුණා. බැරි වුණාට එතුමා අපි බොහොම සුහදශීලී වැඩ සටහනකට හැමදාම ගියේ. ඉතින් ඒ වාගේම මෙතුමා අද බොහොම සන්තෝෂ වෙනවා. ශාන්ත මරියා විද්‍යාලයෙන් එතුමා මූලික අධ්‍යාපනය ලබලා තිබුණේ. එතුමාගේ පුස්තකාලය තමයි අද තවමත් දරුවෝ පාවිච්චි කරන්නේ. එතුමා මන්ත්‍රී ප්‍රතිපාදනවලින් ලබා දීපු පුස්තකාලය තමයි අදත් දරුවෝ පාවිච්චි කරන්නේ. ඒ වාගේම එතුමාගේ පියාගේ අඩිපාරේ යමින් - පියා විදුලිබල රාජ්‍ය ඇමතිවරයා වශයෙන් ඉන්න කොට ප්‍රදේශයට විශාල සේවයක් එතුමා කළා. විශේෂයෙන්ම මට කිහිප දෙනෙක්ම කිව්වා විදුලිබලය ලබා දීම සම්බන්ධව ඔවුන්ව මතක් කරන්න කියලා. මේවා දැන ගන්න. විජය කුමාරතුංග මාවත ප්‍රදේශයේ අය, විවේකාරාම ආශ්‍රිත ඒ සියලුම ගම්මානවලට විදුලි බලය ලබා දීමට ගොඩක් උදව් වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම එතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් ගොඩාක් කටයුතු කරලා තිබෙනවා. මොකද, අවුරුදු පහළොවක් එතුමා මේ සභාව නියෝජනය කළා. ඒ වාගේම එතුමාගේ සහෝදරවරු පිළිබඳවත් කියන්න ඕනැ. සහෝදරවරු හුඟක් උනන්දු වුණා. මොකද, එතුමා තනිවෙලා ඉන්න වෙලාවේ. අම්මයි තාත්තයි දෙන්නාම මාස තුනක් වාගේ ඇතුළතදී අහිමි වීම තුළ එතුමා තනි වුණාම - මෙතැනට ඇවිල්ලා ඉන්නවා එතුමාගේ පුංචි අම්මා. ලලිතා අක්කා. එතුමිය තමයි මෙයා බලාගත්තේ. සහෝදර සහෝදරියෝ හුඟක් උදව් කළා, කොහොම හරි එතුමාගේ කෑම ටික සපයලා, ඒ අවශ්‍ය කටයුතු කරන්න. ඒත්, පසුව එතුමා තනි වීම තුළ එතුමාගේ අර පරණ අසනීප තත්ත්වය උත්සන්න වුණා. ඒවා තුළ තමයි අන්තිමට එතුමාට ජීවිතය හැර යන්නට සිද්ධ වුණේ. ඇත්ත වශයෙන්ම එතුමා කරපු සේවය පිළිබඳව අපට ලොකු ගෞරවයක් තිබෙනවා. මොන දේ වුණත් එතුමා අවසන් කාලයේදී, අපේ පසුගිය මහ මැතිවරණයේදී කළුතර දිස්ත්‍රික් නායක, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපති කුමාර වෙල්ගම මැතිතුමා එක්ක එක්කහු වෙලා දේශපාලන කටයුතු කළා. එතුමාට හොඳ සහයෝගයක් දැක්වුවා. ඒ තුළ එතුමා ගමනා ගමන වෛද්‍ය ආයතනයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙක් වශයෙන් පත් වෙලා ඒ අවශ්‍ය කටයුතු කරද්දී එතුමා කිහිප තැනකම ගිහිල්ලා නිදි මරලා ඒ වාගේ වුණාම ඔහු නැවතත් අර ලෙඩ තත්ත්වයට, අර මානසික තත්ත්වයට පත් වෙලා තමයි එතුමාට එතැනිනුත් ඉවත් වෙන්න සිද්ධ වුණේ. මොකද, නිතරම යන්නේ නැතිව ඉඳලා. අන්තිමට සේවය හැර ගියා සේ සැලකුනා. ඉතින් ඒ වාගේ ඒ අසනීප තත්ත්වයෙන් ගොඩක් පීඩා වීම තුළ තමයි එතුමාගේ යම් පරිහානියක් ඇති වුණේ. එතුමා හොඳට ඉන්න කාලයේ එතුමාට මිත්‍රයෝ ගොඩක් සිටියා. විශේෂයෙන්ම කලමුල්ල, එතැනින් ගියාම පයාගල, බේරුවල ඒ වාගේ කතෝලික පල්ලි වාගේ දේවල්. එතුමා ගොඩාක් උනන්දු වෙලා තිබෙනවා. කතෝලික භක්තිකයෙක් හැටියට ඒවා දියුණු කරන්න. ඒ වාගේම එතුමාගේ තාත්තාගේ අඩි පාරේ යමින් බෞද්ධ පන්සල්වලටත් - විශේෂයෙන්ම ඒක මතක් කරන්න ඕනැ. ඔහු කතෝලික කියලා හිටියේ නැහැ. බෞද්ධ පන්සල්වලටත් ඉතා විශිෂ්ට සේවයක් කළා. ඉතින් ඒවාට සාක්ෂි දරනවා අපේ බෝපිටියේ ධම්මික හාමුදුරුවෝ එහෙම. ඇත්ත වශයෙන්ම බොහොම ළඟින් ආශ්‍රය කරලා, තාත්තාගේ අඩි පාරේ ගිහින් ඒ අවශ්‍ය කටයුතු කළා. විශේෂයෙන්ම බෞද්ධයෝ හැටියට අපි ඒවා බොහොම අගය කරන්නට ඕනැ කටයුතු. ඉතින් ඒ නිසා මෙතුමාගේ අභාවය පිළිබඳව, එතුමා අදහන ආගම අනුව එතුමාට මොක් සුව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
**Hon. U. George Perera - Chief Opposition Whip**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම බස්නාහිර පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාව, දෙවන පළාත් සභාව, තෙවන පළාත් සභාව එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින්, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ආසනය නියෝජනය කරමින් තෙවරක්, වසර 15 ක් නොකඩවා පළාත් සභා මන්ත්‍රීවරයෙක් වුණු අපේ හිතමිත්‍ර සුජිත් කුරේ මැතිතුමාගේ ශෝක යෝජනාව කරන මේ අවස්ථාවේදී මුලසුනේ සිටින අපේ ඒ.එම්. යුසුප් ගරු මන්ත්‍රීතුමා, එදා පළමුවන පළාත් සභාවේ සමූපකාර අමාත්‍යතුමා වශයෙන් තමයි කටයුතු කළේ. ඒ කළුතර දිස්ත්‍රික්කයේම එතුමාගේ යටතේම තමයි අපේ සුජිත් කුරේ ගරු මන්ත්‍රීතුමා කළුතර දිස්ත්‍රික්කයෙන් තරඟ කරලා මන්ත්‍රී වුණේ. ඉතින් එවැනි අවස්ථාවක අද ඔබතුමා මූලාසනය දැරීමත් සමඟම මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධව අපේ ස්තුතිය අපි ප්‍රකාශ කරනවා.

සුජිත් කුරේ ගැන කථා කරනවා නම්, එතුමාගේ පියා අපි කවුරුත් දන්නා මර්වින් ජේ. කුරේ හිටපු ඇමතිතුමා. එතුමා ඉතාම හොඳ බුද්ධියක් තිබෙන, හසළ දැනුමක් තිබෙන, කෘතහස්ත දේශපාලඥයෙක්. එතුමාගේ ආදරණීය පුත්‍රයා ගැන තමයි අපි මේ යෝජනාව තුළින් අද කථා කරමින් සිටින්නේ. එම නිසා එවැනි දේශපාලන පරිණතභාවයකින් ආපු ඒ සුජිත් කුරේ මැතිතුමා සම්බන්ධව කථා කරනවා නම්, මගේ පියා පළමුවන පළාත් සභාවේදී එතුමා සමඟ හිටියා. ඊට පසු පළාත් සභාවේදී මටත් එන්න අවස්ථාව ලැබුණා. එම අවස්ථා දෙකේදීම. මට මතක් වෙනවා. පළමු වන පළාත් සභාවේදී අපේ සිරිකමල් මන්ත්‍රීතුමා කියපු ආකාරයට ඉතා තරුණ අවදියේම මන්ත්‍රීවරයෙක් වුණු බව අපි දකිනවා. එයට හේතු ගණනාවක් තිබෙනවා. මම ඒ අවස්ථාවේ කැලණිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් කටයුතු කළේ. මගේ පියා කැලණියේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක. පළාත් සභා මන්ත්‍රී. මම විවාහ වන අවස්ථාවේ මට මතක් වෙනවා, එදා අපේ හිටපු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් විජේමාන්න ගරු මන්ත්‍රීතුමා සමඟ සුජිත් කුරේ මැතිතුමා අපේ නිවසට ඇවිල්ලා, ඒ මංගල්‍ය අවස්ථාවේ අපට තෑගි බෝග දීලා සතුටු වුණා. ඒ අවස්ථාව අපට මතක් වෙනවා. හරිම පුදුම වෙනවා. ඒ තරුණ මන්ත්‍රීවරයා ගැන තමයි අද මේ අවස්ථාවේදී අපි කථා කරමින් සිටින්නේ.

එම නිසා සුජිත් කුරේ ගැන කථා කරනවා වාගේම අපි දන්නවා. කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ආසනයට අපේ විකුම් මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට පක්ෂ භේදයකින් තොරව, ආගම් භේදයකින් තොරව දේශපාලන භේදයෙන් තොරව, කුල භේදයෙන් තොරව ඉතාම වටිනා සේවාවක් කරපු මන්ත්‍රීවරයෙක්. ඒත් අපේ සිරිකමල් මන්ත්‍රීතුමා කිව්වා වාගේ අකාලයේ එතුමාගේ දේශපාලන ජීවිතයත්, එතුමාගේ ජීවිතයත් නැති වුණා. මේක තමයි ජීවිතය. මරණය යම් යම් අවස්ථාවල සිදු වෙන්න පුළුවන්. සුජිත් කුරේ මැතිතුමාට තව දීර්ඝ වශයෙන් දේශපාලනය කරමින් ජීවත් වෙන්නත් තිබුණා. මේ වාගේ අඩු වයසින් අද ඒ අවස්ථාව එතුමාට නැති වුණා. ඒ සුජිත් කුරේ කියන නාමය අද අපට කථා කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ, මෙතුමා කරපු ඒ සේවය නිසා බව අපි අවංකව කියන්නට ඕනෑ. එම නිසා මම දීර්ඝ වශයෙන් අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. සුජිත් කුරේ මැතිතුමා පිළිබඳව මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධව අපේ ගරු සභානායකතුමාට අපේ ස්තුතිය ප්‍රකාශ කරනවා වාගේම, එතුමා සඳහන් කළා සංජය ගලබඩ මැතිතුමා, සේනක සමරනායක මැතිතුමා, හේමන්ත වික්‍රමරත්න, සුජිත් කුරේ අපි සියලු දෙනාම තරුණ අවධියේම මේ පළාත් සභාවට ඇවිල්ලා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් හඬ නැගූ ආකාරය අපට මතක් වෙනවා. අපි විදේශ සංචාර යන කොට, යම් යම් සම්මන්ත්‍රණවලට සහභාගී වන කොට එකාවාගේ කටයුතු කරපු ආකාරය අපට මතක් වෙනවා. එම නිසා සුජිත් කුරේ මැතිතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු පී.ඩී. අබේරත්න**
**Hon. P. D. Abeyrathne**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුජිත් කුරේ මැතිතුමා ගැන ශෝක ප්‍රකාශ යෝජනාව ගෙනෙන අවස්ථාවේ එතුමාත් එක්ක පළමුවැනි පළාත් සභාවට තේරී පත් වුණු මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා වෙනුවෙන් ගුණකථනයක් කිරීම මගේ යුතුකමක් හැටියට මම සලකනවා. සුජිත් කුරේ මැතිතුමා පළමුවැනි පළාත් සභාවට 1988 දී ඉදිරිපත් වුණේ. ඒ අවස්ථාවේ ඇත්තෙන්ම භීෂණය රජ කර ගෙන තිබුණු අවස්ථාවක්. ඒ වෙලාවේ මැතිවරණයට ඉදිරිපත් වන අයට ඉතාම තර්ජන ගර්ජන තිබෙන අවස්ථාවක නිර්භයව ඉදිරිපත් වෙලා එතුමා ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරන්න අතහිත දීලා, ඒ අවස්ථාවේ ජයග්‍රහණය කරලා පළාත් සභාවට පත් වුණා. එලෙස පළාත් සභාවට පත් වූ අවස්ථාවේ ඉඳලා ඉතාම තරුණ මන්ත්‍රීවරයෙක් වශයෙන් එතුමා ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළා. එතුමාට පළාත් සභා බලතල පමණක් නොවෙයි ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබුණේ. එතුමා හොඳ වාසනාවන්ත මන්ත්‍රීවරයෙක් වුණා. තරුණයෙක් වශයෙන් පළාත් සභාවට පත් වුණා වාගේම, එතුමා පත් වන කොට මේ රටේ විදුලිබල හා බල ශක්ති නියෝජ්‍ය අමාත්‍ය ධූරය දැරුවේ එතුමාගේ පියා වන මර්වින් ජේ. කුරේ මැතිතුමා. එතුමා ගෙන යන වැඩ පිළිවෙළට සම්බන්ධ වෙලා, විකුම් මන්ත්‍රීතුමා කිව්වා වාගේ පානදුර ප්‍රදේශයට පමණක් නොවෙයි, මම දැකලා තිබෙනවා, අගලවත්ත වාගේ දුෂ්කර ප්‍රදේශවලට විශාල විදුලි යෝජනා ක්‍රම ලබා දෙන්න එතුමා පුද්ගලිකවම සම්බන්ධ වෙලා, කටයුතු කරලා ඉතාම දුෂ්කර ගම්මානවලට, විශාල විදුලි යෝජනා ක්‍රම ලබා දෙන්න කටයුතු කරමින් දිස්ත්‍රික්කය පුරාම ජනතාවට සේවය කරපු වැදගත් මන්ත්‍රීවරයෙක් හැටියට මට මේ අවස්ථාවේ හඳුන්වන්න පුළුවන්.

ඒ වාගේම එතුමා බොහොම ලිහිල් ජීවිතයක් ගත කළේ. බොහොම කෙළිලොල් ජීවිතයක් ගත කරපු කෙනෙක්. අවුරුදු පහළොවක් පළාත් සභාවේ හිටියා. ඒ කාලය තුළ කටයුතු කළා වාගේම පළාත් සභාව ජයග්‍රහනය කරන්න පුළුවන්කම තිබෙද්දී ඉදිරිපත් නොවී, එතුමා පළාත් සභාවෙන් ඉවත් වුණා. එතුමාගේ ජීවිතය ගැන කථා කළොත් අවසාන මොහොත වන කොට - වික්‍රම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, විශාල රිය අනතුරකට එතුමා පත් වුණා. ඒ රිය අනතුරට පත් වුණු අවස්ථාවේ එතුමාගේ ඔළුවට විශාල තුවාල සිදු වුණා. ඒ තුළින් එතුමාගේ මානසික තත්ත්වය වෙනස් වන තත්ත්වයට පත් වුණා. ඒ තමයි එතුමාගේ ජීවිතය මේ තරම් ඉක්මණින් අභාවයට පත් වෙන්නත්, ජීවිතය වියවුල් තත්ත්වයකට පත් වෙන්නත් හේතු වුණේ

[ ගරු පී.ඩී. අබේරත්න ]

කියන එක මම මතක් කරන්න කැමැතියි. නැත්නම් ඒ තත්ත්වයට කවදාවත් පත් වන කෙනෙක් නොවෙයි. හොඳ පරිසරයක් තිබුණා. අමාත්‍යවරයකුගේ පුතෙකු වශයෙන් කටයුතු කරලා, මේ පළාත් සභාවට පත් වෙලා, දීර්ඝ ගමනක් යන්න හිටපු සුජිත් කුරේ මැතිතුමාට ඒ ඇති වුණු රිය අනතුර නිසාම විශාල පසුබෑමකට ලක් වුණා. නමුත් ඒ ජීවත් වූ කාලය තුළ අවුරුදු 15 ක පරාසය තුළ පානදුර ආසනයට වාගේම කළුතර දිස්ත්‍රික්කයට එතුමා කරපු සේවය අතිවිශිෂ්ටයි. ඒ වාගේම ආගම් භේදයක් නැහැ. ඒක ඒ පවුලේ කාගේවත් දකින්න තිබුණු දෙයක්. වික්‍රම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මර්වින් ජේ. කුරේ ඇමතිතුමාත් පන්සල්වලට විශාල උපකාර කරමින් බෞද්ධයකු හැටියට තමයි පන්සල්වලදී හැසිරුණේ. හාමුදුරුවොත් එක්ක විශාල සම්බන්ධතාවයක් තිබුණා. ඒ වැඩ පිළිවෙළ ඒ විධියටම ගෙනියලා සුජිත් කුරේ මැතිතුමාත් විහාරස්ථානවලට වාගේම පල්ලියට, පන්සලට වාගේම සෑම ආගමකම, කෝවිල්වලට පවා විදුලි ආලෝකය ලබා දෙමින් විවිධ උදව් කරමින් ආගම් භේදයක් නැතිව කටයුතු කළා. ඒක ලොකු ආශිර්වාදයක්. ඒ වාගේම ආදර්ශයක් හැටියට අපි දකිනවා. මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපිත් අතර දීර්ඝ කාලයක් කටයුතු කරමින්, කළුතර දිස්ත්‍රික්කයට විශාල මෙහෙවරක් කරපු සුජිත් කුරේ මැතිතුමාට එතුමාගේ අදහන ආගම අනුව මෝක්ෂ සුව ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේ අවස්ථාවේදී අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ඒ.එම් යූසුෆ් මහතා] මූලාසනයෙන් ඉවත් වුයෙන් අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. A.M. Yoosuf M.P.C] left the Chair and Hon. Asoka Lankathilaka M.P.C took the Chair*

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම එක පැත්තකින් සන්තෝෂ වෙනවා. අනික් පැත්තෙන් කනගාටු වන මොහොතක්. කළුතර දිස්ත්‍රික්කයේ මාත් එක්කම මේ සභාවට තේරී පත් වූ සුජිත් කුරේ ගරු මන්ත්‍රීතුමා පිළිබඳව, ඔහුගේ අභාවය පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන. මුලින්ම සභා නායකතුමා ඇතුළුව මේ මන්ත්‍රීවරුන්ගේ අදහස් අනුමත කරනවා. සුජිත් කුරේ ගරු මන්ත්‍රීතුමාව මම හඳුනාගත්තේ මර්වින් ජේ. කුරේ ඇමතිතුමා දේශපාලන ක්ෂේත්‍රයේ ඉන්න අවස්ථාවේදී ඔහුගේ ලාබාලම පුත්‍රයෙක් හැටියට. 1988 මාර්තු මාසේ මැතිවරණය අවස්ථාවේදී ඔහුගේ නාම යෝජනා දුන්නාට පස්සේ මර්වින් ජේ. කුරේ ඇමතිතුමා, මර්වින් අයියා කියලා අපි කියන්නේ. නාම යෝජනා අවසන් වුණාට පස්සේ එතුමා පුතාව බේරුවලට ගෙනැල්ලා මට භාර දුන්නා. යූසුෆ් මෙන්න මේ පුතාත් එක්ක මේ ගමන යන්නය කියලා. අපි එදා ඔහුත් එක්ක එම ගමන ගිය නිසා, අපි එකමුතුව වැඩ කරපු නිසා ඔහුටත් මටත් පුළුවන් වුණා, දිගටම වාගේ පළාත් සභාවේ නියෝජනය වෙන්න.

එතුමාගේ පවුල් පසුබිම පිළිබඳව ගරු සභා නායකතුමා කරුණු පැහැදිලි කළා. සුජිත් කුරේ ගරු මන්ත්‍රීතුමා හොඳ තරුණයෙක් හැටියට, ලාබාල වයසේ තරුණයකු හැටියට, අනාගතයක් තිබුණු මන්ත්‍රීවරයෙක් හැටියට මම කියන්න ඕනෑ. ඔහුගේ අනාගතයට අපි යම් යම් අවස්ථාවලදී අවශ්‍ය උපදෙස් දුන්නා. මග පෙන්වීම කළා. නමුත් අවාසනාවකට වාගේ ඔහුට යම් යම් ඉරණම්වලට මුහුණ දෙන්න සිදු වුණා. ඔහුගේ පියාගේ සේවය නිරන්තරයෙන්ම අප සිහිපත් කරන්න ඕනෑ. ඒ සේවය තුළයි ඔහුට අනාගතය සැකසුනේ. විදුලිබල අමාත්‍යවරයා විධියට ඔහු දිස්ත්‍රික්කය පුරාම කටයුතු කළා වාගේම ඒ ප්‍රතිලාභය තමයි සුජිත් කුරේටත් මේ දේශපාලන ගමන් මාර්ගයේ ශක්තිය වුණේ. පැහැදිලි අනාගතයක් තිබෙද්දීත් ඔහු මන්ත්‍රීවරයෙක් හැටියට වාර තුනක් මේ සභාවේ නියෝජනය වෙමින් ඉන්න අවස්ථාවක තමයි එක්තරා දවසක රාත්‍රියේ ඔහු යහළු මිත්‍රයන් සමඟ ඉඳලා එන ගමන් ගල්කිස්ස උසාවිය අසල ඒ පන්සලේ තාප්පයක වැදිලා වාහනය පෙරළිලා ඉතාමත් අසාධ්‍ය තත්ත්වයකට ඔහු පත් වුණේ. ඔහු රෝහලට යන වෙලාවේත් ඔහුගේ මානසික මට්ටම සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා තිබුණා. මම දැකපු අවස්ථාවේ. ඒ මොහොතේ අපි හිතුවේ නැහැ ඔහු ජීවත් වෙයි කියලා. නමුත් වාසනාවකට වාගේ ජීවත් වෙලා ආවත් ඔහුගේ ඒ මතක ශක්තියත්, යම් යම් මට්ටමින් ඔහු තුළ තිබුණු මානසික මට්ටමත් වෙනස් වෙලා තිබුණේ. ඒ නිසා ඔහුගේ අනාගතය පිළිබඳව ඔහුට තීන්දුවක් ගන්න බැරි වුණා. ඔහුගේ පෞද්ගලික ජීවිතයේ පවා ගැටළුවක් මතු වෙන්න හේතු කාරණා වුණා. නමුත් තරුණයෙක් හැටියට, සහෝදරයෙක් හැටියට ඔහුගේ පියා යම් යම් උපදෙස් දුන්නාම, ඒ දේ ගැන පවා මම ඔහුට උපදෙස් දුන්නා. මේ විධියට ජීවත් වෙන්න ඕනෑය කියලා. පවුලේ තිබුණු ගතිපැවැත්ම හැමෝටම බලපාලා තිබුණා. ඒ නිසයි ඔහුගේ ජීවිතය මේ තරම්

ඉක්මනට නැති වෙලා ගියේ. ඒ වාගේම ඔහු වටා ඔහුගේ හිතවත්තු කිහිප දෙනෙක් හිටියා. ඒ අය ඔහුව මේ මාර්ගයට තල්ලු කළේ නැහැ. ඒ අයත් එක්ක හිටියා නම් අද හොඳ තත්ත්වයක ඉන්න තිබුණා. ඔහු ජීවතුන් අතර හොඳ බුද්ධිමත්ව හිටියා නම් ඔහුට පාර්ලිමේන්තුව දක්වා ගමන් කරන්න අවස්ථාවක් තිබුණා. මට මතකයි. එක්තරා අවස්ථාවකදී මේ සභාව නියෝජනය කරපු අපේ අජිත් කබ්රාල් ගරු මන්ත්‍රීතුමාගේ උත්සවයකට ගිය වෙලාවේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමා ඒ උත්සවයට සහභාගී වෙලා සිටියා. එතැනදීත් ඔහු ජනාධිපතිතුමාත් එක්කත් හැසිරුණු විලාශය දිහා බැලුවාම අපට කනගාටුදායක තත්ත්වයක් ඇති වුණා. මානසික මට්ටම ඒ තරම් දුරට දුර්වල වෙලා තිබුණා. ඒ එක්කම ඔහුගේ පවුලේ අනික් අය දිහා බැලුවාමත්, සහෝදරයෝ දිහා බැලුවාමත් ඒ අයගෙත් මානසික මට්ටම ඉතාමත් - ඒ මර්වින් ජේ. කුරේ පවුලට මොන දෙයක් සිද්ධ වුණාද කියන එක අපට ප්‍රශ්නයක්. මර්වින් ජේ. කුරේ මැතිතුමා කාටවත් වචනයක් අහගන්න ඉඩ තිබ්බේ නැහැ. ඔහු දේශපාලන ක්ෂේත්‍රයේ මන්ත්‍රීවරයෙක් හැටියට ධීවර සංස්ථාවේ කටයුතු කරපු කාලයේදීවත්. අල්ලපු ආසනයේ දෙන්නා ළඟ ළඟ ඉන්නේ. අපේ සෞඛ්‍ය ඇමතිතුමා. පෞද්ගලික චරිතය පවා එතුමන්ලා දන්නවා. ඔහුගේ දේශපාලන ජීවිතය පවා ඔහු දන්නවා. කතෝලිකයෙකු වුණත් බෞද්ධයොත් එක්ක තමයි වැඩිපුර ආශ්‍රය තිබුණේ. පන්සල්, පල්ලිත් එක්ක තමයි ආශ්‍රය තිබුණේ. මට මතකයි, අශෝකාරාම විහාරයේ, ඒ වාගේම පින්වත්ත පන්සලේ උත්සවවලට ඔහු තමයි ප්‍රධාන දායකයා. හැමදාම ඒ උත්සව පවත්වනකොට. අශෝකාරාමයේ විශාල පෙරහැරක් අපි කළා. එදා මර්වින් ජේ. කුරේ ඇමතිතුමා තමයි ඒක කර ගහගෙන කළේ. ඉතින් අපට පුළුවන් වුණා, මෙවැනි ගමන් මාර්ගයක් තුළ මේ තරුණයාව හොඳ මගට එදා යොමු කරන්න. ඒත් ඔහුගේ දෛවය එහෙමයි වුණේ. ඔහුගේ දෛවය නිසා ඔහුගේ ජීවිතයේ අවසාන භාගයේ පවා අපි ගිය වෙලාවේ අපට දකින්නට ලැබුණා, ඔහුගේ ජීවිතය විනාශ වෙලා තිබුණු ආකාරය. හේතුව තවමත් අපටවත් හිතා ගන්න බැහැ. ඔහු නිදාගත්තු ඇඳෙන්ම ගිනි ඇවිලිලායි තිබුණේ. ඒක සිදු වුණාද, සිදු කර ගත්තාද කියන එක අදත් අපි හැමෝටම ප්‍රහේලිකාවක් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මේ සභාවේදී අපි කථා කරලා පෙන්නුම් කරන දෙයක් තමයි යමෙක් මේ සභාවේ නියෝජනය වෙලා නැති වුණාට පස්සේ ඔහුගේ හොඳ නරක දෙකම කථා කරන්නේ, වර්තමානයේ ජීවත් වෙලා ඉන්න මන්ත්‍රීවරුන්. ඒ වාගේම වර්තමානයේ ජීවත් වුණු උදවියට ඔහුගේ ජීවිතයේ හොඳ දේවල් ආදර්ශයට ගන්න. නරක දේවල් අත්හරින්නයි කියලා. අවමංගල්‍ය සභාවකට ගමට ගියත් අපි සම්ප්‍රදායක් හැටියට, අපි සංස්කෘතියක් හැටියට විශේෂයෙන්ම බෞද්ධයින්ගේ ඒවායේ කථා පවත්වන්නේ කොහොමද? ඔහු මේ ගමේ හිටපු විදිය. හොඳ චරිතයක් ඇතිව ජීවත් වුණා නම්, හොඳ ආදර්ශයක් දීලා තිබුණා නම් මෙන්න මේ විදියට ජීවත් වෙන්නය කියන එක තමයි අපි මේ ප්‍රකාශ කරන්නේ. මේ කථා කරන්නේ. ඉතින් ඔහුට මේ සභාව තුළ හොඳ පැවැත්මක් තිබුණා. හොඳ විනයගරුක මන්ත්‍රීවරයෙක් හැටියට හිටියා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉන්න කාලයේත් ඔහු එහෙමයි සිටියේ. හරි විනෝදකාමීයි. හැමෝම එක්ක ගිහිල්ලා ඉතාම කුළුපගව, මහ ඇමතිතුමා කියලා නොවෙයි, කථා කරන්නේ සහෝදරයෙක් හැටියට. ඇමතිවරුත් එක්ක. මේ සභාවේ එවැනි තත්ත්වයක් තියාගෙන හොඳ ගමන් මාර්ගයකට පිවිසුණු මන්ත්‍රීවරයෙක්, හිතවතෙක්, සහෝදරයෙක්. මගේ ප්‍රදේශය නියෝජනය වෙන්න හිටපු, කතෝලික ජනතාව නියෝජනය වෙන්න හිටපු ඒ නියෝජිතත්වය පවා අද අපට අහිමි වෙලා තිබෙනවා. මෙන්න මේක දේශපාලනයේ යෙදිලා ඉන්න අපි හිතන්නට ඕනෑ. මේ දේශපාලන ක්‍රියාදාමය තුළ ඉන්න අපි බලන්න ඕනෑ. ඔහු ගැන විතරක් කථා කරලා හරියන්නේ නැහැ. ඔහුගේ ජීවිතය අපි කවුරුත් ආදර්ශයට අරගෙන ගමන් කරනවා නම් මේ 25 වැනි වසර සමරන පළාත් සභාවට ඉදිරි අනාගතයේදී මේ සභාව තුළ - අපි සදාකල් ජීවත් වෙන්න ආවේ නැහැ. අපේ මරණය නියතයි. එහෙම නම් ඒක හිතාගෙන අපි ජීවත් වෙනවා නම් තර්ක විතර්ක කර ගන්න පුළුවන්. වාද විවාද කර ගන්න පුළුවන්. නමුත් අපි මහජන නියෝජිතයෝ කියන හැඟීම විතරක් නොවෙයි, මේ රටේ පුරවැසියකු හැටියට, පියෙකු හැටියට, දරුවකු හැටියට හිතාගෙන කටයුතු කරන්න ඕනෑය කියන එකයි මම විශේෂයෙන්ම මතක් කරන්නේ. එහෙම නම් මර්වින් ජේ. කුරේ ඇමතිතුමාගේ පවුලේ මම හිතන්නේ සුජිත්ට තව සහෝදරයෝ දෙන්නෙක් ඉන්නවා. ඔහුගේ මැණියෝ නැති වුණා. පියා නැති වුණා. මාස කිහිපයක් ඇතුළත. සහෝදරියෙක් හිටියා. එයා නැති වුණා. සියලුම දේ ඉතා ළඟින් ළඟින් සිද්ධ වුණා. ඒ උදවියගේ අභාවය මතක් කරන ගමන්ම සුජිත් කුරේ ඇමතිතුමාගේ පවුලේ උදවියට අපේ පවුලේ ශෝකය ප්‍රකාශ කරමින්, විශේෂයෙන්ම මර්වින් ජේ. කුරේ ඇමතිතුමා කළුතර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි ලංකාවේම මුස්ලිම් ජනතාවත් එක්ක ඉතාම සහෝදරත්වයෙන් කටයුතු කළේ. මාන්න මරක්කල, ඔහුගේ වාසගම එන්නේ. මාන්න මරක්කලගේ මර්වින් ජේ. කුරේ කියලා ඔහු ප්‍රසිද්ධියේම කියනවා. ඔහු මග්ගොන ප්‍රදේශය සම්බන්ධ කර ගෙන, ඒ නෑකම වංශයෙන් හදාගෙන ඔහු කථා කළේ. ඒ වාගේම බෞද්ධ භික්ෂූන් වහන්සේලාත් එක්ක, බෞද්ධ ජනතාවත් එක්ක ඉතාම සමීපව කටයුතු කළා. තමන්ට එහි නියෝජනය වෙන්න පවා ශක්තිය එතුමාට තිබුණා. එහෙම නම් එතුමන්ලාගේ ඒ උදවියට අපේ ශෝකය, කනගාටුව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)

Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අභාවප්‍රාප්ත සුජිත් දේශප්‍රිය කුරේ හිටපු ගරු පළාත් සභා මන්ත්‍රීතුමා අපෙන් සමු අරගෙන ගොස් තිබෙන මේ මොහොතේ ඒ ගෞරවනීය මිත්‍රයා වෙනුවෙන් වචනයක් කථා කරන්න අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමියට මගේ ගෞරවනීය ස්තුතිය ප්‍රථමයෙන්ම පුද කරනවා. අපි හැමෝම කථා කළා වාගේ සුජිත් කුරේ කියන්නේ, ඉතාමත් සුන්දර මනුස්සයෙක්. මම සුන්දරයි කියලා අදහස් කළේ,

දේශපාලන භූමිකාව තුළ බොහෝ දෙනා පිළිබඳව කථා කරන කොට කියවෙන කාරණාව තමයි තමන්ගේ දේශපාලන බලය තහවුරු කර ගන්න, එහෙම නැත්නම් වෙනත් තමන්ගේ ගෞරවය තහවුරු කර ගන්න විවිධ වූ කාරණා මත අනිකා පරයා යන්න සම්ප්‍රදායෙන් තොර කටයුතුවල යෙදෙන පිරිසක් හැටියට තමයි දේශපාලන චරිත හඳුන්වා දෙන්නේ. නමුත් කවුරු කොහොම කිව්වත්, සුජිත් කුරේ කියන්නේ, කවදාවත් තමන්ගේ පක්ෂයේ හෝ විපක්ෂයේ කිසිම කෙනෙකුට අනවශ්‍ය වේදනාකාරී සිදුවීමක් ඇති වන ආකාරයට තමන්ගේ දේශපාලන ක්‍රියාවලිය මෙහෙයවපු නැති දේශපාලඥයෙක් කියලා මම ඉතා පැහැදිලිවම ප්‍රකාශ කරනවා. මේක මම ප්‍රකාශ කරන්නේ පානදුර ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් එදා මෙදා කාලය තුළ කැපවී ක්‍රියාකරපු ක්‍රියාකාරකයෙක් හැටියට සුජිත් කුරේ මන්ත්‍රීවරයා සහ ඔහුගේ

[ ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා ]

පියා ප්‍රතිවිරුද්ධ පක්ෂයේ, එක්සත් ජාතික පක්ෂයේ ආසන සංවිධායකතුමා මර්වින් ජේ. කුරේ මැතිතුමා. සුජිත් කුරේ මන්ත්‍රීතුමා එතුමා පළාත් සභා මන්ත්‍රීවරයා හැටියට කටයුතු කළේ. මේ තාත්තයි පුතයි දෙන්නාම එක කාලයේ පානදුර ආසනයේ දේශපාලන භූමිකාවේ ක්‍රියාත්මක වූ දෙන්නෙක්. තාත්තා ගැනත් මට වචනයක් කියන්න සිද්ධ වෙනවා. මොකද, මේ චරිතය මතු වූ ආකාරය පිළිබඳව කථා කරන කොට මර්වින් ජේ. කුරේ මැතිතුමා මගේ ක්‍රීඩා සමාජයේ සභාපතිවරයා. වාද්දුව ක්‍රීඩා සමාජයේ සභාපතිවරයා හැටියට අපි ඔහුගේ ක්‍රීඩා සමාජයේ සාමාජිකයෝ හැටියට කටයුතු කරපු කාල පරිච්ඡේදයක් තිබුණා. දේශපාලන පක්ෂ දෙකේ හිටියත් මර්වින් අයියා කියලා අපට කථා කරන්නත්, මල්ලී කියලා අපට ආමන්ත්‍රණය කරන්නත් පුළුවන් තත්ත්වයක තමයි අපි එදා ඉඳලා ඒ දේශපාලන ක්‍රියාවලියේ පානදුර ආසනයේ යෙදුණේ. සුජිත් කුරේ කියන ලාබාල පළාත් සභා මන්ත්‍රීවරයා 1988 දී බස්නාහිර පළාත් සභාවේ ප්‍රථම පළාත් සභාවට තේරී පත් වුණාට පස්සේ අපි ඇත්තෙන්ම සුජිත් ගැන හැමෝම දැක්කේ මහා විශාල ලස්සන හුරුබුහුටි කොල්ලෙකුගේ ලක්ෂණ. මම හිතන්නේ රූප ලක්ෂණවලින් ඉතාමත් ඉහළ, හොඳ කාය ලක්ෂණ තිබුණු මහා වාසනාවන්ත කුමාරයෙක් හැටියට තමයි සුජිත් මන්ත්‍රීධූරය අරගෙන පානදුර ආසනයට ආවේ. ඒ කාලේ කා අතරත් මහා දැවැන්ත ජනප්‍රිය භාවයක් තිබුණා. තරුණ පරපුරේ මහා දැවැන්ත ජනප්‍රිය චරිතයක්. එසේ ක්‍රියාත්මක වූ ඔහු මම හිතනවා. අපි යුගයෙන් යුගයට, කාලයෙන් කාලයට, වචනවලින් දවස් ගණනින් කථා නොකළාට මේ අවාසනාවන්ත ඉරණමට පත් වුණේ, හදිසියේ සිද්ධ වූ අනතුර තුළින්. ඒ අනතුරෙන් පස්සේ තමයි ඔහුගේ ජීවිතය මහා අවාසනාවන්ත දිසාවකට ගමන් කරන්න පටන් ගත්තේ.

අවසාන වශයෙන් මම ඉතාමත් අභියෝගාත්මකව කියනවා. ඒ අවාසනාවන්ත කාලයේ සුජිත්ට හිටපු හොඳම යාලුවා ජගත් අංගගේ කියලා. මම ඔහුගේ නිවසේ ඔහු වෙනුවෙන් සති දෙකක් රැඳී සිටියා. රත්මලානේ. මේක අද රහසක් හැටියට - දේශපාලන වශයෙන් නොවෙයි. මගේ ආදරණීය මිත්‍රයෙක් හැටියට මම ඇසුරු කරපු නිසා. ඔහු මගේ නිවසේත් සමහර දවස්වලට ඇවිල්ලා රාත්‍රී කාලය ගත කළා. අසනීප තත්ත්වයෙන් ඉඳිද්දී. මම සමහර දවස්වල ගෙදර එක්කගෙන යනවා. ගිහිල්ලා ගෙදරට භාර දීලා යනවා. රාත්‍රියේ ආපහු මට කථා කරලා කියනවා, ජගත් අයියා මට ඉන්න බැහැ. මම එළියට එනවා කියලා. ආපහු මගට ගිහිල්ලා එක්කගෙන එනවා. එක්කගෙන ඇවිල්ලා තියාගෙන හිටියා මගේ නිවසේ. මම ඔහුට රැකවරණය දුන්නා. අවශ්‍ය හැම දේකටම මම උදව් වුණා. සමහර දවස්වල පල්ලියට ගිහිල්ලා රෑ යාතිකාවට සම්බන්ධ වෙලා ඔහු එළියට එනකල් මම වාහනය නවත්වාගෙන පැය, හමාර ඉන්නවා පාරේ. මම ඒ තරමට ඔහුව ආරක්ෂා කළා. මගේ ප්‍රතිවිරුද්ධ පක්ෂයේ වුණත්. නමුත් මට සුජිත් කුරේ කියන චරිතයත් එක්ක ජීවිතයේ මන්ත්‍රීවරයකුගේ යථාර්ථවත් ජීවිතය පිළිබඳව හිතන්න බොහෝ කරුණු කාරණා තිබෙනවා. මේ සියලු දේ කළත්, මරණ මංචකයේ හෝ අවසාන කාලයේ අසරණභාවයට පත් වුණාම ඒ සමාජ සේවකයාට කවුද මේ සමාජයේ ඉතිරි වෙන්නේ කියන ප්‍රශ්නය ඇහුවා නම් සුජිත්ගෙන්ම හරියට අහගන්න තිබුණා. අද මේ කථාව කියන්න සුජිත් ජීවතුන් අතර නැහැ. නමුත් එච්චර කාර්යක්ෂම, එච්චර හුරුබුහුටි, ඉතාමත් ආකර්ශනීය මනුෂ්‍යයෙක් එක මොහොතකදී වුණු රිය අනතුරකින් අපහසුතාවට පත් වෙලා ජීවිතය වෙනත් දිශාවකට ගමන් කළාට පස්සේ ක්‍රමානුකූලව ඔහු වටා පිටාවේ බොහෝ දෙනාට රැඳී සිටින්න තිබුණු අවකාශය නැතිව ගියා. අවසාන දවසේත් ජීවිතය නැති වෙන දවසෙත් ඔහු තනිව තමයි ජීවිතය නැති වෙන මොහොතට පවා මුහුණ දුන්නේ. තමන්ගේ නිවසේ කවුරුත් හිටියේ නැහැ. අම්මා තාත්ත ජීවිතක්ෂයට පත් වුණාට පසුව සහෝදරයෝ විදේශ රටවල්වල රැකියාවලට ගිහිල්ලා තමන්ගේ ආදරණීය බිරිඳ නයනා ඒ වෙන කොට මේ සම්බන්ධයෙන් ඈත් වෙලා හිටියේ. දරුවා වෙන තැනක හිටියේ. ගෙදරක තනි වුණු සුජිත් ජීවිතයේ අවසාන මොහොතට මුහුණ දුන්නේත් තනියෙන්. මේ තමයි ජීවිතයක සාමාන්‍ය ස්වභාවය. ඕක සුජිත්ට විතරක් වුණු පෞද්ගලික ධර්මතාවයක් නොවෙයි. අතපය හයිය හත්තිය තියෙන කාලයේ, බලය තියෙන කාලයේ කවදාක්වත් මේක අහිමි වෙන්නේ නැහැ. මේ තුළ අපට සදාකාලිකව ජීවත් වෙන්න පුළුවන් කියලා අභිමානයෙන් හිතා ගෙන ඉන්න හැම මන්ත්‍රීවරයෙකුටම හැම මනුෂ්‍යයෙකුටම සුජිත්ගේ ඉරණම සාධාරණයි කියන එකයි මගේ අදහස.

ඒ නිසා අපි කවුරුත් හිතන්න ඕනෑ කාරණාවක්. අපට පුළුවන් කාලයේ අපට ශක්තිය තියෙන කාලයේ - මම මේ අවස්ථාවේදී මෙය පාදක කර ගෙන මේ කාරණාව ඉදිරිපත් කළාට මම හිතනවා, අමනාප වෙන එකක් නැහැයි කියලා. කෙනෙකුට තමන්ගේ සේවා කාලය අවුරුදු විස්සක් - සුජිත් සේවා කාලයෙන් අවුරුදු පහළොවක් මේ කටයුත්තට යොමු කළා. මේ රටේ අවුරුදු දහයක් සේවය කළාම කෙනෙකුට විශ්‍රාම වැටුපක් ගෙවනවා. කම්කරුවාටත් ගෙවනවා. නමුත් සුජිත් කුරේ මන්ත්‍රීතුමාගේ ජීවිතයේ අවසාන කාලයේ ඔහුට විශ්‍රාම වැටුපක් හෝ කිසිම දෙයක් තිබුණේ නැහැ. ඔහුට කවුරුහරි උදව්වක්

නොකළා නම් අතේ ලොකු ආර්ථික ශක්තියක් තිබුණේත් නැහැ. මේකයි යථාර්ථය. මේ පිළිබඳව අපි කථා කරන්න අවශ්‍යයි. මට දැන් ප්‍රේමරත්න ගුණසේකර අපේ ගරු හිටපු සෞඛ්‍ය ඇමතිතුමා මුණ ගැසුනා මොහොතකට ඉස්සෙල්ලා, ප්‍රධාන අමාත්‍යතුමා මුන ගැහෙන්න ඇවිල්ලා. ඔහු කිව්වා කථාවක්. මගේ පරණ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් මට මුණ ගැහුණා, ඊයේ පෙරේදා පාරේ යන කොට පේමන්ට් එකේදි. මම ඇහුවා කොහේද යන්නේ? කියලා. කථා කරලා කිව්වා, අනේ, මොනවා කරන්නද මචං මගේ යාළුවෝ සේරම දැන් නැහැ. මගේ බිරින්දෑ නැති වෙලා ගියා. මගේ දරුවෝ ටික ඉන්නේ පිටරටවල්වල. යමතම් පාර්ලිමේන්තුවෙන් හම්බ වෙන පැන්ෂන් එක නිසා මම ජීවත් වෙනවා කියලා. ඒ ඇමතිවරයා ඔහුට කියලා තියෙනවා, මේ බහුතරයක් ජීවිතවල හැටි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමහරක් අයට මේක ලොකු පාරාදීසයක්. හැමෝම මේ ගොඩට දාලා මම කථා කරන්නේ නැහැ. සමහරක් අයට තවත් ආත්ම ගණනක් ජීවත් වෙන්න පුළුවන් පරිසරය සකස් කර ගෙන තියෙනවා. නමුත් මේ රටේ අවංකව දේශපාලනය කරලා මුදලට ගැති නොවුණු සාධාරණ යුක්ති සහගත දේශපාලනඥයන්ගේ ජීවිතයේ ඉරණම බොහෝ විට මේ ආකාරයයි. ඒකයි මහා ඛේදවාචකය. මේක සුජිත් කුරේගේ නාමයෙන් කියලා කියන්නේ නැහැ. නමුත් සමස්ථ ලෝකයේ මෙවැනි යුක්ති සහගත මිනිස්සුන්ගේ නාමයෙන් සුජිත්ටත් ඒ වාගේ ඉරණමක අවාසනාවන්ත පරිච්ඡේදයක් තිබුණාය කියන එක මට සිහිපත් කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා අපි කවුරුත් බලාපොරොත්තු වුණේ - අපේ මේ සභාවේ සිටින ප්‍රධාන අමාත්‍යතුමා. මම හිතනවා, එතුමා බොහොම ආදරය කරපු චරිතයක් සුජිත් කුරේ කියන්නේ. එතුමාත් දැන් මේ මොහොතකට ඉස්සෙල්ලා කථා කළේ. කොහේ විදේශ චාරිකාවක් ගියත්, මේ ඇතුලේදී හමු වුණත්, කොහේ හරි තැනකට තේ එකක් බොන්න ගියත් විහිළුවක් කියලා අනෙක් අයත් එක්ක කථා කරලා යුක්තිය සාධාරණය ගැන කථාබහ කරලා, බොහොම ලිහිල් විධියට තමන්ගේ චරිතය හදා ගත්තා මිස තදබල ස්වරූපයක්, චරිතයක් එතුමා තුළ තිබුණේ නැහැ. ඔහු දේශපාලනය කරන මේ රටේ ඉහළ ප්‍රභූවරුන් ඇසුරට පත් වුණේ ඉතාමත් ලාබාල අවධියේ ඉඳලා. ඔහුගේ පරිසරය ඉතාමත් විවෘත පරිසරයක්. කා එක්කවත් කථා කරන්න කිසි වකිතයක් තිබුණේ නැහැ. ඔබතුමා කිව්වා වාගේ අජිත් කබ්රාල් මැතිතුමාගේ පොත එළිදක්වන දවසේ ඒකට මහින්ද රාජපක්ෂ මැතිතුමා ආපු වෙලාවේ කතා කළේ බොහොම සැහැල්ලුවෙන්. එතුමාට මේ චරිතය පිළිබඳ විශාල ගැඹුරක් තිබුණා නොවෙයි. සැහැල්ලුවෙන් කථා කළේ. ඒක අගෞරවයක් කරනවා නොවෙයි. ඒ එයා පුරුදු වෙලා තිබුණු විධිය. ඉතින් ඒ නිසා අපි කාටත්, ජීවතුන් අතර සිටින සියලු දේශපාලනඥයින්ට සුජිත් කුරේ චරිතය ආරම්භයේ සිට අවසානය දක්වා මෙනෙහි කළොත් හිතෙයි අපිත් පරිස්සමින් ජීවත් වීම අත්‍යාවශ්‍ය කාරණාවක් හැටියට. මම වැඩිදුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මගේ සදාදරණීය මිත්‍රයා. ඔහු වෙනත් දේශපාලන මතයක් දැරුවත් මාත් එක්ක ඉතාමත් කුළුපගව ජීවිතයේ අවසාන කාලපරිච්ඡේදය වෙන කල් මාත් එක්ක ඇසුරු කළා. සුජිත්, මා දැනුවත්ව ඔබ කාටවත් අපරාධයක්, වැරැද්දක් කළේ නැහැයි කියලා මා විශ්වාස කරනවා. ලබන්නා වූ ජීවිතය මෝක්ෂ සුවය ලබමින් ඉතාමත් වාසනාවන්ත තත්ත්වයකට පත් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ස්තුතියි අමාත්‍යතුමනි, මම හිතන්නේ මීට වැඩි කථාවන් මේ අවස්ථාවේදී කෙරෙන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම සුජීත් කුරේ මැතිතුමාව මාත් හඳුනාගත්තේ 1999 මේ පළාත් සභාවට පත් වුණු වෙලාවේ. ඔහුත් සමග හොඳ ලාබාල මන්ත්‍රීවරු කිහිප දෙනෙක් මේ සභාවේ විපක්ෂයේ වාඩි ගෙන හිටියා. හැබැයි, ඔවුන් දකින කොට මට කවදාක්වත් හිතුනේ නැහැ, මේ විපක්ෂයේ මන්ත්‍රීවරු කියලා. ඔහු ඒ තරමට මට බොහොම ලෙන්ගතුයි. අසෝක අක්කා කියලා ඉතාම ගෞරවයෙන් කථා කළේ. ඒ වාගේම ඔහු ටිකක් කලබල වෙන අවස්ථාවලදී මම කථා කරලා කරුණු කියලා සමහර වෙලාවට සංසිඳුවා ගත්ත තැන් තිබුණා. ඒ තරම් වැඩිහිටියන්ට ගෞරවය දක්වපු පිරිසක්. සුජිත් මන්ත්‍රීතුමාත් එහෙමයි. ඒක නිසා අප අතර ලොකු බැඳීමක් තිබුණා. මට මගේ මල්ලිලා කියලා කියන්න බැහැ. දරුවෝ වාගේ තමයි. සුජිත් ඇතුළු සමරනායක ඒ වාගේ කිහිප දෙනෙක් හිටියා. ඒ වාගේම ඒ අය දේශපාලනය කියන එක බොහොම අර්ථාන්විතව කරපු අය. කවදාක්වත් රැඩිකල් විධියට වැඩ කළේ නැහැ. මේ සභාව නියෝජනය කරද්දී බොහොම හිතලා, මතලා මධ්‍යස්ථ ස්වරූපයෙන් වැඩ කළා. මම හිතන්නේ, තරුණයෝ හැටියට ඒ අය පිළිබඳව සතුටින් කථා කරන්න පුළුවන්. ඒ අයගේ ගතිගුණ. ඒ වාගේම මේ පළාත් සභාව තුළ අයුක්තිය වෙනුවෙන් නැගී හිටින්න, සාධාරණය වෙනුවෙන් පෙනී හිටින්න සුජිත් මන්ත්‍රීතුමා හැමවිටම උත්සාහ ගත්තා. ඒ වාගේ තරුණයෝ මේ වාගේ අතරමගදී නැති වී යාම අපට පාඩුවක්. ඇත්ත වශයෙන්ම ඔහු නැති පළාත් සභාවට ආපුවාම මට ඇත්ත වශයෙන්ම කනගාටු හිතුනා. වෙනදාට ඒ අය දොඩමළු වෙන හැටි. අපිත් එක්ක කථා කරන හැටි. විහිළුවෙන් තහළුවෙන් මේ ප්‍රශ්න වලට මුහුණ දෙන හැටි මට යම් යම් අවස්ථාවලදී මැවී පෙනුණා.

ඒ වාගේම ඔහු රිය අනතුරකින් තුවාල ලැබුවාය කියන ආරංචිය අපට දැනගන්න ලැබුණේ හුඟාක් පස්සේ. ඒ නිසා ඔහුගේ කල්පනා ශක්තිය ද වෙනසක් වූ බව අපට දැනගන්න ලැබුණා. මේ වාගේ අවස්ථාවක මට එතුමා එක දවසක් අතරමගදි මුණ ගැහුනා. ඔහු ඒ වෙලාවේ කොට කලිසමක් ඇඳලා බොහොම සැහැල්ලුවෙන් හිටියේ. ඒත් අශෝකා අක්කා කියා ගෙන මගේ ළඟට දුවගෙන ආවා. ඇවිල්ලා කථා කළා. මම කිව්වා, ඔයා නැති පාළුව අපට දැනෙනවා කියලා. ඉතින් හිනා වෙලා බොහොම ගෞරවයෙන් ඔහු සමු අරගෙන ගියා. අපි කවදාක්වත් බලාපොරොත්තු වුණේ නැහැ, සුජිත් වාගේ මන්ත්‍රීවරයෙකුට

මේ වාගේ කනගාටුදායක මරණයක් ඇති වෙයි කියලා. ජගත් අංගගේ මැතිතුමා කථා කරපු ඒ කථාවෙන් අපට හිතාගන්න බොහෝ දේවල් තියෙනවා. මම හිතන්නේ අපි හැම කෙනෙක්ම හිතන්න ඕනැ. තනතුරු තියෙන කල්, බලය තියෙන කල් කවුරු සැලකුවත්, සමහර අවස්ථාවලදී ඒවා නැතිවුණු වෙලාවට ඒ සැලකිලි සම්මාන නොලැබෙන්න පුළුවන්. සමහර විට ගුණගරුක මිනිස්සු අපි කරපු සේවය සිහිපත් කරයි. එහෙම නැත්නම් ඒ වාගේ සතුටු වෙන්න අවස්ථාවන් නැති වෙන්න පුළුවන්. නමුත් අවංකව අපේ හිතට එකඟව අපි ජීවත් වුණොත්, සේවය කළොත් කවුරු ඒක අගය නොකළත්, කළත් අපට සතුටු වෙන්න පුළුවන්. ඒ නිසා මම හිතන්නේ, සුජිත්ගේ ජීවිතයෙන් හෝ අපත් එක්ක ඉඳලා අපෙන් සදහටම වෙන් වෙලා ගිය හැම කෙනෙක්ගේම ජීවිතවලින් අපට උකහා ගන්න තියෙන්නේ ඒක. අපි නිවැරදිව වැඩ කළ යුතුයි. ජනතා ප්‍රශ්න හඳුනා ගෙන වැඩ

[ ගරු අශෝකා ලංකාතිලක ]

කළ යුතුයි. ඒ වාගේම අපි අපේ ජීවිත කාලය තුළ අපට කරන්න පුළුවන් උපරිම සේවාව අපි කළ යුතුයි. මම දීර්ඝව කථා කරන්නේ නැහැ. ඇත්තෙන්ම මම හුඟාක් කනගාටු වෙනවා, සුජිත් මන්ත්‍රීතුමා මේ ආකාරයෙන් අපෙන් වෙන්වීම පිළිබඳව. මම ඔහුට මෝක්ෂ සැප ප්‍රාර්ථනා කරමින් මේ ශෝක යෝජනාවට සියලු දෙනාම කථා කළා. මේකේ තිල වාර්තාවත් එක්ක ඒ අයගේ පවුලේ අයට ශෝකය ප්‍රකාශ කරලා යවන්න කියලා මම ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අනික් ශෝක යෝජනාව ගැනීමට ප්‍රථමයෙන් මම වරප්‍රසාද ප්‍රශ්නයක් ගේනවා. මන්ත්‍රීවරුන්ගේ වාහන ටයර් ණය මුදල නවතා ඇති බව අපට දැනගන්නට ලැබිලා තියෙනවා. ඒක මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක්. තව මාස එකොළහක් තියෙනවා මන්ත්‍රීවරුන්ගේ කාලපරිච්ඡේදය හමාර වෙන්න. එම නිසා මම ඉල්ලීමක් කරනවා වාරික මුදල් ප්‍රමාණය වැඩි කරලා හරි ඒ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදය ලබා දෙන්න. අපේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා සභා ලේකම් කාර්යාලයට ගිය වෙලාවේදී කියලා තියෙනවා දැන් වාහනේට ටයර් ණය මුදල දෙන්න බැහැ. පළාත් සභාව විසුරුවන්න තියෙන්නේ කියලා. ඒක මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක්. එම නිසා ඒක අහිමි කරන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මෙයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න වෙනවා. ඉදිරිපත් කරලා සාකච්ඡා කරලා ඒ වාරික ප්‍රමාණය වැඩියෙන් කපා ගන්න තීරණය කරලා හෝ ලබා දෙන්න පුළුවන්ද කියන එක සොයා බලන්න කියලා ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පෙරත් මේ සභාවලදී ලැබිලා තියෙනවා. තවත් කාලයක් යනවා. තව මාසයක් යනවා. තව ප්‍රමාණය වැඩි වෙනවා. සභා කටයුතු කාරක සභාව තව සුළු වේලාවකින් තියනවා. ඒ වාර්තාව සම්මත වෙන්නේ අනෙක් සභාවේදී. ඒ නිසා දැන්ම –

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ ඉල්ලීම පිළිබඳව යමක් කරන්න කියලා මම ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා. සභා කටයුතු කාරක සභාවට මෙය යොමු කරනවා. මීළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වෙනවා.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය [අශෝකා ලංකාතිලක මෙනෙවිය] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා [රංජිත් සෝමවංශ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Miss Asoka Lankathilaka] left the Chair and Hon. Deputy Chairman [Mr. Ranjith Somawansa] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අද දවසේ මීළඟට බස්නාහිර පළාත් සභාවේ හිටපු ගරු පළාත් සභා මන්ත්‍රිනී ජී.ඩී. සිරිමතී මැතිණියගේ අභාවය වෙනුවෙන් නියමිත ශෝක ප්‍රකාශ යෝජනාව සභාව හමුවේ ඉදිරිපත් කිරීමේ අවස්ථාව. ගරු සභානායකතුමාට මම ආරාධනා කර සිටිනවා, එම ශෝක යෝජනාව ඉදිරිපත් කරන ලෙසට.

# ශෝක ප්‍රකාශ යෝජනාව II : ගරු ජී.ඩී. සිරිමතී මැතිනිය

## MOTION EXPRESSING CONDOLENCES II : HON. G.D. SIRIMATHI, MEMBER

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*බස්නාහිර පළාතේ පළාත් සභාවේ තෙවන පළාත් සභාවට පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් කළුතර පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ගරු මන්ත්‍රීවරියක වශයෙන් තේරී පත්ව වසර දෙකක පමණ කාලයක් බස්නාහිර පළාතේ පළාත් සභාවට හා බස්නාහිර පළාතේ ජනතාවට ඉමහත් සේවාවක් ඉටු කරන ලද, හිටපු*

*ගරු පළාත් සභා මන්ත්‍රිනී ජී.ඩී. සිරිමතී මැතිනිය නොබෝදා අභාවප්‍රාප්ත විය.*

*බස්නාහිර පළාතේ පළාත් සභාව, එතුමියගෙන් ඉටු වූ සේවය අගය කරන අතර, එතුමියගේ වියෝව පිළිබඳව ස්වකීය සාතිශය සංවේගය පළ කර සිටියි."*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජී.ඩී. සිරිමතී මන්ත්‍රීතුමිය මේ පළාත් සභාවේ වසර දෙකක පමණ කාලයක් තමන්ගේ සේවය පළාතට ඉටු කළ ගරු මන්ත්‍රීතුමියක්. 1949 ඔක්තෝබර් මාසයේ 26 වැනිදා හොරණ ප්‍රදේශයේ ජී.ඩී. සිරිල් මහතාගේ සහ එම මැතිණියගේ ආදරණීය දියණියක වශයෙන් ජන්ම ලාභය ලබලා සහෝදර සහෝදරියන් සිව් දෙනෙකුගේ පවුලක කෙනෙක් හැටියට, හොරණ තක්ෂිලා විද්‍යාලයෙන් තමන්ගේ අධ්‍යාපනය නිම කරපු සිරිමතී මැතිණිය පසුව පෞද්ගලික ආයතනයක තමන්ගේ රැකියාව කරලා - ඒ පෞද්ගලික ආයතනයේත් එතුමිය කළේ ගිණුම් ලිපිකාරිනියක් හැටියට කටයතු කිරිමයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේලා අපි කවුරුත් දන්නා කාරණාවක් සිරිමතී මහත්මියගේ පළාත් සභා මන්ත්‍රී ධූරය පිළිබඳව කථා කරන කොට අපට නිරන්තරයෙන්ම මතකයට නැගෙන්නේ, අභාවප්‍රාප්ත වූ එතුමියගේ ආදරණීය සැමියා මේ පළාත් සභාවේ අවුරුදු පහළොවක පමණ කාලයක් තමන්ගේ දායකත්වය ලබා දීපු ඩබ්ලිව්.කේ. විජේසිරි ගරු මන්ත්‍රීතුමා පිළිබඳවයි. සිරිමතී මැතිනිය වාසනාව ලබනවා, අපේ විජේසිරි මන්ත්‍රීතුමා සමග විවාහ දිවියට පත් වෙන්න. ඒ විවාහ දිවියට පත්වීමත් සමග දියණියන් දෙදෙනෙකුගේ ආදරණීය මවක් හැටියටත්, විශේෂයෙන්ම ඩබ්ලිව්.කේ. විජේසිරි මන්ත්‍රීතුමා හොරණ ජනතාවට තමන්ගේ සේවය ඉටු කරමින් සිටින විට ඒ සේවයට වඩාත් වැඩි පහසුකමක් සලසා දෙන්න කටයුතු කරන්නේ සිරිමතී මහත්මිය. හොරණ ප්‍රදේශයේ තමන්ගේ දේශපාලන කටයුතු ආරම්භ කළ ඩබ්ලිව්.කේ. විජේසිරි මන්ත්‍රීතුමාට තමන්ගේ කටයුතු කරගන්න ලොකු ශක්තියක් වෙන්නේ, මේ සිරිමතී මන්ත්‍රීතුමිය. අපි දන්නවා. ඩබ්ලිව්.කේ. විජේසිරි මන්ත්‍රීතුමා පළාත් සභාව නියෝජනය කළා. එතුමාගේ අභාවයත් සමග එවකට පැවතුණු පරිපාලන ක්‍රමයක් එක්ක අවස්ථාව ලැබෙනවා ජී.ඩී. සිරිමතී මැතිණියට මේ පළාත් සභාවට තේරී පත් වෙන්න. ඒ අනුව බස්නාහිර පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරියක් හැටියට සිරිමතී මන්ත්‍රීතුමිය තේරී පත් වෙනවා. ඒ පත් වෙලා තමන්ගේ ස්වාමිපුරුෂයා කළා වූ ඒ උදාර සේවය හොරණ ජනතාවට කරන්න එතුමියට අවස්ථාව ලැබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ පළාත් සභා මන්ත්‍රීවරියක් හැටියට තමන්ගේ ඒ ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් තමන්ගේ ස්වාමිපුරුෂයාගෙන් වූ ඒ සේවය, ඒ ප්‍රදේශයේ ජනතාවට වුණු ජනතා සේවය වඩාත් හොඳින් කරන්න සිරිමතී මන්ත්‍රීතුමියට ඒ සමග අවස්ථාව ලැබෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සිරිමතී මන්ත්‍රීතුමිය වාසනාව ලබනවා තමන්ගේ ස්වාමිපුරුෂයා ඒ ප්‍රදේශයේ ජනතාවට කරපු සේවය - අපි දන්නවා. ඩබ්ලිව්.කේ. විජේසිරි මන්ත්‍රීතුමා පාසල් පද්ධතියත් එක්කම සම්බන්ධ වෙලා හිටිය මන්ත්‍රීවරයෙක්. ඩබ්ලිව්.කේ. විජේසිරි මන්ත්‍රීතුමා ඒ කාලයේ විදුලිබල කටයුතුවලට, මාර්ග සංවර්ධන කටයුතුවලට, ඒ වාගේම එවකට පැවති දේශපාලන වාතාවරණයත් එක්ක දිවංගත විජය කුමාරතුංග මැතිතුමා ළඟම හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මැතිණියත් එක්ක ඒ ප්‍රදේශයේ ප්‍රධාන පෙළේ දේශපාලනය කරපු කෙනෙක්. ඒ කාලයේ එතුමා කරපු සේවය එතුමාගේ හදිසි අභාවයත් එක්ක නැතිවුණාම ඒ අඩුව පුරවන්න තමයි සිරිමතී මන්ත්‍රීතුමිය පළාත් සභාවට පිවිසෙන්නේ. අපි විශ්වාස කළ විධියටම සිරිමතී මන්ත්‍රීතුමිය පළාත් සභාව තුළ තමන්ගේ ස්වාමි පුරුෂයාගෙන් සිදු වූ යුතුකම් කොටස ඉටු කරන්න බොහෝ වෙහෙසක් දැරුවයි කියන එක මේ සභාවේදී මම ඉතා ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. මන්ත්‍රීවරියක් හැටියට ඉතාම නිරහංකාරව, කවදාක්වත් අනුන්ගේ දෙයක් හොයන්නේ නැතුව, තමන්ගේ පාඩුවේ තමන්ගේ දූවාදරුවොත් එක්ක ඒ යුතුකම ඉටු කළයි කියන එක මම මේ වෙලාවේ ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ. මම විශේෂයෙන්ම මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත විය යුතු තවත් මතක් කළ යුතු කාරණාවක් තියෙනවා. ඒ තමයි විජේසිරි මන්ත්‍රීතුමා අසනීප වුණු වෙලාවේ එතුමා මිය යන තෙක්ම එතුමිය මේ මන්ත්‍රී ධූරය දරමින්ම තමන්ගේ ස්වාමි පුරුෂයා රැක බලා ගන්න දැඩි වෙහෙසක් දරපු මන්ත්‍රීවරියක් කියන එක මම මේ වෙලාවේ එතුමියට ගෞරවයක් හැටියට මතක් කරනවා. ඒ නිසා තමන්ගේ පවුල් ජීවිතය තුළින් ඉතා සාර්ථක ජීවිතයක් එතුමිය ගත කළා. තමන්ගේ දරුවෝ උස් මහත් කරලා, මේ පළාත් සභාවේම තැන් තැන්වලට යොමු කරලා ඒ අය අද මේ පළාත් සේවයට එක් කරන්න එතුමිය කටයුතු කළා. ඉන් පසුව එතුමිය, මන්ත්‍රීවරියක් හැටියට තමන්ගේ ස්වාමි පුරුෂයාගෙන් සිදු වූ යුතුකම් කොටස ඉටු කරන්න ඉදිරිපත් වෙලා ඒ කොටස ඉතා හොඳින් ඉටු කළා කියන එක මේ වෙලාවේ ගෞරවයෙන් මතක් කරනවා.

ඒ නිසා පළාත් සභාවට තමන්ගේ කෙටි කාලය තුළ සැබෑ ලෙස සේවය කළ ගරු මන්ත්‍රීවරියක් කියන එක මේ වෙලාවේ ගෞරවයෙන් මතක් කරමින් අපි විශ්වාස කරනවා, ඒ පවුලේ උදවිය කළුතර දිස්ත්‍රික්කයේත්, හොරණ ප්‍රදේශයේත්, කාගේත් ආදරය ගෞරවය දිනා ගත්ත අය කියලා. ඒ නිසා එතුමිය ඒ කළා වූ සමාජ මෙහෙවර තුළින් ඒ වාගේම ඒ පවුලේ උදවිය මේ සමාජයට කළා වූ සමාජ මෙහෙවර තුළින් අපේ සමාජය යහමගට ගේන්න යම් දායකත්වයක් ශක්තියක් ලැබුණා කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා මේ අවස්ථාවේ යළිත් බස්නාහිර පළාත් සභාවේ සිරිමතී ගරු මන්ත්‍රීතුමියගේ අභාවය පිළිබඳව සංවේගය පුද කරමින් ඒ පවුලේ සියලු දෙනා වෙත පුද කරමින් සිරිමතී මන්ත්‍රීතුමියට බෞද්ධයන් හැටියට මේ සසර අවසානයේ අපි කවුරුත් ප්‍රාර්ථනය කරන ශාන්ත අමා මහ නිර්වාණ සම්පත්තිය ලැබේවා කියා කියමින් මා නිහඬ වෙනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම පළාත් සභාවට කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රදේශයෙන් තුන්වැනි පළාත් සභාවට පත් වෙලා අවුරුදු දෙකක පමණ කාලයක් බස්නාහිර පළාත් සභාවට සේවය කළ සිරිමතී මැතිනිය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේ හිතවතෙක් හැටියට, අපිත් එක්ක සිටි මන්ත්‍රීවරියක් හැටියට, ප්‍රදේශයේ සිටි සමාජ සේවිකාවක් හැටියට ගුණකථනයක් කරන්නයි බලාපොරොත්තු වෙන්නේ. එතුමිය ජීවිත කාලය තුළ හොඳ ආදර්ශවත් ජීවිතයක් ගත කළයි කියන එක මම විශේෂයෙන් මතක් කරන්න කැමතියි. එතුමිය පළාත් සභාවට ඇවිල්ලා පළාත් සභාව තුළින් සමාජ සේවය කළා වාගේම, එතුමිය තමන්ගේ ස්වාමි පුරුෂයාට සලකපු ආකාරය අති විශිෂ්ට ගණයේ තත්ත්වයක් කියලා මම මතක් කරනවා. විජේසිරි මැතිතුමා රෝගාතුර වුණු අවස්ථාවේ, එතුමා අංශභාග රෝගයෙන් පෙළුනේ. එතුමා එක්තැන් වෙලා හිටියේ. කථා කරන්නෙත් අපහසුතාවයෙන්. බොහොම අමාරුවෙන්. ඇත්ත වශයෙන්ම එතුමිය ඇතුළු ඒ දරු පිරිස ගත්ත උත්සාහයේ ප්‍රතිඵලයක් නැත්නම් මෙපමණ කාලයක් විජේසිරි ගරු මන්ත්‍රීතුමාට ජීවත් වෙන්න බැහැ. මම දන්නා හැටියට අවුරුදු 10 කට වැඩි කාලයක් රෝගාතුර වුණාට පසුව එතුමා

[ ගරු පී.ඩී. අබේරත්න ]

ජීවත් වුණා. ඒ කාලය තුළ එතුමිය තමන්ගේ ස්වාමි පුරුෂයා බලාගත්ත ආකාරය අතිප්‍රශංසනීයයි. බොහාම සැලකිල්ලෙන් හොඳින් බලා ගෙන, අද සමාජයේ සමහර අවස්ථාවල කෙනෙක් දුබල වුණාම පවුලේ අය සලකන්නේ නැති යුගයක අනෙක් අයට ආදර්ශයක් වන විධියට ඉතාම හොඳින් බලා ගත්තා. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා. විජේසිරි මැතිතුමා පළාත් සභාවට එන්න ඉස්සෙල්ලා එතුමා ආදායම් බදු උපදේශකවරයෙක් වශයෙන් වැඩ කළා. ඒ අවස්ථාවේ එතුමාගේ වැඩ පිළිවෙළට එතුමිය විශාල අත් උදව්වක් දුන්නා. ඒ වාගේම පළාත් සභාවට ආපු වෙලාවේ එතුමාගේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ලොකු උනන්දුවක් දුන්නා.

අපි දන්නවා. විජේසිරි මැතිතුමා අධ්‍යාපන ක්ෂේත්‍රයට වැඩ කළා වාගේම, විශේෂයෙන් ළදරු අධ්‍යාපනය නගා සිටුවීම සඳහා ලොකු උත්සාහයක් උනන්දුවක් ගත්ත මන්ත්‍රීවරයෙක්. අපේ ප්‍රදේශයේ සියලුම ළදරු පාසල් පුනරුත්ථාපනය කරන්න, පාලිකාවරුන්ව දැනුවත් කරන්න උපදේශක පන්ති තියලා, අලුත් තාක්ෂණය අනුව ඒවා සම්බන්ධ කරන්න ඒ මුල් අවධියේ ගත්ත උත්සාහය අපට අමතක කරන්න බැහැ. ඒ මන්ත්‍රීතුමා සිටියදී ඒ වාගේ විශාල සේවයක් කළා. ඒ වැඩ පිළිවෙළ ඒ අවුරුදු දෙක තුළ සිරිමතී මැතිණියත් නොකඩවා ගෙන ගියා. ඒ ළදරු පාසල්වලට විශාල උපකාරයක් එතුමිය කළයි කියලා මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමතියි. ඒ වාගේම ගමේ ඇවිදලා ප්‍රදේශය වෙනුවෙන් තමන්ගේ පාක්ෂිකයන් ගැන, අසරණ අය ගැන හොයලා බලලා එතුමියගේ ස්වාමි පුරුෂයාගෙන් ලබා ගෙන වැඩ කරන පුරුද්දක් එතුමියට තිබුණා. ඒ වැඩ කටයුතු දීර්ඝ වශයෙන් කර ගෙන ඇවිල්ලා මේ මැතක දී එතුමිය අභාවප්‍රාප්ත වුණා. එතුමිය අභාවප්‍රාප්ත වීම සමාජයට ඒ ප්‍රදේශයට පාඩුවක්.

ඒ වාගේම එතුමියගේ ජීවිත කාලය තුළ සමාජයට ගන්න හොඳ ආදර්ශ තිබුණා. ඒ ප්‍රදේශයේ ජනතාවට යහපත් තත්ත්වයට පත් වෙන්න හොඳ තත්ත්වයක් කියලා මම දකිනවා. මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ ප්‍රදේශයේ හිටපු හොඳ සමාජ සේවිකාවක් හැටියට, තමන්ගේ ස්වාමි පුරුෂයාට, දරුවන්ට ආදර්ශවත් ලෙස සලකපු උදාර කාන්තාවක් හැටියට ගත කරපු කාලය ගැන අගය කරමින් ඒ පවුලේ සැම දෙනා වෙත මගේ ශෝකය ප්‍රකාශ කරන අතර, එතුමියන්ට මතු භවයේදී නිවන් සුව සාක්ෂාත් කර ගැනීමට වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සිරිමතී මන්ත්‍රීතුමියගේ ශෝක යෝජනා ගෙනාපු මේ අවස්ථාවේ නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ සිටීම සුවිශේෂී වූ කාරණයක් වශයෙන් මම දකිනවා. මොකද, විජේසිරි පවුලත් සමග අපි ගත කළේ කොයි ආකාරයෙන්ද කියන එක පිළිබඳව, ඒ වටපිටාව මොකක්ද කියන එක පිළිබඳව කළුතර දිස්ත්‍රික්කයට කරපු අතිමහත් වූ සේවාව මොකක්ද කියන එක පිළිබඳව කෙසේද කියලා දන්නා යම් කෙනෙක් මන්ත්‍රීවරයෙක්, මන්ත්‍රීතුමියක් මේ සභාවේ ඉන්නවා නම් මම හිතනවා ඒ අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා තමයි කියලා. ඒ නිසා මේ අවස්ථාවේ ශෝක යෝජනාව ගෙනාපු අපේ සභානායකතුමා, ඒ වාගේම අපේ ප්‍රදේශය නියෝජනය කරන පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා මේ මන්ත්‍රී ධුරයත් එක්ක සිරිමා විජේසිරි මැතිනිය ප්‍රදේශයට කරපු සේවාව, පවුලට කරපු යුතුකම් පිළිබඳව ඉතාමත් කෙටියෙන් පැහැදිලි කළා. ඉතින් මම දකින විශේෂත්වය තමයි, එතුමියට තිබුණා ලොකු ආත්ම ශක්තියක්. අපේ පළාතේ දේශපාලන වශයෙන් එක යුගයක නායකත්වය ගත්තේ මේ පවුල. හැමෝම දේශපාලනයෙන් සමු ගෙන අයින් වුණු මොහොතේ විජේසිරි මන්ත්‍රීතුමාත් එක්ක යෝධ ශක්තියක් ලබා දුන්නේ සිරිමා විජේසිරි මැතිනිය. ඒ ශක්තියත් එක්ක තමයි දේශපාලන වශයෙන් මේ පවුල විශාල වශයෙන් ශක්තිමත් වුණේ. ඒ සෙවනේ දේශපාලනය ආරම්භ කරපු පුද්ගලයෙක් වශයෙන් මේ කථා කරන මම, අපි දැකපු විශේෂ ගුණාංග රාශියක් තිබුණා. විජේසිරි මන්ත්‍රීතුමාගෙන් පසුව ඒ පළාතට කරපු සේවාව මෙතුමියට පුළුවන්කමක් තිබුණා ඉදිරියට අරගෙන යන්න. ඒකේ විශේෂත්වය තමයි, අසනීප වුණු ගරු මන්ත්‍රීතුමාගේ සියලු යුතුකම් හරියාකාරව ඉෂ්ට කරමින් තම දියණියන් තුන් දෙනා, බෑණනුවන් තුන්දෙනා එක්ව ඉතාම සමීප පවුලක් වශයෙන් අති දැවැන්ත ලෙස යුතුකම් කරමින් මන්ත්‍රී ධුරයේ කටයුතු කර ගෙන යෑම. ඒවා එකක්වත් මග හැරියේ නැහැ.

ඒ නිසා අපි දකිනවා. එතුමිය මේ සභාව තුළ ආපු කෙටි කාලය වුණාට ඉතාම සුවිශේෂී වූ මෙහෙවරක් කරපු මන්ත්‍රීවරියක් වශයෙන් තමයි අපි දකින්නේ. ඒ නිසා පවුලේ යුතුකම් එක්කම, මේ සමාජ වැඩ සටහන් කරන කොට අපේ ගරු අමාත්‍යතුමන්ලා සියලු දෙනාම ඒවාට උදව් උපකාර කළා. ඒ නිසා අපි දැක්කා. ඒ අමාත්‍යාංශවලින් ඒ උදව් උපකාර ගන්න, ඒ අවශ්‍ය දේවල් ජනතාවට අරගෙන යන්න කොයි ආකාරයෙන්ද කටයුතු කළේ කියන එක පිළිබඳව අපි දැක්කා. ඒ නිසා විජේසිරි මන්ත්‍රීතුමා දිර්ඝ කාලයක් අසනීප වුණාට පසුව ඒ අසනීප තත්ත්වය වෙනුවෙන්ම තමන් පුදුමාකාර කැපවීමක් කළා. ඒ වාගේම දියණියන් තිදෙනා මතක් කරන්න ඕනෑ. බෑණනුවන් තිදෙනා මතක් කරන්න ඕනෑ. ඒ අය තම මවත් එක්ක ඒ කාර්යභාරය පුදුමකාරව කරට අර ගෙන පියෙකුට කරන්න පුළුවන් උපරිම ගෞරවය සමාජය තුළ දකින්න පුළුවන් ආකාරයට ඒ මෙහෙවර කර ගෙන ගියා. විජේසිරි මන්ත්‍රීතුමාගේ වියෝවෙන් පස්සේ ඉතාමත් කෙටි කාලයකදී හදිසියේම එතුමියට අප අතරින් වෙන් වෙන්න සිදු වුණා. කවුරුවත් බලාපොරොත්තු වුණු ආකාරයකට. ඒ නිසා මම මේ සභාවේ සිරිමතී විජේසිරි මැතිනිය බලාපොරොත්තුවන ආකාරයෙන්ම නිවන් සුව අත්වේවා කියා ප්‍රාර්ථනා කරමින් මේ සඳහා ශෝක යෝජනාව පිළිබඳව අදහස් ඉදිරිපත් කළ සියලු දෙනාටත් බොහොමත්ම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

සිරිමතී මන්ත්‍රීතුමියගේ ශෝක යෝජනාව මේ සභාවට ඉදිරිපත් කිරීම පිළිබඳවත් එතුමිය වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳවත් ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. සිරිමතී මන්ත්‍රීතුමිය ගැන කථා කරන්න ඉස්සරවෙලා අපට කථා කරන්න වෙන්නේ, විජේසිරි ගරු මන්ත්‍රීතුමා පිළිබඳව. 1999 මේ පළාත් සභාවට පත් වෙලා ආපු අවස්ථාවේදී ඉතා කාර්යක්ෂමව, ඉතා විනයගරුකව, ක්‍රමාණුකූලව, නිර්මාණශීලීව වැඩ කරන මන්ත්‍රීවරයෙක් හැටියට තමයි අපි විජේසිරි මන්ත්‍රීතුමාව හඳුනා ගත්තේ. විශේෂයෙන් හැමදාම අපි සිහිපත් කරන දෙයක් තමයි විජේසිරි මන්ත්‍රීතුමා, අපේ ගිණුම් කාරක සභාවේ වැඩ බලන සභාපතිවරයා හැටියට කරපු සේවය. එතුමා ඒ පිළිබඳව ප්‍රවීණයෙක් හැටියට අපට නම් කරන්න පුළුවන්. ඔහු විශාල සේවාවක් මේ පළාත් සභාව තුළ කරමින් සිටියදී තමයි හදිසියේ අසනීපවෙලා අංශභාග රෝගයට ගොදුරු වෙලා එක්තැන් වෙන්න සිද්ධ වුණේ. ඇත්තෙන්ම ඒක ඉතාම කනගාටුදායක සිද්ධියක්. පළාත් සභාවට ඔහු ලෙඩ වුණු අවධියේදී ඔහුගේ පාඩුව හොඳින් දැනෙන්න පටන් ගත්තයි කියන එක බොරුවක් නොවෙයි. අපි හැම ගිණුම් කාරක සභා රැස්වීමකදීම ඒ පිළිබඳව සිහිපත් කළා. ඔහු නැති අඩුව අපට දැනුණා.

මේ කාලයේදී තමයි ඔහුගේ ආදරණීය ස්වාමි දියණිය, සිරිමතී මැතිනිය අපත් සමග කිට්ටු වුණේ. පක්ෂය තීන්දු කළා, ඔහු කරපු සේවයට ප්‍රති උපකාරයක් හැටියට ඔහුගේ ආදරණීය භාර්යාව සිරිමතී මැතිනිය පළාත් සභාවට නම් කරලා එවන්න. එතැන ඉඳලා තමන්ගේ ස්වාමි පුරුෂයා අනුව යමින් ඇය විශාල වැඩ කොටසක් පළාත් සභාව තුළ ඉටු කළා. පළාත් සභාව තුළ විතරක් නොවෙයි. තමන්ගේ නිවසේ ඕනෑ කම් සොයා බලමින් තමන්ගේ ස්වාමි පුරුෂයා ආරක්ෂා කර ගනිමින් දියණියන් තිදෙනෙක් වෙනුවෙන් ඇයට විශාල වගකීමක් දරන්න, වැඩ කරන්න එතුමියට සිද්ධ වුණා. ඒ කිසි දෙයකින් ඇය සැලුනේ නැහැ. ඇය අභීතව ඒ ප්‍රශ්නවලට මුහුණ දුන්නා. දියණියන් තිදෙනාට හොඳට උගන්වලා, හොඳ දියණිවරුන් හැටියට විවාහ කර දීලා, ඒ වාගේම ඒ අයගෙන් සමාජයට ගත හැකි උපරිම සේවාව ලබා දෙන්න, ඒ වැඩ කරන ආයතනවල ගුණගරුකව ඒ කටයුතු කරන්න මෙහෙයවන්න එතුමියට පුළුවන් වුණා. ඒ වාගේම එතුමිය පක්ෂයේ ක්‍රියාකාරිනියක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සමස්ත ලංකා කාන්තා සංවිධානයේ නිලධාරිනියක් හැටියට ඇය මට විශාල සහායක් ලබා දුන්නාය කියන එක මම මේ වෙලාවේ කෘතගුණ පූර්වකව මතක් කරන්න ඕනෑ. හොරණ ප්‍රදේශයේ කාන්තාවන් ඒකරාශී කර ගෙන ඒ අයට නායකත්වය දෙමින් ගරු රත්නසිරි වික්‍රමනායක මැතිනිය, කුසුම් වික්‍රමනායක මැතිනිය සමග ඉතාම සහයෝගයෙන් වැඩ කරමින් ඒ ප්‍රදේශයේ කාන්තාවන්ගේ දියුණුව පිළිබඳව සොයා බැලුවා. මැතිනිය සමඟ ඉතාම සහයෝගයෙන් වැඩ කරමින් ඒ ප්‍රදේශයේ කාන්තාවන්ගේ දියුණුව සොයා බැලුවා. ඒ පිළිබඳව ප්‍රසංශා කරන්නට අපට පුළුවන්කම තිබෙනවා. ඒ කාන්තාවන්ගේ ස්වයං රැකියා තත්ත්වය දියුණු කරන්න ඇය ලොකු කැප කිරීමක් කළා. ඒ වාගේම ඇය බෞද්ධ කාන්තාවක් හැටියට ජීවත් වුණා. පන්සල් වෙහෙර විහාරස්ථානවලට එතුමියගේ ශක්ති ප්‍රමාණයෙන් සේවය කරන්න එතුමිය බොහොම සන්තෝෂයෙන් ඉදිරිපත් වුණා.

ඒ වාගේම තමන්ගේ ස්වාමි පුරුෂයාට සලකපු ආකාරය පිළිබඳව අපි හොඳින් දන්නවා. මේ පළාත් සභාව නියෝජනය කරන කාලයේදී ඇය මාත් සමග බොහොම කිට්ටුවෙන් ඇසුරු කළේ. ඒ නිසා ගෙදර පෞද්ගලික තොරතුරු පවා මාත් සමග නිතර කථා කළා. එතුමිය තමන්ගේ ස්වාමි පුරුෂයාට හුඟාක් ආදරය කළා. ගෞරව කළා. ඒ වාගේම එතුමා පත් වී ඇති තත්ත්වය පිළිබඳව කනගාටු වෙනවා වාගේම ඔහුව හොඳින් තියා ගන්න, ඉතා ඉක්මණින් සුවපත් කරන්න භාර්යාවක හැටියට ඇය දරුවනුත් එක්ක එකතු වෙලා ඇයගේ යුතුකම් කොටස කිසිම අඩුවක් නැතිව ඉෂ්ට කළා. මම දන්නවා සමහර වේලාවට අපේ පළාත් සභාවෙන් යන වැඩමුළුවලට, චාරිකාවලට එතුමිය එකතු වුණේ නැහැ. මම ඒ පිළිබඳව කිව්වාම, ටිකක් හිත නිදහස් කරගන්න, ටිකක් අධ්‍යාපනය පැත්තට හිත යොමු කරන්න ඇයි මේකට එන්නේ නැත්තේ කියලා ඇහුවාම, මම ආවොත් මහත්තයාට අවශ්‍ය කටයුතු කරන්න අපහසු වෙනවා. දරුවන්ට විතරක් මේක කරන්න බැහැ. ඔහුට අඩුවක් නොකර ඒ කටයුතු ඉෂ්ට කිරීම මගේ යුතුකමක්. ඒ වාගේම දියණිවරු තිදෙනෙකුගේ බර ඇයගේ ඔළුවේ තිබුණා. මුණුපුරු මිණිපිරියන්ට ඇය හුඟාක් ආදරය කළා. ඒ පිළිබඳව මාත් එක්ක නිතර කථා කළා. ඒ වාගේ ගමන් පවා නොගිහින් ඇය උත්සාහ කළේ, තමන්ගේ යුතුකම්

කොටස ස්වාමි පුරුෂයා වෙනුවෙන් ඉෂ්ට කරන්න. ඔත්පල වෙලා ඉන්න ස්වාමි පුරුෂයා බලා ගන්න. දියණිවරුන්ට හොඳ අම්මා කෙනෙක් වෙන්න. මුණුපුරු මිණිපිරියන්ට හොඳ ආච්චි අම්මා කෙනෙක් වෙන්න. ඒක නිසා මම හිතන්නේ සිරිමතී ගරු මන්ත්‍රීතුමිය තමන්ගේ ජීවිත කාලය තුළ තමන්ගෙන් විය යුතු යුතුකම් තමන්ගේ පවුල වෙනුවෙන්, තමන්ගේ බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඒ වාගේම කාන්තා සංහතිය වෙනුවෙන් ඉෂ්ට කළාය කියලා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනැ. මම දන්නවා, මේ අභාවයෙන් පස්සේ එතුමිය නරක තැනක උපදින්න විධියක් නැහැ. ඒ තරම් අහිසංක, ගුණ ගරුක, යුතුකම් ඉෂ්ට කරන කාන්තාවක් එතුමිය. ඒක නිසා එවන් යෙහෙළියක් අහිමි වීම පිළිබඳව කනගාටු වන අතර ඇයට නිවන් සැප ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප අතරින් වියෝ වූ මේ පළාත් සභාව නියෝජනය කළ ගරු මන්ත්‍රිනි ජී.ඩී. සිරිමතී මැතිනියගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව මේ සභාවේ සාකච්ඡාවට බඳුන් වන මොහොතේ ඒ දයාබර සොහොයුරියට ගෞරවයක් වශයෙන් ඇයගේ ජීවිතය පිළිබඳව, අප සමඟ ඇසුරු කළ කාලපරිච්ඡේදය පිළිබඳව මතකය අවදි කරන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව

[ ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා ]

මා විටක සතුටු වෙනවා. විජේසිරි ගරු මන්ත්‍රීතුමාගේ දේශපාලන ජීවිතය පිළිබඳව අද මේ සභාවේ මේ මොහොතේ මූලාසනය හොබවන ඔබතුමාට මම අලුතින් කිව යුතු කාරණාවක් නොවෙයි. කළුතර දිස්ත්‍රික්කයේ දේශපාලනය කරපු අය හැටියට එතුමාගේ දේශපාලන ජීවිතය පිළිබඳව අපි බොහෝ දේ දන්නවා. මොකද හේතුව 1988 මේ පළාත් සභාවේ ආරම්භයත් සමඟ දහසකුත් බාධක මැද්දේ දේශපාලන ජීවිතය ආරම්භ කරපු කෙනෙක්. මේ දේශපාලන භූමිකාවට එකල ප්‍රවේශ වුණු හැම කෙනෙකුටම තමන්ගේ පවුල්වලටත් මේකේ තිබුණු අනාරක්ෂිත භාවය පිළිබඳ ගැටලුවට මුහුණ දෙන්න තිබුණා. අපි දන්නවා, ඒ පළාත් සභාවේ මන්ත්‍රී ධූර අපේක්ෂකයින් වාගේම මන්ත්‍රී ධූර ලාභීන් කී දෙනෙකුගේ ජීවිත අහිමි වුණාද කියන කාරණාව. ඒ පවුල්වල සාමාජිකයන් මොන තරම් භයෙන් සැකෙන් තමන්ගේ ජීවිතයට තිබෙන තර්ජනය නිසා වේදනාවෙන් ජීවත් වුණාද කියන කාරණාව සමස්ත ශ්‍රී ලංකාව පුරාම ඉන්න, එවකට ජීවත් වුණු හැම කෙනෙක්ම දන්නවා. විජේසිරි මන්ත්‍රීතුමා තමන්ගේ දේශපාලන කටයුත්ත ක්‍රියාත්මක කරද්දී තමන්ගේ ආදරණීය භාර්යාව හැටියට සිරිමතී ගරු මන්ත්‍රීතුමිය ඒ කටයුත්තට උදව් උපකාර කරපු ආකාරය, එතුමා වෘත්තීය වශයෙන් ගණකාධිකාරිවරයෙක් හැටියට කටයුතු කරද්දී එතුමාගේ සේවා කටයුතු වලට කාලවේලාව ප්‍රමාණවත් නොවන හැම මොහොතකදීම තමන්ගේ ආදරණීය ස්වාමි පුරුෂයාට දයාබර මිතුරියක් ලෙසින් ඉඳගෙන ඒ සියලු දේ ක්‍රියාත්මක කරන්න ඇය දැරූ වෙහෙස මහන්සිය පිළිබඳව ඇයත් සමඟ කථා කළ බොහෝ අවස්ථාවලදී ඇගේ මුවින්ම අපි අසා තිබෙනවා. මන්ත්‍රීවරියක් හැටියට මේ සභාවට පත් වෙලා පැමිණි දවසේ ඉඳලා, විජේසිරි ගරු මන්ත්‍රීතුමා අසනීප වුණාට පස්සේ ඒ හැම මොහොතකම අපි මුණ ගැසුණු අවස්ථාවලදී කථා කරනකොට ඇ තුළින් විද්‍යාමාන වුණු විනය ගරුක භාවය, සහෝදරත්වය සහ හිතවත් ලෙංගතුකම සිහිවන හැම මොහොතකදීම හිතට දැනෙන්නේ එක්තරා සියුම් වේදනාවක්. මම එහෙම කිව්වේ අද සමාජයේ බොහෝ දෙනෙකුට අහිමි වෙලා තිබෙන, තමන්ගේ ජ්‍යෙෂ්ඨයාට සැලකිල්ල, තමන්ගේ වටපිටාවේ ඉන්න වැඩිහිටියාට සැලකිල්ල, තමන්ගේ විනය ගරුක භාවය පිළිබඳව තිබෙන සැලකිල්ල ඉතාමත්ම සෝදා පාළුවකට ලක් වෙලා තිබෙන වකවානුවක සිරිමතී විජේසිරි අපේ ගරු මන්ත්‍රීතුමිය ඒ හැමෝටම මහා දැවැන්ත අභියෝගාත්මක චරිතයක් බවට පත් වුණා.

අපේ මේ ශෝක යෝජනාවට අදහස් ප්‍රකාශ කරපු අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා වාගේ ඇය කාන්තාවන් අතරින් සුවිශේෂ වූ කාන්තාවක්. තමන්ගේ ස්වාමි පුරුෂයා රෝගාතුර භාවයට පත් වුණාට පස්සේ ඇය හැසුරුණු ආකාරය ඇය සමහින් ළඟින් ඇසුරු කළ කීපදෙනෙක් හා තමන්ගේ දරුවන් සහ බෑණාවරුන් තමයි පැහැදිලිව දන්නේ. ඇත්තටම ඇය පළාත් සභාව විසින් සංවිධානය කරපු කිසිම චාරිකාවකට සහභාගි වුණේ නැහැ. අන් කිසිම හේතුවක් නිසා නොවෙයි එසේ නොකළේ. තමන්ගේ ස්වාමි පුරුෂයා රැක බලා ගැනීමේ පරම පවිත්‍ර චේතනාව නිසා. ඒ නිසාම ඒ ආදරණීය දියණියන් තිදෙනා තමන්ගේ අම්මාත් එක්ක එකතු වෙලා වසර ගණනාවක් අසනීපයෙන් හිටපු සිය පියාව ඉතාමත්ම කාරුණිකව ගෞරවයෙන් ආරක්ෂා කළා වාගේම ජීවිතය අවසාන භාගය වනතුරු - හුඟාක් වේලාවට සිදුවන දේ තමයි අපි කවුරු හරි කෙනෙක් එක්තැන් වුණොත් මාසයක්, දෙකක්, තුනක් හොඳින් සලකනවා. ඉන් මත්තට ගියාට පස්සේ ටිකක් දවස් යන කොට තිබෙන ඒ සැලකිල්ල ක්‍රමානුකූලව අවම වෙලා යනවා. අඩු වෙලා යනවා. ඊට පස්සේ ජරාවට පත් වෙනවා. එහෙම තමයි හුඟක් තැන්වල වෙන්නේ. නමුත් විජේසිරි ගරු මන්ත්‍රීතුමා ජීවතුන් අතර හිටපු අවසාන දවස දක්වාත් ඔහුට ඉතාමත්ම හොඳින් සලකන්නත්, ඉතාමත්ම පිරිසිදුව තමන්ගේ ජීවිතය ගත කරන්න අවශ්‍ය කරන පරිසරය සකස් කරලා දෙන්නත් අපේ ගරු මන්ත්‍රීතුමිය සහ ඇගේ දරුවන් එකතු වෙලා ඒ කටයුත්ත ඉතාමත් නිවැරැදිව ඉෂ්ට කළා. අන්තිමට දරුවන්ට ඉතිරි වුණේ අම්මා විතරයි. අපි අපේක්ෂා කළේ නැහැ, මොනම හේතුවක් නිසාවත් සිරිමතී විජේසිරි මැතිනිය, අපේ ආදරණීය සොයුරිය මෙපමණ ඉක්මණට ජීවිතයෙන් සමුගනී කියලා. අනපේක්ෂිත මොහොතක ඇයත් ඒ දරුවන්ගෙන් වෙන් වෙලා ගියා. ඒ දරුවෝ ටික මේ ලෝකේ තනි කර දාලා. ඒ නිසා අපට අද මේ හැම දේ පෙනෙන්නේ ජීවිතයේ තිබෙන අනපේක්ෂිත ස්වභාවය. කිසිම අපේක්ෂාවකින් තොරව ජීවිතයේ විජේසිරි ගරු මන්ත්‍රීතුමිය, මහත්මියක් හැටියට අපට කථා කරන්න යමක් ඉතිර කරලා ගියා. ගෞරවනීය අම්මා කෙනෙක් හැටියට. දයාබර ස්වාමි දියණියක් හැටියට. ඉතාමත් ජනතා හිතවාදී ජනතා නියෝජිතවරියක්

හැටියට. මේක තමයි අප සැම සියලුදෙනාටම ජීවිතයේ අවසාන වශයෙන් සිදුවන දේ. ඒ නිසා දයාබර ගරු මන්ත්‍රීතුමිය පිළිබඳව මම තව තවත් පුන පුනා කථා කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් නැහැ. මූලාසනය හොබවන ඔබතුමාත්, මේ සභා ගර්භය තුළ සිටින සියලුම ගරු මන්ත්‍රීවරුනුත් මේ සභා ගර්භය තුළ එදා මෙදාතුර මන්ත්‍රී ධූර දරන අපේ සියලු ගරු මන්ත්‍රීවරුනුත් දන්නවා සිරිමතී විජේසිරි කියන ගරු මන්ත්‍රීතුමියගේ ශ්‍රේෂ්ටත්වය පිළිබඳව. ඒ නිසා දයාබර මන්ත්‍රීතුමිය අප අතරින් වෙන් වෙලා ගියා. අපි බෞද්ධයන් හැටියට බලාපොරොත්තු වෙනවා, පුනර්භවයක් තුළ තවත් ආත්මයක් ලැබෙනවා කියලා. සසර ගමනේ ඔබ වැනි ශ්‍රේෂ්ට මව්වරුන් නැවත නැවතත් මුණ ගැසීමේ අපේක්ෂාවෙන් අප හද තුළ නැගෙන වේදනාව, ශෝකය ඒ දයාබර දියණියන් තිදෙනාටත්, බෑණාවරුන්ටත් පුද කරමින් ගරු මන්ත්‍රීතුමිය සසර ගමන තුළ නැවත මුණගැසෙන්නත්, අවසානයේ උතුම් වූ නිවනින් සැනසීම අත්පත් කර ගැනීමටත් ඇයට හේතු වාසනා වේවා කියලා ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

### ගරු හෙක්ටර් බෙත්මගේ
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රමාද වෙලා හරි සභා ගර්භයට පැමිණිලා මුළු මහත් බස්නාහිර පළාත් සභාවටත්, ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයටත් සුවිශේෂ සේවයක් කරපු හිටපු පළාත් සභා මන්ත්‍රිනී සිරිමතී මැතිනිය පිළිබඳව මේ ශෝක යෝජනා ගෙනෙන අවස්ථාවේදී එතුමිය වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම එතුමියටත්, ඒ වාගේම එතුමියගේ දිවංගත ආදරණීය ස්වාමි පුරුෂයා වන අපේ හිටපු පළාත් සභා මන්ත්‍රී විජේසිරි මැතිතුමාටත් කරන සුවිශේෂ ගෞරවයක් හැටියට සලකලා මම වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට සිරිමතී මැතිනිය පිළිබඳවත්, එතුමියගේ ආදරණීය ස්වාමියා වූ විජේසිරි මැතිතුමාත් කළා වූ මහඟු සේවය පිළිබඳවත් කරුණු කාරණා ප්‍රකාශ කරන්න අවුවා ටීකා, ටිප්පනි අවශ්‍ය නැහැ. එතුමා පිළිබඳව නොවෙයි මේ ශෝක යෝජනාව ගෙනෙන්නේ. නමුත් එතුමියත්, එතුමාත් පවතින අපේ රජය බලයට පත් කරන්න, අපේ දේශපාලන ධර්මය මුළු මහත් රටේම ප්‍රචලිත කරන්න අපට විරුද්ධ ශක්තිමත් ආණ්ඩුවක් තිබෙන කොට ඒ ආණ්ඩුව තුළ උඩුගම් බලා ගමන් කරමින් ඒ සමාජවාදී ගමන ඉදිරියට ගෙන යන්න වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ගැඹුරුම ක්‍රියාවලියක යෙදුණු තැනැත්තියක් හැටියට සිරිමතී මැතිනියත්, ඒ වාගේම එතුමියගේ ආදරණීය ස්වාමියාත් මේ අවස්ථාවේදී මම මතක් කරනවා. මා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ මන්ද, මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කාමරයේ ඉඳගෙන මේ සභා ගර්භයේ කෙරුණු සියලුම ගුණ කථන අහගෙන සිටියේ. ඒ සැම ගුණ කථනයකදීම එතුමියත්, එතුමියගේ ආදරණීය ස්වාමි පුරුෂයාත් පිළිබඳව සියලුමදෙනා කථා කළේ ඉතාමත්ම හැඟීම්බරව. ඒ මන්ද දේශපාලඥයෝ ඕනැ තරම් ඉන්නවා. නමුත් සැබෑ දේශපාලඥයෝ හැටියට ඔවුන් කළා වූ සේවය ඔවුන්ගේ සැම මුවකින්ම මේ සභා ගර්භය තුළ රැව් පිළිරැව් දුන්නා. ඒ නිසා නැවත ඒවා පුන පුනා කථා කිරීමට මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. අවසාන වශයෙන් හොඳ මිතුරියක්, හොඳ දේශපාලඥවරියක්, හොඳ සමාජ සේවිකාවක් අපට නැති වුණයි කියන කාරණාව මේ අවස්ථාවේදී ඒ පවුලේ අයට කරන ගෞරවයක් හැටියට ප්‍රකාශ කරමින්, සිරිමතී මැතිනියට අපි ප්‍රාර්ථනා කරන විධියට ඒ නිර්වාණ සම්පත්තිය ලැබීමට හේතු වාසනා වේවායි කියලා ප්‍රාර්ථනය කරමින්, ඒ වාගේම විජේසිරි මැතිතුමා පිළිබඳව ශෝක යෝජනාව මීට පෙර කරලා හමාර වුණත් නැවතත් එතුමා සිහිපත් කරමින් ඔවුන්ට අපි ප්‍රාර්ථනා කරන, මම මුලින් සඳහන් කළ අපි බෞද්ධයන් විධියට පතන ඒ නිර්වාණ සම්පත්තිය ලැබීමට හේතු වාසනා වේවා කියලා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

### ගරු ඉසුර දේවප්‍රිය
Hon. Isura Devapriya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ පළාත් සභාව නියෝජනය කිරීමට 1999 දී එකතු වුණු විට අපට හමු වුණු ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරුන් අතර ඉතාමත්ම වැදගත් මන්ත්‍රීවරයෙක් හැටියට අපේ දේශපාලන ජීවිතයේ අපේ මතකයේ තිබෙන නාමයක් තමයි කළුතර පරිපාලන දිස්ත්‍රික්කය නියෝජනය කරමින්, විශේෂයෙන්ම හොරණ ආසනයට නායකත්වය දුන්න අපේ විජේසිරි ගරු මන්ත්‍රීතුමා. විශේෂයෙන්ම එතුමා දක්ෂ පළාත් සභා මන්ත්‍රීවරයෙක්. විශේෂයෙන්ම මේ පළාත් සභා ක්‍රමය තුළ ගිණුම් කාරක සභාව තිබෙනවා නම් මම හිතන්නේ, විජේසිරි නාමය ගිණුම් කාරක සභාව තුළ ඒ සම්බන්ධ වුණු සාමාජිකයන්ට, නිලධාරීන්ට කවදාවත් අමතක කරන්න බැරි චරිතයක්. මම හිතන්නේ එවැනි දේශපාලන චරිත අපට දේශපාලඥයන් අතරින් සොයා ගැනීම ඉතාමත්ම අපහසුයි. මොකද, හැමදේම වාණිජකරණය වෙලා තිබෙන ලෝකයක, සැම දෙයක්ම දේශපාලනීකරණය වෙලා තිබෙන රටක මෙවැනි සුවිශේෂ චරිත අපට මහත් වූ ආඩම්බරයක් කියන එක මතක් කරන්නට ඕනැ. එතුමා හදිසියේම රෝගාතුර තත්ත්වයට පත් වුණු නිසා අපට අවස්ථාවක් ලැබුණා, එතුමාගේ ආදරණීය භාර්යාව සමඟ මේ පළාත් සභාවේ කටයුතු කරන්න. විශේෂයෙන්ම කාන්තාවක් හැටියට එතුමිය කාගේත් විශ්වාසය හා ගෞරවය දිනා ගනිමින් විජේසිරි මැතිතුමා ගෙන ආ ගමන් මඟ ඉදිරියට ගෙන ගිය කාන්තාවක් කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනැ. අර අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය කිව්වා සේම එතුමිය මම හිතන්නේ, අපිත් එක්ක ලෙංගතු වුණේ සමහර වේලාවට ඇයගේ දරුවන්ට සාපේක්ෂ වයසක සිටිය නිසාත් වෙන්නට ඇති. මම හිතන්නේ විවිධ අවස්ථාවලදී එතුමිය අපත් සමඟ ඉතාමත්ම ළඟින්ම ආශ්‍රය කළා. විජේසිරි ප්‍රතිපත්ති ඉදිරියට ගෙනියන්නට එතුමිය කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. ස්වාමි දියණියක් හැටියට, පළාත් සභා මන්ත්‍රීනියක්

හැටියට එතුමිය කොයිතරම් කාර්ය බහුල වුණත් තමන්ගේ ස්වාමියා වෙනුවෙන් ඒ කරන්න කැප වුණු යුතුකම් කොටස අවංකවම ඉෂ්ට කළා.

ඒ වාගේම මම හිතන්නේ විජේසිරි මැතිතුමා බැහැ දකින්නට අවස්ථා දෙක තුනකදීම අපි ඒ නිවසට ගිය වේලාවේදී ඒ සිරිමතී මහත්මිය වාගේම ඇගේ දියණියන් තිදෙනාත් මම හිතන්නේ තමන්ගේ පියා යථා තත්ත්වයට පත් කරන්නට, නැවත පළාත් සභාවට එවන්නට පුළුවන් නම් මම හිතන්නේ, ඕනෑම කැපවීමක් කරන්න පුළුවන් මට්ටමට ඒ අය සැදී පැහැදී සිටියා. නමුත් දෛවය. අපි ගෙනා ආයුෂ. අපි ලබාපු ජීවිතය. යම් කොටස් අපට අභිබවා යන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ රෝග තත්ත්වයෙන් එතුමාට දරුවන්ගේ සෙනෙහස, ආදරය කරුණාව සහ ඒ රෝගයට අවශ්‍ය ප්‍රතිකාර ලැබුණත් ඔහුට යථා තත්ත්වයට පත් වෙන්න ලැබුණේ නැහැ. නමුත් අපි හිතුවේ නැහැ, රෝගී තත්ත්වයට පත් වුණු විජේසිරි සහෝදරයා අපෙන් සමුගත්තත් සිරිමතී සහෝදරිය මේ තරම් ඉක්මණින් අප අතරින් වියෝ වී යයි කියලා. අපි එහෙම විශ්වාස කළේ නැහැ. ජීවිතයේ යථාර්ථය එයයි. මම හිතන්නේ අපි බලාපොරොත්තු වන ආයුෂ අපට නියමිත ආකාරයෙන් වින්දනය කිරීමේ භාග්‍ය හැමෝටම ලැබෙන්නේ නැහැ. ඒ නිසා වෙන්න ඇති එතුමිය අපෙන් සදා සමුගත්තේ. ඒ නිසා මේ පළාත් සභාව තුළ විජේසිරි ගරු මන්ත්‍රීතුමාත්, සිරිමතී මැතිනියත් කරන්නට යෙදුණා වූ සේවාව සදා අපේ මතකයේ රැඳේවි. ඒ සිහිවටන අප තුළ තිබේවි.

[ ගරු ඉසුර දේවප්‍රිය ]

ඒ දෙදෙනාටම අපි නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, බස්නාහිර පළාත් සභාවේ සාතිශය සංවේගය එකතු කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විශේෂයෙන් හිටපු පළාත් සභා මන්ත්‍රීතුමෙකු සහ මන්ත්‍රීතුමියක් වන අපේ සුජිත් කුරේ මැතිතුමා පිළිබඳවත්, ඒ වාගේම මේ මොහොතේදී ගරු මන්ත්‍රීතුමන්ලා රැසක් අදහස් ප්‍රකාශ කළ සිරිමතී විජේසිරි මැතිනිය වෙනුවෙනුත් ශෝක යෝජනා දෙකක් අද සභාවට ඉදිරිපත් වුණා. මගේ යුතුකමක් වෙනවා. ඒ වාගේම මගේ වගකීමකුත් වෙනවා, සිරිමතී විජේසිරි මැතිනිය පිළිබඳව යමක් ප්‍රකාශ කිරීම. ඉතාම කලාතුරකින් හමුවන, ආශ්‍රය නිශ්‍රය කරන්නට ලැබෙන උසස් ගුණාංග රැසකින් පරිපූර්ණ යහපත් කාන්තාවක්. ඒ වාගේම හොඳ සමාජ සේවිකාවක් හැටියටයි සිරිමතී විජේසිරි මැතිනිය මට හඳුන්වන්න පුළුවන් වෙන්නේ.

අපේ ජගත් අංගගේ ගරු අමාත්‍යතුමා ප්‍රකාශ කළා වාගේ මේ රටේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරලීම සඳහා ඒ ආරම්භක පළාත් සභාවට කළුතර දිස්ත්‍රික්කයෙන් පත් වුණු ශ්‍රී ලංකා මහජන පක්ෂය නියෝජනය කරමින් අපේ ගරු ඩබ්ලිව්. කේ. විජේසිරි මැතිතුමා අපි කාගේත් ප්‍රසාදය, හිතවත්කම, ලෙංගතුකම බොහොම සමීපව එකතු කරගන්නට පුළුවන් වුණු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. පළාත් සභා ක්‍රමයට එරෙහි වෙලා, මේ පළාත් සභාව ආරම්භක අවස්ථාවේ අද පළාත් සභාව රැස් වන කොට ඊළඟ දෙසතියක ඇවෑමෙන් රැස්වන පළාත් සභාවේදී මුල් පළාත් සභාවේදී දකින්නට තිබුණු මුහුණු දෙකක්, තුනක් ඊළඟ දෙසතියකින් රැස්වන පළාත් සභාවේදී දකින්නට නොලැබුණු අවස්ථාවල්, සාමාන්‍ය දෙයක් හැටියටයි අත් විඳලා තිබෙන්නේ. ඩබ්ලිව්. කේ. විජේසිරි මැතිතුමා පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරන ඒ යෝජනාව ආවාම, මේ මැතිවරණ ක්‍රමය ජනතාව අතරට ගෙන යන වේලාවේ දිවංගත විජය කුමාරතුංග මැතිතුමාගේ ආරාධනය පරිදි ඔසී අබේගුණසේකර මැතිතුමාගේ ආරාධනාව පරිදි මේ පළාත් සභා ක්ෂේත්‍රයට මන්ත්‍රීවරයෙක් හැටියට පත් වුණු කෙනෙක්. එතුමා ඊට පෙරාතුව හොරණ ප්‍රදේශයේ ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක්. ආදායම් බදු උපදේශකවරයෙක් හැටියට කටයුතු කළා. ඒ කාලයේ තමයි මේ සිරිමතී විජේසිරි මැතිනියගේ හා ඩබ්ලිව්.කේ. විජේසිරි මැතිතුමාගේ මේ ආදායම් බදු උපදේශක සේවාව පැවතුණේ. උප්පත්තියෙන්ම ප්‍රගතිශීලී දේශපාලන අදහස්වලින් පෝෂණය වුණු පවුලක් හැටියට හොරණ ප්‍රදේශයේ විශාල ගෞරවයක්, විශාල හිතවත්කමක්, ලෙංගතුකමක්, බැඳියාවක් විජේසිරි පවුලට තිබුණා. එවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මේ පළාත් සභා ක්‍රමය ප්‍රතික්ෂේප කළ වකවානුවක තමයි ඩබ්ලිව්.කේ. විජේසිරි මන්ත්‍රීතුමා හොරණ ආදරණීය ජනතාව වෙනුවෙන් මේ පළාත් සභාව නියෝජනය කළේ. ඉන් පසුව ඇවෑමෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, නැත්නම් පොදුජන එක්සත් පෙරමුණ හරහා ඩබ්ලිව්.කේ. විජේසිරි මන්ත්‍රීතුමා පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨයෙක් හැටියට පළාත් සභා තුනක ඉතාම නොමඳ වූ ඉතාම ඉහළ වූ උසස් සේවාවක් ඉෂ්ට සිද්ධ කරපු යහපත් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට මතක් කරන්න ඕනෑ.

අපේ ගරු අමාත්‍යතුමාත්, ඒ වාගේම ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය සඳහන් කළ පරිදි ගිණුම් කාරක සභාවේ සභාපති ධුරය ඉතාම හොඳින් බොහොම කෘතහස්ත විධියට හොබවපු කෙනෙක් හැටියටයි විජේසිරි ගරු මන්ත්‍රීතුමාව මේ සභාවේ සලකන්නේ. යම්කිසි කටයුත්තක්, කාරණාවක් පළාත් සභාවෙන් එතුමාට පැවරුණේ නම් ඒ සියලු කටයුතු ඉතාම නිවැරැදිව, පිළිවෙළකට, බොහොම ප්‍රසාදාත්මක විධියට ඉෂ්ට සිද්ධ කරන්නට විජේසිරි ගරු මන්ත්‍රීතුමා සමත් වුණා. ඔහු දක්ෂ ගණිතඥයෙක් වෙලා සිටියා. ඒ පළාතේ ලොකු පිළිගැනීමක් තිබුණා. මම අහලා තිබෙනවා. සෑම සාර්ථක ස්වාමියෙකු පිටුපස යහපත් බිරිඳක් සිටිනවා කියලා. මේ විජේසිරි මැතිනිය එවැන්නියක් බව ඉතාම නිහතමානීව කියන්න ඕනෑ. මම මේ පවුල හා සමීපව ඇසුරු කළ කෙනෙක් හැටියට එවකට මේ පළාත් සභාවට ලබා දීලා තිබුණු පළමුවැනි පැජරෝ නිල රථ - ගරු මන්ත්‍රීතුමනි, මේක කියන්න ඕනෑ. ඒ නිල රථවලින් අවසාන වශයෙන් නිල රථ දෙකක් විතරක් තමයි

පළාත් සභා මන්ත්‍රීතුමන්ලා ළඟ ඉතිරිව තිබුණේ. විජේසිරි ගරු මන්ත්‍රීතුමාගේ නිල රථය පවා අවසන් මොහොත දක්වා ඉතාම ලස්සනට, පිළිවෙළට, සුරක්ෂිතව අරපරිස්සමෙන් ආරක්ෂා කරගෙන සිටියා. එතුමාගේ පුද්ගලික ජීවිතයත් එසේමයි. එතුමාගේ ආදායම් බදු උපදේශක සේවාවත් එසේමයි. එතුමාගේ මහජන සේවාවත් එසේමයි. එතුමා ජනතාවත් එක්ක ගනුදෙනු කළේ, කටයුතු කළේ පළාත් සභාවේ වගකීම් ඉෂ්ට කළේත් එසේමයි කියන එක බොහොම කාරුණිකව මතක් කරනවා. මේ සියලු කටයුතු පිටුපස සිරිමතී විජේසිරි මැතිනිය ආදරණීය බිරිඳක් හැටියට ඉතාම ළඟින් මේ සියලු දුක්ක දෝමනස්සයන් උසුලගෙන බොහොම ලෙංගතු බිරිඳක්, සොහොයුරියක් හැටියට සිටියයි කියන කාරණාව මේ පවුල හා බැඳුණු මා මතක් කළ යුතු දෙයක්. වරෙක විජේසිරි ගරු මන්ත්‍රීතුමා දැඩි අදහස් දරන කෙනෙක්. තමන්ගේ ඡන්ද දායකයෙකුට වුවත් තමන්ගේ කාර්යාලයට පැමිණි විට සමහර වේලාවට සෘජු ලෙස අදහස් ප්‍රකාශ කරපු අවස්ථාවල් නැතිවා නොවෙයි. වංචාව, දූෂණය, බොරුව, අසත්‍ය එතුමා දැඩි ලෙස ප්‍රතික්ෂේප කරපු කෙනෙක්. එවැනි තැනකදී කිසියම් සේවාවකට පැමිණි කෙනෙක් නිවසින් බැහැර වෙන කොට යළි ඔහු අමතා ඔහුව සොයා ගොස් ආපසු නිවසට කැඳවාගෙන චිත් යහගුණයෙන් යුක්තව ආශ්‍රය නිශ්‍රය කරලා තේ පැන් සංග්‍රහයකින් සංග්‍රහ කරන්නට තරම් විජේසිරි මැතිනිය දයාබර මවක්, බිරිඳක්, ඒ පළාතේ පිළිගත්ත හොඳ සොහොයුරියක් හැටියට කටයුතු කරමින් සිටියා. ඒ නිසා තමයි ගරු මන්ත්‍රීතුමිය විජේසිරි මැතිතුමා අසනීප වූ මොහොතේදී එතුමියට තිබුණු හිතෛෂී භාවය ඒ පළාතේ ජනතාව දැඩි ලෙස ඉල්ලා සිටියා, මේ වගකීම දිගටම ජනතාව අතරට ගෙන යන්නට විජේසිරි මැතිනියට මේ මන්ත්‍රී ධූරය ලබා දෙන්න කියලා. ඒ අනුව විජේසිරි මැතිනිය මන්ත්‍රීවරියක් ලෙස පත් වුණා. ඇයද විජේසිරි මැතිතුමාගේ සේවාව ඉතාම හොඳින්, බොහොම කැපවීමෙන්, බොහොම උසස් ලෙස, ජනතාවට බොහොම සමීප කෙනෙක් හැටියට ඉෂ්ට සිද්ධ කළයි කියන කාරණාව මේ වේලාවේදී කෘතවේදීව මතක් කරන්නට ඕනෑ. ඒ වාගේම මේ පවුලේ අද අපි බොහොම කනගාටුවෙන් මතක් කරනවා. විජේසිරි මැතිතුමා අසනීප වුණු මොහොතේ ඉඳලාම ඉතාම දැඩි කැපවීමකින් ආදරණීය බිරිඳ හැටියට විජේසිරි අපේ ගරු මන්ත්‍රීතුමිය, ඒ වාගේම අපේ දියණියන් තුන්පළම, බෑණනුවන් විශාල කැපවීමක් කළා. ඒ කැපවීම තුළ ඒ වෙහෙස මහන්සියම මම හිතන්නේ ඇයගේ අසනීප තත්ත්වයටත් බලපාන්න ඇති කියලා මට වේලාවකට කල්පනා වෙනවා. ඒ නිසාවෙන් අද විශේෂයෙන් විජේසිරි මැතිනිය වෙනුවෙන් මේ අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කළා වූ අපේ ගරු සභානායකතුමා, ඒ වාගේම ගරු අමාත්‍යතුමා ඇතුළු අපේ පළාත් සභාවේ පක්ෂ විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මූලාසනයේ කෘතවේදීත්වය, ස්තුතිය පිරිනමනවා.

ඒ වාගේම මතක් කරන්නට ඕනෑ. අද දවසේ ශෝක යෝජනා දෙකක්ම ඉදිරිපත් වුණා. අපේ හිටපු පළාත් සභා මන්ත්‍රී සුජිත් දේශප්‍රිය කුරේ මැතිතුමා තරුණ අවධියේදීම හදිසියේ අභාවප්‍රාප්ත වන්නට යෙදුණේ. ඒ සඳහා අදහස් ප්‍රකාශ කළා වූ සියලුම පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලාට මූලාසනයේ ප්‍රණාමය, කෘතවේදීත්වය හිමි වෙනවා. ඒ වාගේම ඩබ්ලිව්.කේ. විජේසිරි මැතිතුමාත්, විජේසිරි මැතිනියත්. මම හිතන්නේ බොහොම විරලයි. අපේ පළාත් සභාවල ස්වාමි බිරින්දෑවරු දෙපළම පළාත් සභා නියෝජනය කරන අවස්ථාවල්. එවැනි දුර්ලභ අවස්ථාවකුත් විජේසිරි පවුලට ලැබුණා. ඒ නිසාවෙන් සිරිමතී විජේසිරි මැතිනිය වෙනුවෙන් අදහස් ප්‍රකාශ කළා වූ, ශෝකය පළ කළා වූ පක්ෂ විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත් යළිත් මූලාසනයේ

ස්තුතිය, ගෞරවය පිරිනමමින් මම විශේෂයෙන්ම විජේසිරි පවුලේ ආදරණීය දියණිවරුන් සහ බෑණනුවන් අද දවසේ අප හා නොමඳව බැඳී සිටිනවා. ඔවුන් තමන්ගේ දෙමව්පියන්ගේ ඒ මහජන බැඳියාව, හිතෛෂීභාවය, ඒ සේවාව තවදුරටත් හොරණ ප්‍රදේශයේ ඉතාම හොඳින් ලෙංගතුව ඉෂ්ට සිද්ධ කරගෙන යන බව මා හොඳින් දන්නා කරුණක්. ඒ නිසා මේ ශෝක යෝජනාවට ඉදිරිපත් වූ අදහස් මේ වාර්තාව අපේ සුජිත් කුරේ ගරු මන්ත්‍රීතුමාගේ සිය පවුල වෙතත්, ඒ වාගේම සිරිමතී විජේසිරි මැතිනියගේ සිය පවුලේ දූ දරුවන් වෙතත් දැනුවත් කර ඔවුන් වෙත යැවීමට කටයුතු කරන ලෙස මම ලේකම්තුමාට කාරුණිකව දන්වා සිටිනවා.

ඒ නිසාවෙන් අද දවසේ සභාවේ වැඩ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබෙනවා. සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන ලෙස මම ගරු සභානායකතුමාට ආරාධනා කර සිටිනවා.

## කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි*" මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.17 ට, 2013 ජූනි මස 18 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.17 p.m till 9.30 a.m. on 18.06.2013.*